ISSN 1391 - 1031
2012 ජූලි
18 වෙළුම 04 කලාපය

ආධාරය රු 30/=

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

"අප දැන් ජීවත් වන්නේ, අපට වඩා බොහෝ බලවත් ලෝක ධනපති පංතියට විරුද්ධව කරනු ලබන අරගලයක් පවතින ඓතිහාසික අවදියකය. අරගලයේ මෙම අවදියේදී විප්ලවයේ සංවර්ධනය ආරක්‍ෂා කිරීම අපෙන් ඉටුවිය යුතුය. එමෙන්ම ධනපති පංතියට විරුද්ධව යුද්ධමය අර්ථයෙන් සටන් කිරීම හා ඊටත් වඩා අධ්‍යාපනය මගින් දෘශ්ටිමය වශයෙන් සටන් කිරීමද අප කළ යුතුය."

**ලෙනින්**
**තෝ. කෘ. 11 වෙළුම**



අමතක නොවන මතකය

**1943 ජූලි 14**
ඒ ශ්‍රේෂ්ඨ මිනිසා උපත ලද දිනයයි.
මේ වන විට එයින් වසර 69ක් ඉක්ම ගොස් තිබේ.
ඔහු අප අතර නැත.
ඔහු දිවිය අපෙන් පැහැරගෙනය.
එහෙත් පැහැර ගත නොහිණු ඔහු දැක්ම සදාකල්හිම අප අතරය.

## 3 මායාවක් හා වංචාවක්



ලංකාවේ පාලක පංතිය ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය පවා අහෝසි කරමින් සිටියි...

## 8 කලාවේ යථාර්ථවාදය



යථාර්ථවාදී කලා සම්ප්‍රදාය බිහි කළ අය අතර රුසියානු සාහිත්‍යකරුවන්ට විශේෂ තැනක් හිමිවේ...

## 9 මහ බැංකුව බොරු කියයි



ගෙවිය යුතු ණය බර රුපියල් කෝටි 553,000 ක් වන අතර එය පසුගිය මාස 5 ක කාලය තුළ 56%කින් ණය වැඩි වීමේ ප්‍රතිඵලයකි.

දේශපාලන..............03
තරුණ....................04
මතවාද..................07
දැනුම.................... 10
කාලීන.....................11
කාන්තා....................12
ජාත්‍යන්තර.............13
විශේෂාංග..............14



ආණ්ඩුවේ මැරයන්ට කුක්කන් බවට හැරෙන්නට සිදුවූයේ කටුවන සිද්ධියෙන් පසුවය. දේශපාලන රැකවරණය මත පළාතක් හොල්ලාගෙන සිටි අමරේ වසර 09කට පෙර නිකුත් වූ වරෙන්තුවකට කීකරු වෙමින් ස්වකැමැත්තෙන් සිරගත විය. ඒ මෙවර ඔහුගේ උණ්ඩය තුවාල කළේ ජනතා හෘදසාක්ෂිය නිසාවෙනි. කුළු ගැන්වුණු ජනතා විරෝධය සාටකයේ රැකවරණයට වඩා බලවත් බව මැරයාද දැනසිටියේය. නැගෙන ජන බලය හමුවේ හෙට දවසේ මැරයන්ගේ රැකවලුන්ටද දැනෙනු ඇත්තේ ඊට වෙනස් හැඟීමක් නොවේ.
ඡායාරූපයේ දැක්වෙන්නේ කටුවන ඝාතනයට විරෝධය පා පසුගිය 19 වනදාකොටුව දුම්රියපොළ ඉදිරිපිට පැවැති උද්ඝෝෂණය අවසානයේ දර්ශනයකි.

# පළාත් සභා ඡන්දය පාරාවළල්ලක් කරමු!

**ජනතා මුදල් නාස්ති කර තම පෞද්ගලික සුබ විහරණය වෙනුවෙන් කටයුතු කරමින් සිටින මහින්ද රාජපක්ෂ ආණ්ඩුව තම බලය තව තවත් තහවුරු කරගැනීමේ අරමුණින් හදිසි මැතිවරණ කැඳවා ඇති බව ප්‍රකාශ කරන ජනතා විමුක්ති පෙරමුණ එය ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍රවිරෝධී ගමනට විරෝධය පළ කිරීමේ අවස්ථාවක් බවට පත් කර ගත යුතු බව අවධාරණය කරයි.**

මේ වන විට ආණ්ඩුව නැගෙනහිර, උතුරුමැද හා සබරගමුව යන පළාත් සභා විසුරුවා හැර මැතිවරණ කැඳවා තිබේ. නැගෙනහිර පළාත් සභාව 2013 මැයි මාසය දක්වාද උතුරුමැද හා සබරගමුව 2013 අගෝස්තු මාසය දක්වාද නිල කාලය පැවති අතර වසරක පමණ කාලයක් ඉතිරිව පැවතියෙදී ආණ්ඩුව හදිසි මැතිවරණ පැවැත්වීමට තීරණය කළේය.

මෙම අවස්ථාවේ පළාත් සභා විසුරුවා හැරීම එම ප්‍රදේශවල ජනතාවගේ අපේක්ෂාව නොවූ අතර අවම වශයෙන් ඒ සඳහා ආණ්ඩුවේ නියෝජිතයින්ගේ පවා එකඟතාවක් නොවූ බවට වාර්තා පළ වී තිබිණි. උතුරු මැද පළාතේ ගොවි ජනතාව තම වගා බිම් වියළී යාම නිසා දැඩි පීඩාවකට ලක්ව සිටින අතර පොදු ජනතාව ජීවන වියදම ඉහළයාම, අපරාධ සොරකම් දූෂණ ඉහළයාම, ප්‍රජාතන්ත්‍රවාදය අහිමි වීම, සමාජ සුභසාධන බිඳවැටීම ආදී පොදු සමාජ ආර්ථික කඩාවැටීම් හේතුවෙන් පීඩා විඳිමින් සිටී.

එහෙත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව හිතුවක්කාරී ලෙස බල ව්‍යාපෘතියට අනුකූල න්‍යාය පත්‍රයක් ඉදිරියට ගනිමින් පළාත් සභා විසුරුවා හැර තිබේ.

ආණ්ඩුව මීට පෙර අවස්ථාවලදීද මෙබඳු ආකාරයේ උපක්‍රම භාවිත කරන ලද අතර ආණ්ඩුව සතු ජනාධිපති ධූරයේ, පාර්ලිමේන්තුවේ, පළාත් පාලන ආයතනවල හා පොලීසිය ඇතුළු රාජ්‍ය යන්ත්‍රණයේ බලය පළාත් සභා මැතිවරණවලදී උපරිම ලෙස පාවිච්චි කරන ලදී.

මෙම තත්වය හමුවේ හදිසි මැතිවරණ කැඳවීම පිළිබඳව නියමුවා වෙත අදහස් දැක්වූ ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා ආණ්ඩුවේ හිතුවක්කාරී හා ජනතාද්‍රෝහී ක්‍රියාකලාපයට තමන් තුළ පවතින සැබෑ විරෝධය පෙන්වීම සඳහා ජනතාවට මෙම මැතිවරණ යොදාගත හැකි බව පෙන්වා දුන්නේය. "ආණ්ඩුව පෙර අවස්ථාවේදී ඉතා පිළිකුල් සහගත ලෙස යුද්ධයේ විවිධ අවස්ථා මැතිවරණ ව්‍යාපාරයට යොදා ගත්තා. ආණ්ඩු විරෝධය බොරු දේශප්‍රේමයෙන් යටපත් කළා. එත් ඒ බොරුව, අධිරාජ්‍යවාදයට දණ ගහන ගමන් දේශප්‍රේමී සටන් පාඨ කියන එක, දැන් ජනතාවට තේරුම් ගන්න පුළුවන්. මේ මැතිවරණ කැඳවීම රාජපක්ෂ ආණ්ඩුවට පාරාවළල්ලක් කිරීම සඳහා ජනතාවට විවෘත ආරාධනයක් කරනවා." ඔහු වැඩිදුරටත් පැවසීය.



# වැඩ බිම

## රට රැවටූ අධ්‍යාපන ඇමතිවරු වහා ඉල්ලා අස්වෙනු!

**ලංකා ගුරු සේවා සංගමය**




2011 අ.පො.ස. උ/පෙළ ප්‍රතිඵල බරපතළ දෝෂ සහිත වීම නිසා එම දෝෂ නිවැරදි කිරීම සමබන්ධව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදුන් තීන්දුව හමුවේ වහාම තම වගකීම් දරන අධ්‍යාපන අමාත්‍ය ධුරවලින් ඉල්ලා අස්වන ලෙස ලංකා ගුරුසේවා සංගමය දැඩිව බල කර සිටී.

රටත්, ජනතාවත් රවටමින් වගකීම් විරහිතව කටයුතු කළ මෙරට අධ්‍යාපන ඇමති වන බන්දුල ගුණවර්ධන හා උසස් අධ්‍යාපන ඇමති එස්.බී. දිසානායක යන ඇමතිවරු ඉල්ලා අස්විය යුතු බව එම සංගමය පවසා සිටී. එම සංගමය මගින් ජූනි 26 දින නිකුත් කරන ලද නිවේදනයක් මගින් මේ බව පවසා සිටින අතර එහි වැඩිදුරටත් මෙසේ සඳහන්ය.

අ.පො.ස උ/පෙළ ප්‍රතිඵල සම්බන්ධව මෙරට ගුරුවරුන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, සිසුන්, දෙමව්පියන්, වෘත්තීය සමිති, මාධ්‍ය ඇතුළු බොහෝ පාර්ශව විසින් දෝෂ සහිත කරුණු ගෙන හැර දක්වමින් පැවසූයේ මෙම ප්‍රතිඵල කිසිසේත් පිළිගත නොහැකි බවයි. නමුත් රටතුළ පැන නැගි අර්බුදකාරී තත්වය හමුවේ ප්‍රශ්නය යට ගසා ඉන් පලා යාමට ජනාධිපතිවරයා මැදිහත්ව මහාචාර්ය ධාරා විජයතිලක මහත්මියගේ සභාපතිත්වයෙන් යුත් විද්වත් කමිටුවක් පත්කළ අතර ඔවුන් සැලකිය යුතු කාලයක් ගතකර ඉදිරිපත් කළ නිර්දේශ 'යන්නෙ කොහෙද මල්ලෙ පොල්' වැනි විය. ආණ්ඩුවේ මෙම ප්‍රෝඩාකාරී විද්වත් කමිටු ජවනිකාවෙන් අනතුරුව මේ කිසිදු පාර්ශවයකින් තමන්ට සාධාරණය ඉටු නොවනු ඇති බව දැන එම සිසුන්, ගුරුවරුන් හා වෘත්තීය සමිති එක්ව මීට එරෙහිව නීතියේ පිහිට පතමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පැවරීමට කටයුතු කෙරිණි. එහි ප්‍රතිඵලයක් ලෙස ආණ්ඩුව දිගින් දිගටම යට ගැසීමට උත්සාහගත් ගැටලුව සම්බන්ධව ඉදිරිපත්වූ කරුණු හමුවේ බරපතළ බව වටහා ගනිමින් නැවත නව සහ පැරණි නිර්දේශවලට පෙනී සිටි සිසුන්ට මෙම ප්‍රතිඵල නිවැරදි කර නිකුත් කිරීමටත් ඒ අනුව යමින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ගණනය කරනු ලබන ඉසෙඩ් අගය ඇතුළු ක්‍රමවේදය නිවැරදි කිරීමටත් ශ්‍රේෂ්ඨාධිකරණය දෙනු ලැබූ තීන්දුව මෙරට අධ්‍යාපනය තුළ වටිනාකම් රැකදුන් ඓතිහාසික තීන්දුවක් බව අවිවාදිතය.

ආණ්ඩුව, මෙම ඇමතිවරුන් දෙපල එක්ව මෙම තීන්දුව ලබාදීම වැළැක්වීමට අවසන් මොහොතේද කුමන්ත්‍රණ කරමින් සිටි අතර ඒ අනුව තවත් විද්වත් කමිටුවක් පත්කිරීමට ගෙන ආ යෝජනාව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තරයේ ප්‍රතික්ෂේප කිරීමද මෙහි සුවිශේෂී කරුණකි.

## වෘත්තීය සමිති නායකයින්ට එල්ලවන ආණ්ඩුවේ මර්දනය වහා නවතනු!

**ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය**

විශ්වවිද්‍යාල ආචාර්යයරුන්ගේ වෘත්තීය අරගල මැඩලීම සඳහා එහි නායකත්වයට එල්ලවන මරණීය තර්ජන හෙළා දකිමින් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති කේ.ඩී. ලාල්කාන්ත සහෝදරයා නිවේදනයක් නිකුත් කළේය. එහි මෙසේද සඳහන් වේ.

විශ්වවිද්‍යාල ආචාර්ය සමිති සම්මේලනයේ සභාපති ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි මහතාගේ වෘත්තීය සමිති ක්‍රියාකාරීත්වය අඩපන කිරීමේ අරමුණින් රජයට සම්බන්ධ කණ්ඩායම් යොදා ගනිමින් කරන බියවැද්දීම් තර්ජනය කිරීම් හා මර්දනය කිරීම සඳහා ගනු ලබන උත්සාහය වහාම නතර කරන ලෙස ආණ්ඩුවට බල කර සිටිමු. ආණ්ඩුව, ආණ්ඩුවට එරෙහිව මතුවන සමාජ මතයන්, ක්‍රියාකාරීත්වයන් සුදු වෑන් යොදා ගනිමින් කරනු ලබන පැහැර ගැනීම් මගිනුත් එහි අවසානය රාජ්‍ය නිල ත්‍රස්තවාදය යොදා ගනිමින් සිදු කරන පුද්ගල ඝාතනයන් මගිනුත් සිදුකරමින් පවතින ප්‍රජාතන්ත්‍රවිරෝධී වියරු හැසිරීම හෙළා දකින අතර රජයේ ආරක්ෂක අංශ මගින් හෝ රජයේ වෙනත් කණ්ඩායම් මගින් හෝ ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි මහතාටත්, පවුලේ සාමාජිකයින් වෙතත් එල්ල වෙමින් පවතින මර්දනීය ක්‍රියාමාර්ග දැඩි පිළිකුලෙන් යුතුව හෙළා දකිමු.

මේ රටේ වැඩ කරන ජනතාවට තමන්ගේ කප්පාදු කරන අයිතිවාසිකම් යළි දිනා ගැනීමට හෝ හිමිවිය යුතු අයිතිවාසිකම් අලුතින් දිනා ගැනීමට හෝ පවතින මූලික අයිතිය ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුවට මර්දනයෙන් නතර කළ නොහැකිය. ඔවුන්ගේ ප්‍රශ්න, ගැටලු විසඳා ගැනීම වෙනුවෙන් සාකච්ඡා මගින් වසර ගණන් කල් මැරීම හා ආණ්ඩුව ජනතාවගේ ප්‍රශ්න යටපත් කිරීමේ ක්‍රියාවලියේ අවසන් ඵලය ලෙස වැඩ කරන ජනතාව සටන් කිරීමට අරගල කිරීමට ඉදිරිපත් වීම සාධාරණය. එය ඔවුන්ගේ අයිතියකි. එම අයිතිය දැනට පවතින රටේ මූලික නීතිය තුළත් වෘත්තීය සමිති ආඥා පනත් මගිනුත් තහවුරු කර ඇත. වැඩ කරන ජනතාවට තමන්ගේ සේවාවේ හෝ ශ්‍රේණියේ වෘත්තීය ගැටලු වෙනුවෙන් අරගල කිරීම මිනිස් ජන සමාජය තුළ මූලික අයිතිවාසිකමක් යටතට සැලකෙන කටයුත්තකි. එමෙන්ම එය ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකමකි. එම නිසා කිසිදු හේතුවකින් වෘත්තීය ගැටලු වෙනුවෙන් වෘත්තීය ක්‍රියාමාර්ග සඳහා අවතීර්ණ වීම නීතිවිරෝධී හෝ ප්‍රජාතන්ත්‍රවිරෝධී ක්‍රියාවක් නොවන බව අපි ආණ්ඩුවට අවධාරණය කර සිටිමු.

එය කිසිසේත් නිර්මාල් රංජිත් දේවසිරි මහතාට පෞද්ගලිකව දියත් වන මර්දනයක් සේ සැලකීමට සූදානම් නැත. ඔහු විශ්ව විද්‍යාල ආචාර්යවරයකු මෙන්ම මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් වූ සමාජ කතිකාව නියෝජනය කරන සිවිල් පුරවැසියෙකි. ඔහුට එල්ල වෙන මේ මර්ධනය සමස්ත රටේ ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහිව එල්ල වන ප්‍රහාරයක් සේ සැලකිය යුතුය. එම නිසා මර්ධනයට එරෙහිවත් රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගැනීම සඳහාත් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය අගයන සියළුම වැඩ කරන ජනතාවත් සමස්ත රටේ ජනතාවත් පෙළ ගැසෙන ලෙස අවධාරණය කර සිටිමු. එමෙන්ම දැනට විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ අරගලය මේ රටේ නිදහස් අධ්‍යාපන අයිතිය වෙනුවෙන් වූ අරගලයක් සේ සලකමින් අප එම අරගලය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය සෑම සහායක්ම ලබා දෙන බවත් වැඩි දුරටත් අවධාරණය කර සිටිමු.

# පුවත්

## අවතැන් ජනතාවට කඳවුරු ජීවිත වෙනුවට එළිමහන් සිරකඳවුරු එපා

**ජ.වි.පෙ. දේශපාලන මණ්ඩලය**

මැණික්ෆාම් කඳවුරේ සිටි ජනතාව ඔවුන්ගේ මුල් ගම්බිම්වල නොව ආණ්ඩුව විසින් නියම කරන ලද වෙනත් භූමි භාගයන්හි පදිංචි කරවීමට ආණ්ඩුව උත්සාහ කිරීම හේතුවෙන් උද්ගත වූ තත්වය පිළිබඳව ජ.වි.පෙ. දේශපාලන මණ්ඩලය පසුගිය 27වැනිදා ජනමාධ්‍ය නිවේදනයක් නිකුත් කළේය. එය සම්පූර්ණයෙන් මෙසේය.

මැණික් ෆාම් සරණාගත කඳවුරේ සිට කිලිනොච්චි දිස්ත්‍රික්කයේ තිරුමුරුකණ්ඩි ප්‍රදේශයේ පදිංචි කිරීම සඳහා පසුගිය 23 වැනි දින රැගෙන එන ලද ජනතාව ඔවුන්ගේ විරෝධතා මධ්‍යයේ නැවතත් මැණික්ෆාම් කඳවුර වෙත රැගෙන ගොස් තිබේ. ආණ්ඩුව විසින් එම ජනතාව පදිංචි කරවීමට උත්සාහ දරා ඇත්තේ, 2009 වර්ෂයේ ඔවුන් අවතැන් වනවිට සිටි ඔවුන්ගේ මුල් ගම්බිම්වල නොව ආණ්ඩුව විසින් නියම කරන ලද වෙනත් භූමි භාගයන්හිය. තමන්ගේ සාරවත් ගොවිබිම් වෙනුවට නිසරු බිමවල ඔවුන් පදිංචි කරවීමට ගත් උත්සාහයට එම ජනතාවගේ විරෝධය පළවීමෙන් පසු ඔවුන් නැවතත් බලහත්කාරී ලෙස මැණික් ෆාම් කඳවුර වෙත රැගෙන යාම ජනතා විමුක්ති පෙරමුණ ලෙස අපි දැඩි ලෙස හෙළා දකිමු. මෙම ජනතාවට වසර 30ක යුද්ධය තුළ කිහිප වතාවක් තමන්ගේ ඉඩම් හා ගේදොර අහිමි වී ඇති අතර වසර 03ක් පුරා ඔවුන් මැණික් ෆාම් කඳවුරේ අතිශය දුක්ඛිත ජීවිත ගත කරමින් සිටියවුන් බව අමුතුවෙන් කිව යුතු නොවේ. කඳවුරට ගාල් කිරීමෙන් පසු මාස 09ක් තුළ ඔවුන්ගේ මුල් බිම්වල නැවත පදිංචි කරන බවට ආණ්ඩුව විසින් ලබාදී තිබූ පොරොන්දුද ඔවුනට අමතක වී යාමට ඉඩක් නැත.

මේ තත්වය තුළ ජනතා විමුක්ති පෙරමුණ දිගින් දිගටම ආණ්ඩුවට අවධාරණය කර තිබුණේ අවතැන් වූ ජනතාව කඩිනමින් ඔවුන්ගේ ගම්බිම්වල පදිංචි කළ යුතු බවය. ආණ්ඩුව තමන් දණ නමස්කාර කරන ඉන්දියාවෙන් හෝ බටහිර රටකින් රාජතාන්ත්‍රිකයින් පැමිණි විගස අවතැන් වූවන් කඩිනමින් පදිංචි කරන බව ප්‍රකාශයට පත් කරන නමුත් ඒවා ක්‍රියාවට නැගුණේ නැත. ඉන්දියාව වෙනුවෙන් සාම්පූර් බලාගාරය තැනීම සඳහා එම ප්‍රදේශයෙන්ද ජනතාව ඉවත් කළ ආණ්ඩුව, දැන් කිලිනොච්චියේ අවතැන් ජනතාවද කඳවුරු ජීවිතයෙන් එළිමහන් සිරකඳවුරු ජීවිතයකට තල්ලු කිරීමට උත්සාහ කරයි.

මැණික් ෆාම් කඳවුරේ සිට රැගෙන එන ලද ජනතාව තිරිමුරුකණ්ඩි හින්දු විද්‍යාලයේ රඳවා සිටියෙදී තමන්ගේ මුල් බිම් හැර වෙනත් බිමකට යාම ප්‍රතික්ෂේප කළ අවස්ථාවේ හමුදාව හා පොලීසියේ බලහත්කාරී තර්ජන මධ්‍යයේ බස්වලට හා ලොරිවලට පටවනු ලැබ තිබේ. එසේනම් ආණ්ඩුව තවමත් මේ අවතැන් ජනතාවගෙන් පළිගනිමින් සිටින බවත් ඔවුන්ට පුරවැසියන් ලෙස සැලකීමට අසමත් බවත් පැහැදිලිය. වසර 03ක් තිස්සේ උපන් බිමට යැවීමේ සිහිනවලින් රවටන ලද මෙම ජනතාව පසුව ගම්බිම්වලට රැගෙන යන බවට දෙන ආණ්ඩුවේ නව පොරොන්දුවලට නොරැවටීම විමතියට කරුණක් නොවේ. අනෙක් අතට ඉක්මනින්ම මුල් බිම්වලට රැගෙන යනු ලබන්නේ නම් වෙනත් බිම්වල ඔවුන්ට ජීවිත ආරම්භ කරන්නැයි කියන්නේ මන්ද යන්න පැහැදිලි නැත.

මෙම ජනතාව ඔවුන්ගේ මුල් ගම්බිම්වල පදිංචි නොකිරීමට හේතුව ආණ්ඩුව මේ දක්වා ඒ ජනතාවට හෝ රටට පැහැදිලි කර නැත. මේ තත්වය තුළ අප අවධාරණය කරන්නේ, තවදුරටත් නිදහසට කරුණු ඉදිරිපත් නොකර ආණ්ඩුව වහා මෙම ජනතාව ඔවුන්ගේ මුල් ගම්බිම්වල පදිංචි කරවීමට කටයුතු කළ යුතු බවය. එමෙන්ම ආණ්ඩුව ඔවුන්ගේ සාධාරණ විරෝධතා හා උද්ඝෝෂණ මර්දනය කර යටපත් කිරීමට උත්සාහ නොකර වසර 30කට වැඩි කාලයක් පීඩාවට පත්ව කඩාවැටුණු ඔවුන්ගේ ජනජීවිත නැවත ගොඩනගා ගැනීමට වහා ඉඩ සැලසිය යුතුය.

මේ තත්වය තුළ අවතැන් වූ සියලු ජනතාව ඔවුන්ගේ මුල්බිම්වල පදිංචි කිරීමට ආණ්ඩුවට බලකළ යුතු යැයි සමස්ත ශ්‍රී ලාංකේය ජනතාවගෙන් අපි ඉල්ලා සිටිමු.

## බොරු කියන්නේ තෙල් සංස්ථාවයි

**අනුර දිසානායක සහෝදරයා**

තෙල් මිල පහළ අඩු කරන ලෙසට බලකරමින් ජ.වි.පෙ. විසින් පවත්වන ලද මාධ්‍ය හමුවේ දක්වන ලද අදහස් නිවැරදි නොවන බව ඛනිජ තෙල් අමාත්‍යාංශය නිකුත් කළ නිවේදනයක සඳහන් වීම මත පාර්ලිමේන්තු මන්ත්‍රී, දේශපාලන මණ්ඩල සභික අනුර දිසානායක සහෝදරයා පසුගිය 12වැනි දින මාධ්‍ය නිවේදනයක් නිකුත් කළේය. එය සම්පූර්ණයෙන් මෙසේය.

පසුගිය 10දා ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් සහෝදරයා තෙල් මිල අඩුකරන ලෙස ආණ්ඩුවට බලකරමින් පැවැත්වූ පුවත්පත් සාකච්ඡාවට ප්‍රතිචාර දක්වමින් ඛනිජ තෙල් අමාත්‍යාංශය නිකුත් කළ නිවේදනයක් මාධ්‍යවල පළවී තිබේ. එහිදී ඛනිජ තෙල් අමාත්‍යාංශ නිවේදනයේ සඳහන් වන්නේ ජවිපෙ ප්‍රධාන ලේකම්වරයා ඉදිරිපත් කළ කරුණු අසත්‍ය බවය. එහෙත් සත්‍යය නම් තෙල් මිල වැඩි වීම පිළිබඳවත් තෙල් සංස්ථාවේ සිදුවන දූෂණ අක්‍රමිකතා හා නාස්තිය පිළිබඳවත් සත්‍යය වසන් කරමින් අසත්‍ය තොරතුරු රටටම පවසන්නේ ආණ්ඩුව හා තෙල් සංස්ථාවේ බලධාරීන් බවය.

පසුගිය වසරේ බාල පෙට්‍රල් ගෙන්වීම නිසාත් ප්‍රමිතියෙන් තොර ගුවන් යානා තෙල් ගෙන්වීම නිසාත් සිදු වූ පාඩුව පිළිබඳ සංඛ්‍යා වැරදි බව කියන සංස්ථාව එවැනි අක්‍රමිකතාවක් සිදු වූ බව අනියමින් පිළිගෙන තිබේ. වැදගත්කම තිබෙන්නේ පාඩු ලැබූ ප්‍රමාණයේ ඉලක්කමේ නොව තෙල් සංස්ථාවේ අක්‍රමිකතා නිසා පාඩු සිදුව තිබීමය. බාල පෙට්‍රල් ගෙන්වීමේ සිදුවීම සොයා බැලීමට පත් කළ කොමිසමේ සඳහන් කරුණු මොනවාදැයි සංස්ථාව පවසන්නේ නම් හොඳය.

අනෙක් කරුණ නම් තෙල් සංස්ථාව 2008 න් පසු තම ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා විගණනයකට ලක් කර නැති නිසා සංස්ථාව ඉදිරිපත් කරන සංඛ්‍යා සැක සහිතය. තෙල් බෙදා හැරීමේදී සංස්ථාව පාඩු ලබන බව සත්‍ය විය හැක. එහෙත් ඒ පාඩු ලබන්නේ ආණ්ඩුව තෙල් සඳහා අධික බද්දක් පනවා මුදල් එකතු කරන නිසාය. එසේ නැතිව ජනතාවට තෙල් අඩු මිලට ලබාදෙන නිසා නොවේ. ලෝක වෙළඳපලේ තෙල් මිල පහළ ගොස් ඇති බවත් එහි වාසිය ආණ්ඩුව ජනතාවට ලබා නොදෙන බවත් පරම සත්‍යයකි. එම සත්‍යය මග හරිමින් තෙල් සංස්ථාව කරුණු ඉදිරිපත් කර ඇත්තේ යන්නේ කොහෙද ඇසූ විට මල්ලේ පොල් කියන්නාක් මෙනි. කෙසේ වෙතත් අප ඉදිරිපත් කළ පහත කරුණු අසත්‍ය වන්නේ කෙසේදැයි තෙල් සංස්ථාවේ බලධාරීන් මෙන්ම ආණ්ඩුවද පැහැදිලි කළ යුතුය.

01. 2012 පෙබරවාරි 12 ලංකාවේ තෙල් මිල වැඩි කරන විට තිබුණාට වඩා ලෝක වෙළඳ පොලේ බොරතෙල් මිල අඩු වී දැන් එය බැරලය ඩොලර් 97 ට අඩු වී ඇති බව හා එහි වාසිය ජනතාවට නොදී සිටින බව
02. සංස්ථාව ගෙන්වන ඩීසල් වරායට ගොඩබාන විට ලීටරයක වියදම රුපියල් 95 ක් වන අතර සුපිරි ඩීසල් ලීටරය 142 ටත් සාමාන්‍ය ඩීසල් ලීටරයක් රු.115 ටත් විකුණන බව.
03. ආණ්ඩුව පෙට්‍රල් ලීටරයකින් රුපියල් 42 ක බද්දක් හා ඩීසල් ලීටරයකින් රුපියල් 4 ක බද්දක් ලබාගන්නා අතර එම බදු මුදල් මගින් ආණ්ඩුව වාර්ෂිකව තෙල්වලින් පමණක් රුපියල් මිලියන 50,000 උපයන බව
ඒ අනුව සෑම පවුලක්ම වසරකට තෙල් සඳහා පමණක් ආණ්ඩුවට රුපියල් 10,000ක බද්දක් ගෙවන බව හා ඒ අනුව සෑම පුරවැසියෙක්ම තෙල් සඳහා රුපියල් 2500 ක බද්දක් ගෙවන බව.
04. තෙල් සංස්ථාව සතුව තිබූ ලාබ ලබන අංශ වූ නැව් තෙල් අංශය මුළුමනින්ම විකුණා දැමූ බව හා එය නැවත අධිකරණ නියෝගයකින් සංස්ථාවට හිමි වූ පසුත් යළි පෞද්ගලික අංශයට දුන් බව.
05. සංස්ථාවට ලාභ ලබා දුන් තාර විකිණීමේ ඒකාධිකාරය අහෝසිකර ඉන් අඩක් ෂධක සමාගමට පවරා ඇති බව.
06. ලිහිසි තෙල් බෙදා හැරීම කැල්ටෙක්ස් සමාගමට යළි විකුණා දැමූ බව.
07. ලංකාවේ තෙල් පිරවුම් හල් ප්‍රමාණයක් ෂධක යට වසර 10 ක බදු සහන සහිතව ලබා දුන් බව හා ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ටිකද ඔවුනට ලබා දී ඇති බව.
08. තෙල් සංස්ථාව 2008 සිට මේ දක්වා විගණන පරීක්ෂණයක් සිදු කර නැති බව.

මේ සියලු ක්‍රියාවන්ගේ බර දැරීමට සිදුව තිබෙන්නේ ජනතාවටය. ලෝක වෙළඳපළේ තෙල් මිල අඩු වීමට අනුව ලංකාවේ තෙල් මිල අඩුකර ජනතාවට කිසියම් සහනයක් ලබා දෙන ලෙස අප ආණ්ඩුවට බල කළේ ඉහත කරුණුද පදනම් කරගෙනය. මේ පිළිබඳව තෙල් සංස්ථාවේ බලධාරීන් හෝ ආණ්ඩුව විවාදයකට පැමිණෙන්නේ නම් එහිදී මෙමම කරුණු ඔප්පු කිරීමට අප සූදානම් බවද පවසමු.

# මායාවක් හා වංචාවක් වූ ප්‍රජාතන්ත්‍රවාදය

පසුගිය ජූනි 15 වැනිදා හම්බන්තොට දිස්ත්‍රික්කයේ කටුවනදී පැවති ජ.වි.පෙ. ජනහමුවකට ආණ්ඩුවේ බලධාරීන් විසින් මෙහෙයවන මිනීමරු කල්ලියක් විසින් වෙඩිතබා ඝාතන සිදුකිරීමත් සමග ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ කතාබහ යළි මතු විය. සැබැවින්ම ඉහත සිදුවීම් ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්නයක් බවට පත් වූයේ, කාන්තාවක හා තරුණයකු ඝාතනය වීම නිසාම නොව එකී ඝාතනයේ වගකිවයුත්තන් රැකීමට ආණ්ඩුව ගත් නිර්ලජ්ජිත එහෙමත් අසාර්ථක උත්සාහය නිසාය. ආණ්ඩුවේ ජාතික ආරක්‍ෂාව පිළිබඳ මාධ්‍ය මධ්‍යස්ථානය, පොලිසියේ ඉහළ නිලධාරීනුත් ආණ්ඩුවට සම්බන්ධ ජනමාධ්‍යත් මිනීමරුවන් ආරක්‍ෂා කිරීමට හා ඝාතනයේ වගකීම වෙනත් පාර්ශව වෙත පැවරීමට ගත් නින්දිත උත්සාහය හාස්‍යය උපදවන්නක් තරමටම දිගින් දිගට සිදුවිය. ලංකාව තුළ ප්‍රජාතන්ත්‍රවාදයට සිදු වී ඇති මාරාන්තික හානිය පිළිබඳවත් පොදුවේ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවායේ සැබෑ තත්වය පිළිබඳවත් යළි අවධානය යොමුකරවීමට මෙම තත්වය අපට බලකර ඇත.



"නවීන රාජ්‍යවල මූලික නීති ගනිමු. ඒවායේ පරිපාලනය, රැස්වීමේ නිදහස, පුවත් පත් නිදහස, නැතහොත් 'නීතිය හමුවේ සියලු පුරවැසියන්ගේ සමානාත්මතාවය' ගනිමු. එවිට ධනපති ප්‍රජාතන්ත්‍රවාදයේ වංචාව ඔබට පියවරක් පියවරක් පාසා දැකිය හැකි වනු ඇත. සෑම අවංක හා පංති විඥ්ඥානය ඇති කම්කරුවෙක්ම ඒ ගැන මනාව දන්නේය. මහජන සාමය කඩකළ විටෙක, එනම් පීඩිත පංතිය ඇත්තෙන්ම එහි වහල් තත්වය කඩකර වහල් නොවන තත්වයකින් හැසිරෙන්නට උත්සාහ කරන විටෙක කම්කරුවන්ට විරුද්ධව යුද්ධ හමුදා යැවීමේ, යුද්ධ නීතිය පැනවීමේ, එවැනි වෙනත් පියවරක් ගැනීමේ හැකියාව ධනපති පංතියට සහතික කරදෙන ඉඩකඩ, නැතහොත් විශේෂ ප්‍රතිපාදන නොසලසන ව්‍යවස්ථාවක් ඇති එකම රාජ්‍යයක්වත් නැත"

**ලෙනින්**
**තෝරාගත් කෘති 9 වෙළුම, 25 පිටුව**

### පෙනුම හා හරය

ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව හෙවත් මූලික නීතියට අනුව ලංකාව හඳුන්වා ඇත්තේ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ලෙසය. ලංකාවේ අභ්‍යන්තරය ගැන නොදන්නා ලංකාවේ නම කියවන විදේශිකයකු ලංකාව ප්‍රජාතන්ත්‍රවාදී හා සමාජවාදී රටක් ලෙස කල්පනා කරනු ඇත. එහෙත් මෙහි සැබැවින්ම පවතින්නේ, ඉහත නාමකරණයේ සම්පූර්ණ ප්‍රතිවිරෝධයයි. හරය හා පෙනුම සමපාත වන්නේ නම් විද්‍යාවක් අවශ්‍ය නොවනු ඇතැයි වරක් එංගල්ස් පැවසූ ලෙසම ලංකාවේද හරය හා පෙනුම පවතින්නේ ප්‍රතිවිරෝධයකය. ලංකාව නිල නාමකරණයේ සමාජවාදය යන පදය තිබුණාට මෙහි සැබෑලෙසම පවතින්නේ සමාජවාදය නොව ධනවාදයයි. අධිරාජ්‍යගැති නව ලිබරල්වාදී පසුගාමී ධනවාදයයි. ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයද ව්‍යවස්ථාවේ වගන්තිවලට පමණක් සීමා වූ සැබෑ ලෙසම නොපවතින දෙයක් බවට පත්ව තිබේ. බොහෝ ධනපති රටවල මෙන්ම ලංකාවේදීද ප්‍රජාතන්ත්‍රවාදය සීතාම්බර පටයක් වී තිබේ. එවැන්නක් තිබේ යයි විශ්වාස කළද යථාර්ථයේදී හා භාවිතයේදී එවැන්නක් නැත. එය මායාවක් බවට පත්ව තිබේ.

### ප්‍රජාතන්ත්‍රවාදය කාගේද?

වත්මන් ධනේශ්වර ලෝකය තුළ ප්‍රජාතන්ත්‍රවාදය යන පදය වියුක්ත අර්ථයකින් භාවිතා කළද සැබවින්ම මෙහි පවතින්නේ, ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය වේ. ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය කිසියම්ම ප්‍රමාණයකින් හෝ භාවිතයට නැගෙන රටවලදී පවා එය වංචාවක් හා මායාවක් වේ. ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ඉතාම නිවැරදි හා අංගසම්පූර්ණ නිර්වචනය ඉදිරිපත් කළේ ලෙනින්ය. වැඩවසම් අත්තනෝමතික ආණ්ඩු පැවති මධ්‍යතන යුගයට සාපේක්‍ෂව ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය ඉදිරි පියවරක් වුවද එය පන්ති අර්ථයෙන් විග්‍රහකරන විට පොහොසතුන්ට (පාලක පංතියට) එක් අර්ථයකිනුත් දුප්පතුන්ට (පීඩිත පංතියට) වෙනත් අර්ථයකිනුත් ක්‍රියාත්මක වන්නක් බව ලෙනින් පැහැදිලි කළේ මෙසේය.

**"මධ්‍යතනවාදය සමග සංසන්දනය කරන කල ධනපති ප්‍රජාතන්ත්‍රවාදයෙන් මහා ඓතිහාසික ඉදිරි ගමනක් සලකුණු වන නමුත්, එය කවදත් සීමා කළ, කප්පාදු කළ, ව්‍යාජ හා වංචනික ප්‍රජාතන්ත්‍රවාදයක්ද ධනපතීන්ට පාරාදීසයක් හා සූරාකනු ලබන්නන්ට, දුප්පතුන්ට උගුලක් හා රැවටිල්ලක්ද වූයේය. ධනපති ක්‍රමය යටතේ එය එසේ පැවතීම නොවැළැක්විය හැකිය." - ලෙනින් තෝරා ගත් කෘති. 9 වෙළුම-23 පිටුව.**

මේ අනුව ප්‍රජාතන්ත්‍රවාදය ඉතා හොඳින් ක්‍රියත්මකවනවා යයි කියන දියුණු ධනපති රටවලදී පවා එය ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය නම් එවිට එය පීඩිත පංතියට මායාවක් හා මළපුඩුවක් වන අතර සීමා කිරීම්, කප්පාදු කිරීම් පිරි ව්‍යාජ හා කුහක එකක් වේ. මෙම සත්‍යයට අනුව ලංකාව වැනි ප්‍රජාතනත්‍රවාදය පෝරකයට යවා තියෙන රටවල ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථාකිරීම පවා විහිළුවක් බවට පත් වෙමින් තිබේ.

### ලංකාවේ භාවිතය

ලංකාවේ පාලක පංතිය ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය පවා අහෝසි කරමින් සිටියි. පෙනුමෙන් හෝ ස්වාධීනයයි කියා ගන්නා සියලු ආයතන පාලක පංතිය තම වසඟයටත් තම බල ආධිපත්‍යයටත් යටත් කොට ඒවායේ සැබෑ නිරුවත හෙළි කර තිබේ. වරක් මැතිවරණ කල් දැමීමට මැතිවරණ පැවැත්වූයේ ලංකාවේය. ඒ, 1982 එ.ජා.ප. පාලන සමය තුළදීය. 83 මහ මැතිවරණය කල් දමා ඡන්ද සිතියම අකුළා දැමීම සඳහා ඊනියා ජනමත විචාරණයක් පැවැත් වූ ආණ්ඩුව මහ මැතිවරණය වසර 6 කට කල් දමා පාර්ලිමේන්තුවට නියෝජිතයන් පත් කිරීමේ අයිතිය ජනතාවගෙන් උදුරා ගත්තේය. එය උදුරා ගත්තේ ජනතාවගේම ඡන්දය මගිනි. ධනපති ප්‍රජාතන්ත්‍රවාදය පොදු ජනයාට මායාවක් හා මළපුඩුවක් වන්නේ කෙසේද යන්නට එය හොඳම නිදසුනකි. කලක් මහජන ආරක්‍ෂක පනත යටතේ හදිසි නීතිය පැනවීම හා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වැනි විශේෂ ක්‍රම මගින් සාමාන්‍ය නීතිය තමන්ට අවශ්‍ය හැම විටම අත්හිටුවීමට කටයුතු කළ පාලක පංතිය දැන් හදිසි නීතිය නැති විට පවා සාමාන්‍ය නීතිය උල්ලංඝනය කරමින් කටයුතු කරනු පෙනේ. කිසියම් යුගයක පවත්නා නීති වූ කලී එම යුගයේ පාලක පංතියේ කැමැත්ත වන්නේය යන කියමන ලංකාවේදී හොඳින්ම සනාථ තිබේ.

### 17 වෙනුවට 18

2001 වසරේ පරිවාස ආණ්ඩුව බිහිකළ විට එය විසින් සිදුකරවා ගත් එක් ධනේශ්වර ප්‍රතිසංස්කරණයක් වූයේ 17 වන ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගැනීමය. කුමන අඩුපාඩුකම් පැවතියත් ඒ මගින්, ස්වාධීන මැතිවරණ කොමිසම,ස්වාධීන පොලිස් කොමිසම, ස්වාධීන රාජ්‍ය සේවා කොමිසම, වැනි කොමිෂන් සභා පිහිටූ වීමට කටයුතු කෙරිණි. එහෙත් පාලකයින් ධනේශ්වර ප්‍රජතන්ත්‍රවාදයට පවා කොතරම් බියද යන්න පෙන්වමින් 2010 වසරේදී මහින්ද රාජපක්‍ෂ පාලනය 18 වන ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරමින් ඒ මගින් 17 වන සංශෝධනය අහෝසි වන ආකාරයට කටයුතු කළේය. 18 වන සංශෝධනය මගින් විධායක ජනාධිපති ධූරයට වාර දෙකේ සීමාවද ඉවත්කර ගත්තේය. එලෙස වරෙක නීති මගින් තහවුරු කර තිබෙන ප්‍රජාතනත්‍රවාදී අයිතීන් වෙනත් නීතියක් මගින් අහෝසි කරවමින් අත්තනෝමතික පාලනයකට මග සකසා ගෙන තිබේ. ඒ මගින් පොලිසිය, අධිකරණය හා රාජ්‍ය සේවය යන ආයතන තම දේශපාලන වුවමනා සඳහා කිසිදු බාධාවකින් තොරව, කිසිදු සදාචාර සීමාවකින් තොරව යොදා ගනිමින් තිබේ.

### රාජපක්‍ෂ ප්‍රජාතන්ත්‍රවාදය

රාජපක්‍ෂ පාලනය ඊනියා ප්‍රජාතනත්‍රවාදය තුළ සියල්ල සිදුවෙමින් පවතින්නේ, රාජපක්‍ෂ පාලනයේ වුවමනාවන් සඳහාය. තම විරුද්ධවාදීන්ව බොරු චෝදනා මත අත්අඩංගුවට ගැනීම නඩු පවරා දඬුවම් කිරීමට මෙන්ම තමන්ට හිතුණ විට නිදහස් කර යැවීමටද රාජපක්ෂ පාලනයට හැකිය. විධායක ජනාධිපති බලය ඒ සඳහා යොදා ගනී. සරත් පොන්සේකා මහතා සිරගත කිරීම හා පසුව නිදහස් කිරීම මේ සඳහා වන හොඳම උදාහරණයකි. ඒ සඳහා පොලිසිය, බන්ධනාගාරය හා අධිකරණය පවා තම අරමුණු සඳහා යොදවා ගැනිණි. අධිකරණයේ ඉහළම තනතුරුවලට තම හිතවතුන් පත් කර ගැනීමේ සිට අධිකරණයේ ඉහළම තනතුරු දරන අයගේ පවුලේ සමීපතමයන්ට විවිධ තනතුරු පිරිනමා ඒ මගින් ඒ අය තම වසඟයට ගැනීම දක්වාත් තම වුවමනාවට අනුව කටයුතු නොකරන අය තනතුරුවලින් ඉවත් කිරීම මගින් අධිකරණයට අත තැබූ ආණ්ඩුව එය සිය දේශපාලන වුවමනාව සඳහා යොදා ගත්තේය. ආණ්ඩුවේ ඊනියා ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන්නේ එසේය.



### ආණ්ඩුවේ පාතාලය

වර්තමාන ආණ්ඩුව තම විරුද්ධවාදීන්ට හා සාමාන්‍ය ජනතාවට එරෙහිව නිල රාජ්‍ය ආයතන යොදා ගන්නවාට අමතරව නිල නොවන හෝ නිල මැර කණ්ඩායම්ද යොදා ගනී. පැහැර ගෙන යාම්, අතුරුදහන් කිරීම්, පහර දීම් , බිය වැද්දීම් හා ඝාතනය කිරීම් සඳහා එකී කණ්ඩායම් යොදා ගනී. එම කණ්ඩායම්වලට රාජ්‍ය ආරක්‍ෂාව ලබා දීම නිසා ඔවුන් බියෙන් තොරව ජනතාව බිය වද්දමින් ක්‍රියාත්මක වේ. පසුගිය කාලයේ ආණ්ඩුව පාතාල කල්ලි ගණනාවක් විනාශ කළේය. එය කළේද නීතියට අනුව නොව නීතිය හාස්‍යයට ලක් කරමිනි. එම පාතාල කල්ලි සියල්ලම ආණ්ඩුවට සම්බන්ධ නැති හෝ ඊට විරුද්ධ පාතාල කල්ලි වූ අතර එම කල්ලිවල නායකයින් බොහෝ දෙනෙක් නඩු විභාගවලින් තොරව මරා දැමිණි. ඒ පාතාල සාමාජිකයන් අවි පෙන්වීමට ගොස් එම අවිවලින් පොලිසියට පහර දීමට ගත් උත්සාහයේදී පොලිස් වෙඩි පහරින් මරුමුවට පත්වීම නමැති පැහැදිලි කිරීම යටතේය. තමන්ට අවනත නොවන පාතාල කල්ලි මර්දනය කළ ආණ්ඩුව, ආණ්ඩුවේ පාතාලයන් නඩත්තු කරමින් යයි. කටුවනදී ජ.වි.පෙ. රැලියට වෙඩි තබා වටිනා ජීවිත දෙකක් විනාශ කළේ එවැනි පාතාල කල්ලියක් විසිනි. එම නිසා ආණ්ඩුව දිගටම උත්සාහ කළේ එම කල්ලිය රැකීමට මිස

15වැනි පිටුවට






# අතීතය වැරදී හමාරය. අනාගතය...... ?

මිනිසා තම අනාගතය ගොඩනගා ගන්නේ අතීත අත්දැකීම් අනුසාරයෙනි. අනනාගතයේ වැරදුණු තැන්වලින් අපි පාඩම් ඉගෙන ගන්නෙමු. අපේ රට පිළිබඳව කල්පනා කර බැලූවිට අතීතයේ බොහෝ තැන් අප හට වැරදී ඇත. එම වැරදීම්වලට විශාල වන්දි ගෙවීමට අප හට සිදුව ඇත. එසේ සිදුවූ බරපතළ වැරදීම් හේතු කොට ගෙන දස දහස් ගණන් මිනිස් ජීවිත පවා අහිමි වී ඇත. එහෙත් ඒසා විශාල ව්‍යවසනයන්ගෙන් පවා අප පාඩම් ඉගෙන ගෙන ඇත්දැයි විටෙක සිතේ. කණගාටුවට කරුණ නම් අතීතයේ සිදු වූ වැරදිම අද දවසේද ඒ අයුරින්ම සිදුවීමයි.

ඉතිහාසයේ අන් කවරදාකටත් වඩා ලෝකය අද වඩාත් විද්‍යාත්මකව දියුණු තත්වයකට පත්ව ඇත. එසේ නම් සිදු විය යුත්තේ එම තාක්‍ෂණික දියුණුව මිනිස් වර්ගයාගේ සුභසිද්ධිය වෙනුවෙන් යොදවා ගැනීමය. අනතර්ජාලය විසින් අද ලෝකය එකම ගම්මානයක් බවට පත්කොට ඇත. එපමණක්ද නොව මෑත ඉතිහාසයේ ලෝකයේ ඇතැම් රටවල දේශපාලන ඉරණම පවා වෙනස් කළ මෙවලමක් බවට අන්තර්ජාලය පත් විය. අරාබි වසන්තය පුරාවටම ජනතාව පෙළන පාලනයන්ට එරෙහිව ජනතාව පෙළගැස්වීමේ සංවිධායක කාර්ය භාරයේ මාධ්‍යය වූයේ අන්තර්ජාලයයි. එම රටවල තරුණ පිරිස්, තම රටවල් තුළ මානව හිතවාදී දේශපාලනය ස්ථාපිත කොට වඩා හොඳ හෙටක් වෙත පිය නැගීමේ අරමුණ වෙනුවෙන් තාක්‍ෂණය පිටුවහලක් කොට ගත්හ.

මීට වසර 5-6 කට සාපේක්‍ෂව බලන කල අද වන විට අප රට තුළද අනතර්ජාල භාවිතය ඉතාමත්ම ජනප්‍රිය වී ඇත. ලොව සෑම රටක මෙන්ම සමාජය වෙබ් අඩවියක් ලෙස FACE BOOK විශේෂයෙන්ම අප රට තුලද ජනප්‍රිය වී ඇත. FACE BOOK ගිණුමක් හිමි නැති තරුණයෙක් හෝ තරුණියක් සොයා ගැනීම පවා අද රට තුළ දුෂ්කරය. නමුත් අප රට තුළද ආගමික අන්තවාදයත් පතුරුවා හැරීමට FACE BOOK භාවිතා වනවා දැකිය හැකිය. එය කණගාටුදායික තත්වයකි. එනම් මිනිසාගේ ප්‍රගමනය වෙනුවෙන් තාක්‍ෂණය භාවිතා කරනවා වෙනුවට මිනිසා ආගම පදනම් කොටගෙන භේදභින්න වීමයි.

1983 කළු ජූලිය අප අත්දැක තිබෙන අතර ඒ ව්‍යවසනයේ තරම අපි අසා ඇත්තෙමු. දේශපාලන වාසි වෙනුවෙන් බෙදා වෙන් කිරීමට තැත්කළ ජාතිවාදී දෙකක ජාතිකත්ව හැඟ ීම් ඇවිස්සීම මගින් මහා මිනිස් සංහාරයක් සිදු කළ ඒ අඳුරු අතීතයට අපි අද පවා සාප කරන්නෙමු. එම සිදුවීම මගින් සිංහළ, දෙමළ, හදවත් තුළ ඇති කළ තුවාලය තවමත් සුව වී නොමැත. එවන් වූ වටපිටාවක අතීතයේ වැරදි තළින් පාඩම් ඉගෙන ගෙන අනාගතයේදී ඒවා යළිත් සිදුනොවීමට කටයුතු කළ යුතුය. ජාතිවාදී, ගෝත්‍රවාදී සංකල්ප වත්මන් යුගයට අයත් ඒවා නොවන අතර ඒවා වැඩවසම් යුගයට පෙර සමාජ රටාවන්ට අදාලව පැවති ඒවා බව තේරුම් ගත යුතුය. එහෙත් බෙලහීන පාලක පංතිය මේවා පවත්වගෙන යන්නේ පීඩිත පංතිය සමගිවීම වැළැක්වීමට ඒවායින් මහත් ප්‍රයෝජනයක් තිබෙන බැවිනි. දඹුල්ලේත් තවත් තැන්වලත් මෙවැනි ආගමික කුපිත කිරීම් දැකිය හැකි විය.

වත්මන් තරුණ පරපුර ලෙස අප තුළ යුත්තේ ඒ පැරණි වැඩවසම් ගෝත්‍රවාදී සංකල්ප හිස්වල දරා ගනිමින් ධනපති පංතිය අටවනා ඇති උගුලේ සිරවීම නොව බුද්ධිමත්ව මේ කරුණු තේරුම් ගැනීමයි. තාරුණ්‍යයේ ජවය, ශක්තිය, බුද්ධිය මේ සියල්ල මිනිස් වර්ගයාගේ සුව සෙත සඳහා යෙදවීමයි. ජාත්‍යන්තරවාදයේ පරමාදර්ශය වු චේ ගුවේරා සහෝදරයා ඔහුගේ ජීවන භාවිතාවෙන් අපට කියා දුන්නේ මාක්ස්වාදය හැදෑරුවේ හුදු ආජන්ටිනානුවකු නොවී සමස්ථ මිනිස් වර්ගයාගේ විමුක්තිය, උදෙසා කැප වන්නෙකු බවට පත් වූයේය. අප ආදර්ශයන් ගත යුත්තේ එවැනි සැබෑ වීරවරුන්ගෙනි.

ඒ නිසා FACE BOOK ද අනෙකුත් සියලු තාක්‍ෂණික මෙවලම්ද යොදාගත යුත්තේ, පටු ආගමික අන්තවාදයත් වැපිරීමට නොව මනුෂ්‍යත්වය, සහෝදරත්වය, ශක්තිමත් කිරීමටත්, යථාර්ථය තේරුම් ගැනීමට දැනුම, බුද්ධිය වැඩිකර ගැනීමටත්ය.

මේ විනාශකාරී අදහස් තවදුරටත් ව්‍යයාප්ත වුව හොත් එදා 1983 දී මෙන් හෙට දිනයේද ආගම නිසා ලාංකිකයා එකිනෙකා ඇණ කොටා ගනු ඇත. අප අඳුරු අතීයකට සාප කරන්නා මෙන් එවිට අනාගත පරපුර ඔවුන්ටම හිමි භේද භින්න වූ සමාජය දෙස බලා සාප කරනු ඇත. එදාට ඒ ව්‍යවසනයන්ට වගකිවයුත්තන් වීමට අප හටද සිදුවනු ඇත. එබැවින් ආගම මුවාවෙන් ව්‍යාප්ත කරනු ලබන මෙම අන්තවාදයට විරෝධය පෑමට පෙළගැසෙමු. සෑම මිනිසාටම එක ලෙසට සලකන සාධාරණ සමාජවාදී සමාජයක් හෙට දවසේ බිහිකිරීමට කැප වෙමු.

## අන්තිම දුම්රිය වෙනුවට

# සහෝදරත්වයේ දුම්රිය

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් මහා භාරතය යටත් විජිතයක් කොට එය තුළ ජාතිවාදී බීජ වපුරා තවත් පොහොර දමා ජාතිවාදය ශක්තිමත් කළහ. පකිස්ථානය නමින් වෙනම රාජ්‍යයක් නිර්මාණය කරන තැනටම එය වර්ධනය විය. අවසානයේ හින්දු හා මුස්ලිම්වරු දස දහස් ගණනක් ඝාතනය කරවූ ලේ සාගරයක් හරහා එය සිදුවිය. බුෂ්වන්ත් සිං ''අන්තිම දුම්රිය'' නම් වූ සිය කෘතියෙන් එහි වූ ම්ලේච්ඡත්වය ගැන අපට කියා පායි.

ලංකාවේද 83 කළු ජූලිය ඒ ම්ලේච්ඡත්වයම අපට සිහිපත් කරවයි. ලාංකීය භූමියේ සිංහල, දෙමළ, සහෝදර ජනතාව අතර විරසකයක් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් තම පාලනයේ වාසියට යොදා ගත්හ. ඔවුන් 1948 රටින් පිටව ගියද එහි බීජ වපුරා ගිය අතර ලාංකීය සිංහල, දෙමළ ධනපති පංති නායකයෝද තමන්ගේ බලය සඳහා පටු ජාතිවාදයත් දිගින් දිගටම යොදා ගත්හ. ඇමරිකාව ප්‍රමුඛ අධිරාජ්‍යවාදීන් ද ජාතිවාදී පදනමින් මේ ප්‍රශ්නය තම අරමුණු ඉටු කර ගැනීමේ ආයුධයක් ලෙස භාවිතා කරන්නට විය. මේ සියල්ලේ ප්‍රතිඵලය වූයේ ජාතිවාදී පිපාසය රටපුරා වැපිරවීමය. සිංහල, දෙමළ, මුස්ලිම් සහෝදරත්වයේ මිතුදමට වඩා ඔවුන්ගේ ජාතිවාදි බිජු ශක්තිමත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස 1983 ජූලි 23 ලාංකීය ඉතිහාසයට මැකිය නොහැකි කළු පිටුවක් ලෙස එක් විය. එය අවසන් වූයේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවගේ සහෝදරත්වයේ පෙකෙණිවැල කපා වෙන්කර දමමිනි. එය ''83 කළු ජූලිය'' ලෙස ලාංකීය ඉතිහාසයට එක්විය.

වසර 29 ක් තිස්සේ ''83 කලු ජූලිය'' පිළිබඳ විවිධ කතා බහ සිදුව තිබේ. ශ්‍රී ලාංකීය භූමියේ සිංහල, දෙමළ, මුස්ලිම් සහෝදරත්වය අහිමි කළ ''කළු ජූලිය'' සැමරුම වෙනුවට සහෝදරත්වය ගොඩනැගීම උදෙසා ''සහෝදරත්වයේ දිනය'' ලෙස නම් කර සැමරීමට සමාජවාදි තරුණ සංගමයේ අප තීන්දු කර දැනට වසර 3ක කාලයකි.

ජාතිවාදය, බෙදුම්වාදය පරාජය කොට ජාතික සමගිය ගොඩනැගිය හැක්කේ තරුණ්‍යයට බව අපි දනිමු. ඒ භාරදූර කාර්යය කිරීමේ අරමුණින් ඒ සඳහා නායකත්වය ගෙන කටයුතු කිරීමට සමාජවාදී තරුණ සංගමයේ අපි සූදානම් බවට මේ රටේ තාරුණ්‍යය හමුවේ ඔප්පු කර ඇත.

පසුගිය වසර 3ක කාලයක් තුළ විවිධ වැඩසටහන් කරමින් උතුරේත් දකුණේත් තරුණ තරුණියන්ගේ සහෝදරත්වය වර්ධනය කරන ලදී. එහි දී වැඩමුළු, සම්මන්ත්‍රණ, ක්‍රීඩා, චිත්‍රපටි පෙන්වීම හා තරුණ තරුණියන් දැනුවත් කිරීම් සිදුවිය. එපමණක් නොව ජාත්‍යන්තර වශයෙන්ද අපගේ මැදිහත්වීම කරන ලදී. 2008 දී පැවති ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සංගමය (WFDY) මගින් පැවැත් වූ වාර්ෂික මහ සමුළුවේදී බෙදුම්වාදයට, ත්‍රස්තවාදයට, ජාතිවාදයට හා මූලධර්මවාදයට එරෙහි යෝජනාවක් සමාජවාදී තරුණ සංගමය විසින් ගෙන එන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස බෙදුම්වාදයට, ත්‍රස්තවාදයට, ජාතිවාදයට හා මූලධර්මවාදයට එරෙහි දිනය ලෙස මැයි 30 නම් කරන ලදී. මීට වසර 3 කට පෙර බිහිසුණු යුද්ධය අවසන් විය. පාරවල් විවෘත වුණි. දුම්රිය ගමන් ඇරඹුනි. එහෙත් ජනතාවන් අතර සහෝදරත්වය උදෙසා පාලකයින්ගේ පැත්තෙන් ගත් කිසිදු ක්‍රියාමාර්ගයක් නොවුණි. ඒ වෙනුවට තවදුරටත් උතුරේ ජනතාව පෙළන, අර්ධ මිලටරි පාලනයක් උතුරට උරුම කර සිවිල් ජන ජීවිතය පවා තහවුරු කළේ නැත. පසුගිය කාලය තුළ ජාතික සමගිය ඇති කිරීමේ අසීරු ක්‍රියාවලිය සිදු කිරීමේදී ජාතිවාදී, අධිරාජ්‍යවාදී ගැත්තන් හා පාලකයන් සිදු කළ බාධා එමටය. එම අසීරුතා හා බාධා මධ්‍යයේ අපි, සිංහල, දෙමළ, මුස්ලිම් සහෝදරත්වය සඳහා වූ වැඩසටහන් නොනවත්වා ඉදිරියටම ගෙන එන ලදී. 2012 ''සහෝදරත්වයේ දිනය'' නිමිති කොට ගෙන ''එක්ව අපි පියාඹමු'' යන තේමාව මුල් කර ගනිමින් ''සහෝදරත්වයේ දුම්රිය'' කොළඹ සිට වව්නියාව දක්වාවත්, වව්නියාවේ පැවැත්වෙන සහෝදරත්වයේ පාගමනත් , සංස්කෘතික ප්‍රසංගය හා කිලිනොච්චියේ දී දෙමළ සහෝදර සහෝදරියන් එක්ව ගොඩ නැගෙන සහෝදරත්වයේ හමුව යන වැඩ සටහන් කිරීමට කටයුතු සූදානම් කර ඇත.

කළු ජූලිය මෙන්ම වසර 30ක යුද්ධය අපේ රටේ සිංහල දෙමළ මුස්ලිම් ජනතාවට අමිහිරි, වේදනාකාරී අත්දැකීම් ගෙන දුන්නක් විය. එය අවසන් වූයේ දෙමාපියන්ට දරුවනුත්, දරුවන්ට දෙමාපියනුත්, සැමියන්ට බිරින්දෑවරුත්, බිරින්දෑවරුන්ට සැමියනුත් සහ බොහෝ අයට තම තමන්ගේ ශරීරවල කොටස්ද අහිමි කරමිනි. එබැවින් සිංහල හෝ දෙමළ හෝ මුස්ලිම් හෝ කිසිම කෙනෙකු යළි එවැනි අත්දැකීම් ලබන්නට කැමති වන්නේ නැත. කෙසේ නමුත් යුද්ධය අවසන් වීමත් සමඟ ලාංකීය ජනතාවගේ සිත් තුළ යළි ජාතිවාදී, බෙදුම්වාදී තත්වයක් ඇති නොවන බවටත් ඒකීය රටක් තුළ එකාමෙන් ජීවත් විය හැකි බවටත්, දූන් ජාතික සමගිය ගොඩනැගෙන බවටත් සිහින් බලා

15වැනි පිටුවට





**ජාතිවාදය යුද්ධයක් ලෙසින් බුර බුරා නැගෙද්දී, ඊට එරෙහිව සහෝදරත්වය, මනුෂ්‍යත්වය වෙනුවෙන් ආයාචනය කෙරුනු ජෙයපාලන් ගේ කවියකින් උපුටා ගත් කොටසක්......**

''....... වෙනස්කම් නම් කොපමණ වෙද
බලනු මැන අප'තරම පවතින
එහෙත් යතුර අත නාරින්
රන්වන් ලෝකයේ යතුර
අප දිනූ මව්බිම ගෙනයන්
කුණාටු මුහුදෙන් එගොඩට
අධිෂ්ඨාන වානේ මෙන්
ඇති නම් ඔබ - මා අතරේ
එයයි සදා ආනන්දය
එහි මිල සිය කෝටියක් ය.....''

-ව.අයි.ස. ජෙයපාලන්-

# ID X-ray

**ඇමරිකා එක්සත් ජනපදය**

විශාලත්වයඃ වර්ග කි.මී. මිලියන 9.8
ජනගහණයඃ මිලියන 313
ලොව විශාලත්වය අතින්ඃ 3වැනි රට
ආර්ථිකයඃ ට්‍රිලියන් 15.04 (ඩොලර්) ලොව අංක 01 ආර්ථිකය
ඒකපුද්ගල ආදායමඃ USD 48,100
ලොව විශාලතම යුධ බලය, ලොව විශාලතම තාක්‍ෂණික හැකියාව, ලොව විශාලතම කලා නිර්මාණ වෙළඳපොල ඇති රට.

## ID X-rayed

දුප්පත්කමින් පෙළෙන ජනයගහනයඃ මිලියන 52ක්. සෑම 6 දෙනෙක්ගෙන් 1 අයෙක්
දුප්පත් කමින් පෙළෙන පවුල් ගණනඃ මිලියන 8.8 පවුල්වලින් (11.1%)
දුප්පත්කමින් පෙළෙන දරුවන් ගණනඃ මිලියන 15.5 වයස 18 ට අඩු දරුවන්ගෙන් 22%ක්
දුප්පත්කමින් පෙළෙන වැඩිහිටියන් (වයස 65ට වැඩි)ඃ මිලියන 3.4 වැඩිහිටියන්ගෙන් 23%ක්
කළු ජාතික ඇමරිකානු දරුවන්ගෙන්ඃ 46% ක් දුප්පත්කමින් පෙළේ
ලතින් ඇමරිකානු දරුවන්ගෙන්ඃ 40% ක් දුප්පත්කමින් පෙළේ
දුප්පත්කමඃ කළුජාතිකයන් 27.4%
දුප්පත්කමඃ ලතින් ජාතිකයින් අතර 26.6%
දුප්පත්කමඃ සුදු ජාතික ඇමරිකානුවන් 9.9%

- දරුවන්ගෙන් මිලියන 7කට කිසිදු සෞඛ්‍ය ආරක්‍ෂණයක් නැත.
- විදී දරුවන් ප්‍රමාණයඃ ලක්‍ෂ 16
- ඇමරිකානුවන් 7 දෙනෙක්ගෙන් 1 අයෙක් ආහාර මුද්දර මත යැපෙන අතර දරුවන්ගෙන් 4 දෙනෙක් ගෙන් 1 අයෙක් ආහාර මුද්දර මත යැපේ.
- කිසිදු සෞඛ්‍ය ආවරණයක් නැති ඇමරිකානුවන්ඃ මිලියන 52
- ලොව වැඩිම අපරාධ සිදුවන රට, මිනිමැරුම් දූෂණ වැඩිම රට ඇමරිකා එක්සත් ජනපදය ලෙස නම් කෙරේ.
- ඇමරිකානු වැඩිහිටියන්ගෙන් මිලියන 42 කට ලිවීමට, කියවීමට නොහැක.
- ඇමරිකානු වැඩිහිටියන්ගෙන් 5 වන ශ්‍රේණියේ මට්මට වඩා ඉහළ මට්ටමේ යමක් කියවීමට නොහැකි පිරිස මිලියන 50ක්,
- ඇමරිකාවේ නිවාස නැති ජනගහනය. 636017 (2011 දී). ඇමරිකාවේ ප්‍රාන්ත 24 ක නිවාස නැති ජනගහනය වැඩි වෙමින් තිබේ.
- රාජ්‍ය ණයඃ ඇමරිකාවේ ණයඃ ඩොලර් ට්‍රිලියන 15.77% දළ ජාතික නිෂ්පාදනයන් 102% ක්

# අධ්‍යාපනය නිදහස් කර ගැනීමට නම් මකරාක්ෂයන් ත්‍රිත්වය එකවර පැරදවිය යුතුයි!

## නලින්ද ජයතිස්ස සහෝදරයා



***නියමුවා:*** ***පසුගිය 11 වැනි දින පැවැත්වුණු සමාජවාදී ශිෂ්‍ය සංගමයේ 04වැනි ජාතික සමුළුව විසින් ඔබ එහි නව ජාතික සංවිධායක ධූරයට ඒකමතිකව පත් කරනු ලැබුවා. ඒ පිළිබඳව නියමුවා ඔබට සුභ පතනවා. සමුළුවේ සාර්ථකත්වය පිළිබඳව කතා කළොත්?***

***නලින්ද ජයතිස්ස සහෝදරයා:*** වාමාංශික ව්‍යාපාරයන් එක් එක් නියමිත කාලවලදී සමුළු පැවැත්වීම දේශපාලන සම්ප්‍රදායක්. සමාජවාදී ශිෂ්‍ය සංගමයේ 04වැනි ජාතික මහ සමුළුවට සම්ප්‍රදායෙන් ඔබ්බට ගිය ඓතිහාසික දේශපාලන වැදගත්කමක් තිබෙනවා. අප සමුළුව පවත්වන්නේ, ලෝක පරිමාණ ධනවාදයට එරෙහි අරගලය තීව්‍ර වී ඇති මොහොතක; ලාංකේය ධනපති පංතිය සිය වසර 65 ක පාලනයේ දැවැන්තම අර්බුදයේ ගිලෙමින් සිටින මොහොතක. බිඳවැටෙන ධනවාදයත් අධිරාජ්‍යවාදයත් තමන්ගේ අනිවාර්යනීය සතුරා වන නිර්ධන පංති ව්‍යාපාරය බේද භින්න කර දුබල කිරීමට විවිධ උප්පරවැට්ටි යොදන මොහොතක.
ජනතා විමුක්ති පෙරමුණ ආරම්භ කළ 1965 වසරේ සිටම ශිෂ්‍යයන් විප්ලවය සඳහා සංවිධානය කිරීම පටන් ගත්තා. 1960 දශකයේ අගවන විට දේශප්‍රේමී ශිෂ්‍ය පෙරමුණ ලෙස ජ.වි.පෙ. ශිෂ්‍ය අංශය ගොඩ නැගුණා. 1971 අරගලයේදීත් ශිෂ්‍යයන් තම පංති භූමිකාවට පණ පෙව්වා. රෝහණ විජේවීර සහෝදරයා ප්‍රමුඛ ජ.වි.පෙ. තාවකාලික මධ්‍යම කාරක සභාව විසින් 1976 දී සිරගතව සිටියදී ගනු ලැබූ තීන්දුවක් මත සමාජවාදී ශිෂ්‍ය සංගමය නමින් ජ.වි.පෙ. ශිෂ්‍ය අංශය ප්‍රතිසංවිධානය කෙරුණා. ඒ අනුව එහි පළමු සමුළුව 1980 දී පවත්වා ශාන්ත බණ්ඩාර සහෝදරයා සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන ලේකම් ධූරයට පත් කරගනු ලැබුවා. 1987-89 දේශප්‍රේමී අරගලයේදී ශිෂ්‍ය සංගමයේ නායකත්වය හා සාමාජිකත්වය දහස් ගණනින් දිවි පිදුවා. ඉන්පසු යළි ගොඩ නගන ලද සමාජවාදී ශිෂ්‍ය සංගමය 2002 හා 2008 වසරවලදී දෙවන හා තුන්වන ජාතික සමුළු පවත්වනු ලැබුවා. පසුගිය සැප්තැම්බර් මාසයේදී අපගේ පක්ෂය තුළ බලය ඇල්ලීම සඳහා අධිරාජ්‍යවාදී, අවස්ථාවාදී කුමන්ත්‍රණකරුවන් සිදුකළ උත්සාහය පිළිබඳව ඔබ දන්නවා. එහිදී මෙම කුමන්ත්‍රණය මෙහෙයවන ස්ථානය බවට ශිෂ්‍ය සංගමය පත් කර ගැනීමට ඔවුන් උත්සාහ කළා. ශිෂ්‍ය සංගමයේ නව ජාතික සංවිධායක තනතුර, මධ්‍යම පුවත් පතේ නම හා ශිෂ්‍ය සංගම් මූලස්ථානය මෙම කුමන්ත්‍රණකරුවන් සිය නිර්ලජ්ජිත අරමුණු ඉටුකර ගැනීමට යොදා ගත්තා. සමාජවාදී ශිෂ්‍ය සංගමය විසින් ගොඩ නගා ක්‍රියාත්මක කරන ලද විවිධ බහුජන පෙරමුණු අධිරාජ්‍යවාදයේ, බෙදුම්වාදයේ, අවස්ථාවාදයේ කුලීසේනාංක බවට පත් කළා. ඔවුන්ගේ අරමුණ වූයේ සමාජවාදී ශිෂ්‍ය සංගමය ජ.වි.පෙ.න් ඉවත් කර ධනපති පංතියේ, අධිරාජ්‍යවාදයේ අතකොළුවක් බවට පත් කරන්නයි. එ.ජා.ප.- ශ්‍රී.ල.නි.ප. ධනපති මර්දනයන් හමුවේත් ඉතිහාසයේ එක් එක් කාල වකවානුවල පැන නැගි අවස්ථාවාදී ද්‍රෝහී කල්ලි හමුවේත් අත් නොහැරි සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ධජය රැක ගැනීමට මෙවරත් අපට හැකිවුණා. ධනපති අළුගෝසුවන්ගේ හා අවස්ථාවාදී කුහකයින්ගේ අනේක විධ වධ බන්දන හා පාවාදීම් මැද ශිෂ්‍ය සංගමය රැක ගැනීමට එදා සිටි සහෝදරවරුන්ට හැකිවුණා වගේම මෙවරත් ඒ අභියෝගය අපි ජයග්‍රහණය කළා.
ශිෂ්‍ය සංගමයේ 04 වන ජාතික සමුළුව සාර්ථකව පවත්වා නව ජාතික සංවිධායකවරයෙක් හා 14 දෙනෙකුගෙන් සමන්විත නව ජාතික කමිටුවක්, දේශපාලන වැඩපිළිවෙළක් හා දේශපාලන යෝජනා සම්මත කර ගැනීමට හැකිවුණා. මෙය සමාජවාදී ශිෂ්‍ය සංගමය අධිරාජ්‍යවාදයේ හා බෙදුම්වාදයේ වල්ගයක් කිරීමට කුමන්ත්‍රණකාරීන් දැරූ උත්සාහය තීරණාත්මකව පරාජය කළ අවස්ථාවක්. ඒ නිසා 04 වන ජාතික සමුළුව ඓතිහාසිකයි. ජූනි 11වැනිදා නව නගර ශාලායේදී මුළුදුන් ජාතික සමුළුව අපගේ ඉදිරි වැඩ කටයුතු සඳහා නවය ජවයක් ශක්තියක් එකතු කළා. දිවයිනේ සිව් කොණින්ම විශ්වවිද්‍යාල හා පාසල් නියෝජනය කරමින් පැමිණ සිටි සහෝදර සහෝදරියන්ට අනාගත සමාජවාදී ශ්‍රී ලංකාවක් පිළිබඳ අපේක්ෂා දල්වන ලද අවස්ථාවක් බවට එය පත් වුණා. මෙවර අපගේ සමුළු තේමාව වුණෙත් "අධ්‍යාපනයේ සම අයිතිය වෙනුවෙන් - සමාජවාදය සඳහා සටන් කරමු." යන්නයි. ලෝක ප්‍රගතිශීලී ශිෂ්‍ය හා තරුණ ව්‍යාපාරයේ ලාංකේය අනුබණ්ඩය සමාජවාදී ශිෂ්‍ය සංගමය බව මෙවර සමුළුව ඔප්පු කළා. ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සමුමේලනයේ (WFDY) සභාපති දිමිත්‍රිස් පැල්මයිරිස් සහෝදරයා විශේෂ සුභපැතුම් පණිවිඩයක් එවා තිබුණා. එසේම වියට්නාමයේ හෝචිමිං කොමියුනිස්ට් තරුණ සංගමය, රුසියාවේ බෝල්ෂෙවික් තරුණ කොමියුනිස්ට් ලීගය, කියුබාවේ තරුණ කොමියුනිස්ට් සංගමය, වෙනිසියුලාවේ පාලක පක්ෂය වන එක්සත් සමාජවාදී පක්ෂයේ තරුණ අංශය වෙනිසියුලාවේ කොමියුනිස්ට් තරුණ සංවිධානය විශේෂ සුබපැතුම් සමුළුවට එක්කර සිටියා. ඊට අමතරව ස්පාඤ්ඤය, පෘතුගාලය, ජර්මනිය, එරිත්‍රියාව, කැමරූන්, ලෙබනනය, පකිස්ථානය, ඉන්දියාව යන රටවල ප්‍රගතිශීලී ශිෂ්‍ය සංවිධාන සමාජවාදී ශිෂ්‍ය සංගමයට සහෝදරත්වය එක්කර සිටියා. අප විසින් ලාංකේය භූමිය තුළ සිදුකරන අරගලයට ලෝක පරිමාණව සහයෝගය ලැබෙන බවට මෙය සාක්ෂියක්. 'ශිෂ්‍යයෝ විප්ලවයේ ගිනිසිළුව වෙති'යි කාල් ලීබ්නෙක්ට් වරක් ප්‍රකාශ කළා. ඒ අනුව දැන් අප ඉදිරියේ ඇති වගකීම නම් ජ.වි.පෙ. නායකත්වය යටතේ සමාජවාදී විප්ලවය සඳහා ලාංකේය ශිෂ්‍ය ව්‍යාපාරය සංවිධානය කිරීමයි. ඒ අභියෝගය බාර ගැනීමට අපි සූදානම්.



> මේ මොහොතේ නිදහස් අධ්‍යාපන අයිතිය රැකගැනීමේ සටන යනු අධිරාජ්‍යවිරෝධී අරගලයේ අත්‍යාවශ්‍ය කොටසක්. ඒ අනුව 'නිදහස් අධ්‍යාපනය සුරැකීමේ ජාතික ව්‍යාපාරය' ලෙස අප අධිරාජ්‍යවිරෝධී ජනතා ව්‍යාපාරය නියෝජනය කරනවා. ඒ වෙනුවෙන් ලාංකේය ශිෂ්‍ය ව්‍යාපාරය පෙළ ගස්වනවා.

***නියමුවා:*** ***මේ වන විට උසස් අධ්‍යාපනය හා පාසල් අධ්‍යාපනය මුළුමනින්ම අවුල් ජාලාවක් බවට පත් වෙලා. මේ අර්බුද ලෙහන්නට පටන් ගත හැක්කේ කොතනින්ද?***

***නලින්ද ජයතිස්ස සහෝදරයා:*** අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය මතුව ඇති අර්බුදය යනු එකිනෙකාට අන්තර් සම්බන්ධිත හේතු කීපයක එකතුවක්. පළමුව අධිරාජ්‍යවාදී මැදිහත්වීම. ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් අධ්‍යාපනයේ බර ජනතාව මත පැටවිය යුතු බවට වන කොන්දේසි දමා තිබෙනවා. දෙවනුව ආණ්ඩුවේ අධ්‍යාපනය පෞද්ගලීකරණ ප්‍රතිපත්තිය. අධිරාජ්‍යවාදය ඉදිරිපිට දණ ගසා ඇති වත්මන් රාජපක්ෂ ආණ්ඩුවත් එම කොන්දේසි අකුරටම රට තුළ ක්‍රියාත්මක කරනවා. තෙවනුව අධ්‍යාපනය භාර ඇමතිවරුන්ගේ ඔලමොට්ටල ක්‍රියා කලාපය. මේ නිසා අර්බුදය අවුල් ජාලාවක් බවට පත් කර තිබෙනවා.
මතුව ඇති අර්බුදය නිවැරදිව විග්‍රහ කර ගැනීමම විසඳුම සඳහා මූලික ප්‍රවේශයක්. ඒ අනුව රටේ සමස්තයක් ලෙස මතුව ඇති අර්බුදය අධ්‍යාපන ක්ෂේත්‍රය තුළත් දක්නට ලැබෙනවා. එයින් අධ්‍යාපනය නිදහස් කර ගැනීමට නම් අධිරාජ්‍යවාදයත් ධනපති ක්‍රමයත් රාජපක්ෂ ආණ්ඩුවත් යන මකරාක්ෂයන් ත්‍රිත්වය එකවර පැරදවිය යුතුයි. අපගේ සමුළුවේ තේමාව ලෙස "අධ්‍යාපනයේ සම අයිතිය උදෙසා-සමාජවාදය සඳහා සටන් කරමු." යනුවෙන් යොදාගන්නේ එම පුළුල් අරමුණෙන්.

***නියමුවා:*** ***මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට එරෙහි සටන නව මානයකට යොමු වූයේ, සමාජවාදී ශිෂ්‍ය සංගමය විසින් එය රජයට පවරා ගත යුතු බවට ඉදිරිපත් කරන ලද සටන් පාඨයත් සමගයි. එහි නව තත්වය කෙබඳුද?***

***නලින්ද ජයතිස්ස සහෝදරයා:*** රාජපක්ෂ ආණ්ඩුව කර පින්නාගෙන යන අධ්‍යාපනය පෞද්ගලීකරණ වැඩපිළිවෙළේ සංකේතය බවට පත්ව ඇත්තේ මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයයි. ජූනි 21 දා පාර්ලිමේන්තුවේ මේ සම්බන්ධව විවාදයක්ද පැවැත්වුණා. එහිදී එස්.බී. දිසානායක ඇමතිවරයා ප්‍රකාශකර ඇත්තේ "තවත් බොහෝ ආයෝජකයන් ශ්‍රී ලංකාවේ පෞද්ගලික විශ්වවිද්‍යාල ඇරඹීමට කැමැත්තෙන් සිටින බැවින් මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ඉදිරියට ගෙනයාම ආණ්ඩුවේ අනිවාර්ය අවශ්‍යතාවයක්" බවය.

එමනිසා නිදහස් අධ්‍යාපනය අයිතිය සුරැකීමේ අරගලයේදී මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය පැරදවීම මේ මොහොතේ අපගේ තීරණාත්මක සටනක් විය යුතුයි. ඒ සඳහා විශ්වවිද්‍යාල ආචාර්යවරු, විශේෂඥ වෛද්‍යවරු, ගුරු සංගම්, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිය සමිති ඇතුළත් පුළුල් සටන් පෙරමුණක් දැනටමත් අප ගොඩනගා තිබෙනවා. ආරම්භ කර ඇති මෙම වෛද්‍ය විද්‍යාලය නීතිවිරෝධියි. අනෙක් පැත්තෙන් බරපතළ සමාජ අසාධාරණයකට පාර කපන්නක්. නිදහස් අධ්‍යාපන අයිතිය විනාශ කරන්නක්.

අපගේ සටන් පාඨය බවට පත්ව ඇත්තේ, මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය වහා රජයට පවරා ගනු යන්නයි. හොර උපාධි කඩය වසා දමන අතර උසස් පෙළ ඉහළින්ම සමත් තවත් සිසුන් 100 - 150කට වෛද්‍යවරුන් වීමේ අවස්ථාව උදාකරදීම අපගේ ඉලක්කයි. එදා 1987 දී උතුරු කොළඹ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය රාගම වෛද්‍ය පීඨය බවට පත්කරගෙන ශිෂ්‍ය සටන් ඉතිහාසයේ නොමැකෙන සටහනක් තැබුවා. එදා ජීවිත පරිත්‍යාගයෙන් පොදු ජන අරගලයකින් සමාජගත කළ පෞද්ගලික වෛද්‍ය විද්‍යාල විරෝධී සමාජ මතවාදය පාරාජය කිරීමට බලයට පත් ආණ්ඩුවලට නොහැකිවුණා. එම පන්නරයද උකහාගෙන ලාංකේය ශිෂ්‍ය ව්‍යාපාරයට වර්තමාන අරගලයන් ජයග්‍රහණයෙන් කෙළවර කළ

15වැනි පිටුවට



"ස්වාර්ථකාමියා අන් හැමටම පෙර මිය යයි. ඔහු මෙලොව ජීවත් වන්නේ තමා සඳහා පමණකි. ඔහුගේ 'මමත්වය' පෑගූ කෙනෙහිම ඔහුට ජීවත් වීමට කිසිවක් නැත්තේය. එහෙත් මිනිසෙක් සමාජයේ වුවමනාවක් සමග ජීවත් වන විට, ඔහු සමාජය සමග එකට වෙලෙන විට, ඔහු විනාශ කර දැමීම අසීරුය."

**නිකොලෝයි ඔස්ත්‍රොව්ස්කි**

# රටවටා ජනහමු අති සාර්ථකයි



ජ.වි.පෙ. ආරම්භ කළ ජනහමු වැඩසටහන රට පුරාම ඉතා සාර්ථක ලෙස අවසන් විය. මැතිවරණ වකවානුවක් නොවුණත් එම ජනහමු සඳහා විශාල මහජන සහභාගිත්වයක් පැවති බව මෙම රැස්වීම් මාලාව පිළිබඳ සමාලෝචනයේදී අනාවරණය විය. ජ.වි.පෙ. නායක සෝමවංශ අමරසිංහ සහෝදරයා, ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරවරුන් මෙන්ම දේශපාලන මණ්ඩල සභික අනුර දිසානායක, කේ.ඩී. ලාල් කාන්ත, විජිත හේරත් සහ මධ්‍යම කමිටු සාමාජිකයින් සියලු දෙනාම මෙම රැස්වීම් සඳහා සහභාගි වූහ.

අම්පාර ප්‍රදේශයේ පැවැති එක් ජනහමුවක් ප්‍රදේශයේ විදුලිය නොමැති නිසා භූමිතෙල් ලාම්පු මගින් ආලෝකය ලබාදී රාත්‍රී 11.00 පමණ වනතුරු පැවති අතර එම රැස්වීම පවත්වා ඇත්තේ අනුර දිසානායක සහෝදරයාගේ සහභාගිත්වයෙනි. කොත්මලේ පැවති ජනහමුවකට පැමිණි ඉතාම වියපත් කාන්තාවක් ආණ්ඩුවට ඇති තමන්ගේ විරෝධය පළකර ඇත්තේ දනට නොගෙවන ගොවි විශ්‍රාම වැටුප් පාස් පොතද පෙන්වා ආණ්ඩුවේ රැවටිල්ල පැහැදිලි කරමිනි. මෙවැනි බොහෝ අත්දැකීම්වලින් පිරි මෙම සාර්ථක ජනහමු මාලාවේ ඛේදජනකම සිදුවීම වූයේ කටුවන පැවැති ජනහමුවට සිදුකළ මැර ප්‍රහාරයෙන් අභිසංක නිමන්ත සොයුරා හා මාලනී සොයුරිය අපගෙන් සමුගැනීමයි.

# මාලනී, නිමන්ත සමුගැනීම





ජූනි 15 කටුවන පමණක් නොව ප්‍රජාතන්ත්‍රවාදය අගයකරන හැම හදවතක්ම කම්පා කළ දිනයක් විය. ඒ ආණ්ඩුවේ අවසරලත් මැරයින් 18 හැවිරිදි හිරිමල් යෞවනය අවසන් කර ජීවිතය පටන් ගැනීමට උත්සාහ කළ නිමන්ත සොයුරා සහ තිදරු මවක වූ මාලනී සොයුරිය දැයට අහිමි කළ දිනය නිසාය. රාජ්‍ය ආරක්ෂාව උපරිමයට තර කර ඇති අධි ආරක්ෂිත කලාපය මැදමුලනට මායිම්ව පිහිටා ඇත්තේය. නමුත් මැදමුලනේ අවසරලත් මැරයින් පැමිණියේ ටී.56 ගිනි අවි සහිතව නිදැල්ලේය. 'ජනතාව පෙළෙන පාලනයට එරෙහි' ජනහමු මාලාවේ තවත් ජනහමුවක් පැවැත්වූයේ බස්නාහිර පළාත් සභා මන්ත්‍රී නලින්ද ජයතිස්ස සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් කටුවන ගොඩැල්ලපිටිය ප්‍රජාශාලාව අසලදීය. මැරයින්ට නියෝග ලැබී තිබුණේ කවුරුන් හෝ බිලි ගැනීමටය. ඒ ජ.වි.පෙ. හඬ වැසීමටය. අවසානයේ ඔවුන්ගේ ගිනි අවියට යටත්වීමට සිදුවූයේ මාලනී මැණියන්ට සහ තුරුණු නිමන්තටය. ඔවුන් පසුගියදා දයෙන් සමුගත්තේ මැර දේශපාලන සංස්කෘතිය මෙන්ම මැරයින් රකින දේශපාලුවන්ද මේ බිමෙන් තුරන් කිරීමේ වගකීම සෑම ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන්නෙකුටම භාර කරමින්ය.

# රාජ්‍ය බැංකු රැකගැනීමට දූෂණ විරෝධී හඬ අල්ලස් කොමිසමට



ජාතික ඉතිරිකිරීමේ බැංකුව සතු මහජන තැන්පතු මුදල් යොදවා පාඩු ලබන 'ද ෆිනෑන්ස් සමාගමේ' කොටස් වැඩි මිලට මිලදී ගැනීමට එරෙහිවත් මහජනතාවගේ මුදල් බැංකු ප්‍රධානීන්ට හිතුමතේ තීන්දු ගෙන දූෂණයට ලක්කිරීමට එරෙහිවත් 'දූෂණ විරෝධී හඬ' අල්ලස් දූෂණ කොමිසමට පැමිණිලි කළ අතර, ඒ පිළිබඳව පරීක්ෂණ සඳහා කරුණු ඉදිරිපත් කිරීමට පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති හා නීතිඥ සුනිල් වටගල සහෝදරයා ඇතුළු දූෂණ විරෝධී හඬ නියෝජිතයින් පිරිසක් අල්ලස් හෝ දූෂණ කොමිසමට ගියහ. එහිදී අදහස් දක්වූ 'දූෂණ විරෝධී හඬ' නියෝජිතයින් කියා සිටියේ, ඉදිරියේදීත් මෙවැනි දූෂණයට එරෙහිව නීතිමය වශයෙනුත් ජනතාව සංවිධානය කරමිනුත් ක්‍රියාත්මක වන බවයි.

මීට පෙරද රාජපක්ෂ ආණ්ඩුව රාජ්‍ය බැංකු විනාශ කිරීම සඳහා ගෙනෙන ලද පනතක්ද පාර්ලිමේන්තුව තුළදී ආපසු හැරවීමට ජ.වි.පෙ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කටයුතු කළහ. එදා එසේ නොකරන්නට මේ වනවිටත් ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව රාජ්‍ය මූල්‍ය ක්‍රියාවලියට මැදිහත් නොවන බැංකු බවට පත්වී අවසානය.

කෙසේ වෙතත් නීතිමය ක්‍රියාමාර්ග මගින් මෙවැනි කටයුතු යම් තාක් දුරකට පාලනය කළ හැකි නමුත් මෙවැනි තත්වයන් සහමුලින්ම පරාජය කිරීම සඳහා ජනතා පෙළගැස්මක් අත්‍යවශ්‍ය වේ. ඒ වෙනුවෙන් ඉතා කෙටි කාලයක් තුළ වුවද දූෂණ විරෝධී හඬ සංවිධානය සුවිශාල මැදිහත්වීමක් කර ඇති අතර එම බොහෝ රාජ්‍ය ආයතනවල ප්‍රධානීන්ගේ මෙන්ම ඔවුන්ට වගකියන දේශපාලනඥයන්ගේද උදහසට දූෂණ විරෝධී හඬ සංවිධානය පත්ව තිබේ. එය එහි සාර්ථකත්වය ප්‍රකාශයට පත්කරන එක් සාධකයකි. කුමන හෝ ආයතනයක එවැනි වංචා හෝ දූෂණයක් සිදුවන්නේ නම් ඒ වෙනුවෙන් මැදිහත් වීමට දූෂණ විරෝධී හඬ සංවිධානය නිරතුරුව කටයුතු කරන බවද එහි නියෝජිතයෝ සඳහන් කරති.

# මැරයෝ රකින මැරයෝ කටුවනදී කොටුකරති



ජුලම්පිටියේ අමරේ මැරයින් රකින මැරයෙකි. අමරේද මැරයෙකු වුවත් ඔහු රැකුණේ සන්ධාන ආණ්ඩුවේ නිලබලය සහිත මැරයින්ගෙනි. අමරේම ප්‍රකාශ කර ඇති පරිදි ඔහු "මැදමුලනේ කටු කන බල්ලෙකි". අමරේගෙන් රැකුණේ රාජපක්ෂවරුන් බව දන් මුළු රටම දන්නා කරුණකි. 2002 දී තංගල්ල අධිකරණය යටත් කළ අමරේ රැකගන්න ආවේ එවකට විපක්ෂ නායක මහින්ද රාජපක්ෂය. ජුලම්පිටියේ අමරේ කටුවන හොල්ලාගෙන මැරකම් හා සල්ලාලකම් කළේ ඒ රාජ අනුග්‍රහයේ බලයෙනි.

නීතියද අමරේට යටවිය. විවෘත වරෙන්තු සහිත අමරේ මිනීමැරුවේද, මංකොල්ල කෑවේද විවෘතවමය. වරෙන්තු සහිත මැරයින් දකුණේදී අවුරුදු උත්සවවල සිංදු කියා වර්ණවත් කළේ පොලිස් ආරක්ෂාව ඇතිවය. අවසානයේදී සංවිධානාත්මක ජන බලයට සියල්ල යටත් බව ඔප්පු කළේ ජ.වි.පෙ. විසින්ය. අමරේ අමරේලාගේ වර්ගයේ අන්තිමයාද නොවන බව පැහැදිලිය. කටුවනදී හා කොළඹ කොටුවේදී පසුගියදා ජ.වි.පෙ. දවැන්ත පා ගමනක් සහිත ජනතා උද්ඝෝෂණයකින් විරෝධය පළ කළේ අමරේට විතරක් නොවේය. අමරේලා බිහිකරන ජඩ දේශපාලනයද පරාජය කර අවම වශයෙන් පවතින නීතියටද අනුව ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වියයුතු බව රටට කියාදීමටය. මේ ඒ සඳහා පෙළගැසුණු බිය පරාජය කළ ජනතා විරෝධයය.

# ආත්මාර්ථකාමී වෙන්නෙ හිතුවක්කාරකමටද?



මිනිසා ස්වභාවයෙන්ම සමූහික බවත් සමාජ සංවර්ධනයේ එක් මොහොතකදී මතු වූ පෞද්ගලික දේපළ අයිතිය විසින් ඔහු තුළ පෞද්ගලික දේපළ මානසිකත්වයක්, ආත්මාර්ථකාමිත්වයක්, ඇති කළ බවත් අපි පසුගිය සතියේදී සාකච්ඡා කළෙමු.

මිනිසාගේත් මිනිස් සමාජයේත් සමාජ ලක්ෂණය වූ සාමූහිකත්වයත් පසුකාලීනව පැන නැගුණ ආත්මාර්ථකාමීත්වයත් අතර බරපතළ ප්‍රතිවිරෝධයක් සහ බරපතළ ගැටුමක් පුද්ගලික දේපළ අයිතිය රජකරන සැම සමාජයකදීම පැවති සහ පවතින අතර එමගින් ඇතිකරන පීඩනයෙන් අපි දෛනිකව පීඩා විඳිමින් සිටිමු.

මිනිසා ස්වභාවයෙන්ම සාමූහික වුවත් පවත්නා පෞද්ගලික දේපළ ආධිපත්‍යය විසින් ඔහු ආත්මාර්ථකාමී පුද්ගලයකු බවට පත් කර තිබේ. උපතේ සිට එකී ආත්මාර්ථකාමිත්වය ගොඩනැංවීම ආරම්භ කරනු ලබන අතරම දෛනික සමාජ ජීවිතයේදී එය නඩත්තු කරනු ලබයි. තමා හිසට තම අත මිස අන් සෙවනැල්ලක් නොමැති බවත් පළමුව තමන් හැදිය යුතු බවත් සමාජය විසින් අපට උගන්වනු ලබයි. අනෙකා පරයා ඉහළට නැගීමේ තරගයත් තම පරමාර්ථයන්ම ඉටු කර ගැනීමේ උපකරණ ලෙස පමණක් වෙනත් මිනිසුන් දෙස බැලීමේ මානසිකත්වයත් විසින් පුද්ගලයා හසුරුවනු ලබයි.

එහෙත් අනෙකා පරයා ඉහළට නැගීමට නම් අනෙකා සිටින්නේ කොහෙද? මේ සමාජයේමය, සමාජයෙන් පරිබාහිරව ඔහුට අනෙකෙකු හමු නොවේ. ඉන් කියවෙන්නේ යමෙකුට ආත්මාර්ථකාමී ලෙස වුවද හැසිරීමට සිදුවන්නේ සමාජය තුළදීම වන බවයි. ඕනෑම අයකුට සිය පෞද්ගලික අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගැනීමට සිදුවන්නේ සමාජය තුළදීය. සමාජ භාවිතයේදීමය.

එවිට එක් එක් පුද්ගලයා සිය පටු ආත්මාර්ථකාමී අභිමතාර්ථයන් මුදුන් පමණුවා ගැනීම අරමුණු කර ගනිමින් සමාජය තුළ හැසිරේ. එවිට එකිනෙකාගේ පෞද්ගලික වුවමනාවන් එකිනෙක ගැටෙන අතර එය පොදු සමාජීය පැවැත්මේ වුවමනාවන් සමගද ගැටුමකට මුලපුරයි. ඒ නිසා බොහෝ පෞද්ගලික අභිමතාර්ථයන් වැඩි වශයෙන්ම හරියටම අදහස් කරන ලද දෙයට වෙනස්, බොහෝ විට හරියටම විරුද්ධ ප්‍රතිඵල ජනිත කරන බව පෙනේ. එවිට කාටත් සාමූහික නොවීමේ ආදීනව වැටහෙන්නට පටන් ගනී. ඒ පිළිබඳව මහා අඳෝනාවක් නගන්නට පටන් ගනී.

සමාජීය ජීවිතයේදී විශාල ජනකණ්ඩායම්වලට පොදු අවශ්‍යතාවන් මතු වේ. එවිට එකී අවශ්‍යතාවය විසින් වඩා පොදු භාවිතයකට එකී ජනකණ්ඩායම් කැඳවනු ලැබේ. ඒ සඳහා විවිධ සමාජ සංවිධාන පිහිටුවා ගන්නා අතර එමගින් වඩා පොදු ක්‍රියාකාරිත්වයකට ඔවුන් කැඳවනු ලැබේ. එහෙත් ඒ අතරම එවැනි සංවිධාන තුළ ද පෙරකී පටු ආත්මාර්ථකාමිත්වය ඉස්මතු වීමට දඟලන අතර ඒවා වළක්වා ගැනීම සඳහා විවිධ එකඟතාවන් ව්‍යවස්ථා නීතිරීති පැනවීම හා පනවා ගැනීමට සිදුවේ. එහෙත් ඒවාද කඩා බිඳදමමින් පුද්ගලික වුවමනාවන් ඉදිරියට පැමිණේ. කල්යාමේදී ඉතාම පටු ආත්මාර්ථකාමීත්වය තුළ තමන්ට කිසිවක්ම ලබා ගැනීමට නොහැකිය යන අවබෝධයට එළඹෙන අතර තම පටු පෞද්ගලික අභිමතාර්ථයන් කිසියම් යළි සකස් කර ගැනීමක් යම් පමණකට කැප කිරීමට බලකෙරෙන තත්වයක් ඇති වේ. එවිට පුද්ගලයා එපමණක් දුරට පමණක් පරාර්ථකාමී වේ. සාමූහික වේ. යළිත් පටු ආත්මාර්ථකාමිත්වය නැමති අයිස් වතුරේ ගිලේ.

පෞද්ගලික දේපළ ක්‍රමයක් සහිත, පෞද්ගලික දේපළ මානසිකත්වක් සහිත සමාජයකදී අපට සෑම පුද්ගලයකුගෙන්ම එකසේ සාමූහික හැසිරීමක් සාමූහික සිතීමක් බලාපොරොත්තු විය නොහැකිය. පොදු දෙය වන්නේ ආත්මාර්ථකාමිත්වයයි; චපල බවයි. සාමූහිකත්වය පොදු දෙය බවට පත් වන්නේ සමාජීය දේපළ, පොදු දේපළ සහිත සමාජයකදී පමණි. කොමියුනිස්ට් සමාජයේදී පමණි.

එසේ නම් පවත්නා කොන්දේසි යටතේ වුවද ආත්මාර්ථකාමිත්වය සාධාරණයයි අපට ප්‍රකාශයට පත් කළ හැකිද? නොහැකිය. එහෙත් ඒ අතරට මිනිසා ආත්මාර්ථකාමී වී ඇත්තේ, හුදෙක් ඔවුන්ගේ වුවමනාව විසින් නොව පෞද්ගලික දේපළ අයිතිය විසින් බලකරනු ලැබූ තත්වය යටතේය යන්නත් අවබෝධ කරගැනීමට අප සමත් විය යුතුය. එවිට ආත්මාර්ථකාමිත්වයෙන් තොර, සාමූහිකව සිතන, සාමූහික ක්‍රියාකාරිත්වයක් ධනේශ්වර ක්‍රමය තුළදී අපට බලාපොරොත්තු විය නොහැකිද? නැත. එවැනි සාමූහික ක්‍රියාකාරිත්වයක් බලාපොරොත්තු විය හැකිය. එහෙත් එය පොදු දෙයක් ලෙස නොව විශේෂයක් ලෙසටය.

> සාමූහික සිතීමක් සහිත සාමූහික භාවිතයක් අපට බලාපොරොත්තු විය හැක්කේ මෙකී ව්‍යාපාරවල පමණි. සෑම විප්ලවවාදී පක්ෂයක්ම අනාගත සමාජයේ අංග ලක්ෂණ කලල ස්වරූපයෙන් තම ව්‍යාපාරය තුළ ගොඩ නගා ගනී. අනාගත කොමියුනිස්ට් සමාජයේ සහෝදරත්වය, සාමූහිකත්වය, සමානත්මතාව ආදී ලක්ෂණ මේවා තුළ කලල ස්වරූපයෙන් පවතී. අද එය පොදු දෙය නොව විශේෂයකි. එහෙත් හෙට එය සමාජ සම්ප්‍රදාය වන්නේය.

අපි මෙය තවත් පැහැදිලි කර ගනිමු.

ධනේශ්වර ක්‍රමය සිය ක්‍රමයේ වර්ධනයේ සවභාවය විසින් විද්‍යාවේ හා තාක්ෂණයේ ඇති කළ වෙනස්කම් මගින් නිෂ්පාදනය උපරිම වශයෙන්ද සමාජමය කිරීමත් සමගම සාමූහික දේපළ ක්‍රමයත් සහිත සමාජයක් බිහිවීමට අවශ්‍යකරන වාස්තවික තත්වයන් නිර්මාණය කර දී තිබේ. ධනේශවර ක්‍රමයට ආවේණික ප්‍රතිවිරෝධතා විසින් (එනම් නිෂ්පාදනය උපරිම වශයෙන් සමාජමය කර තිබීමත් නිෂ්පාදනයේ අයිතිය පෞද්ගලික වීමත් අතර ඇති ප්‍රතිවිරෝධය විසින්) එය අර්බුදය කරා ගෙනගොස් ඇත. එකී ප්‍රතිවිරෝධය විසඳිය හැක්කේ, නිෂ්පාදනයේ අයිතියද සමාජමය කෙරෙන පොදු දේපළ ක්‍රමයක් ගොඩ නැගීම මගින් පමණකි. සමාජ සංවර්ධනයේ තර්කානුකූල හා අනිවාරනීය ඉදිරි පියවර එයයි. ධනේශ්වර ක්‍රමය පෙරළා දමා පොදු දේපළ ක්‍රමයක් සහිත සමාජ සංවර්ධනයේ මීළඟ අවධිය ගොඩ නැගීම අරමුණු කර ගත් ව්‍යාපාරයන් ලොව පුරා බිහිවී ඇති අතර රටවල් ගණනාවක සමාජවාදී විප්ලවයද ජයග්‍රහණය කර තිබේ. මෙකී ව්‍යාපාරයන් යනු නිර්ධන පංතික විප්ලවවාදී පක්ෂය.

අප ඉහතින් කථා කළ ආකාරයේ සාමූහික සිතීමක් සහිත සාමූහික භාවිතයක් අපට බලාපොරොත්තු විය හැක්කේ මෙකී ව්‍යාපාරවල පමණි. සෑම විප්ලවවාදී පක්ෂයක්ම අනාගත සමාජයේ අංග ලක්ෂණ කලල ස්වරූපයෙන් තම ව්‍යාපාරය තුළ ගොඩ නගා ගනී. අනාගත කොමියුනිස්ට් සමාජයේ සහෝදරත්වය, සාමූහිකත්වය, සමානත්මතාව ආදී ලක්ෂණ මේවා තුළ කලල ස්වරූපයෙන් පවතී. අද එය පොදු දෙය නොව විශේෂයකි. එහෙත් හෙට එය සමාජ සම්ප්‍රදාය වන්නේය.

එබැවින් ධනේශ්වර සමාජයේදී පටු ආත්මාර්ථකාමිත්වයෙන් මිදුන සාමූහික සිතීමක් සහිත සාමූහික භාවිතයක් අපට හමුවන්නේ සහ එලෙස පැවතිය හැක්කේ නිර්ධන පංතික විප්ලවවාදී පක්ෂ තුළ පමණි. සමාජ ව්‍යාපාරයකින් පරිබාහිරව එවැනි භාවිතයක් හෝ සම්ප්‍රදායක් බලාපොරොත්තු විය නොහැකිය. එවැන්නක් පැවතිය නොහැකිය.

මෙකී සමාජ ව්‍යාපාරයන් සමස්ත සමාජය මත සිය බලපෑම පතුරුවා හැරීමට උත්සාහ දරන අතර තම පටු පෞද්ගලික ආත්මාර්ථකාමී අරමුණුවලින් මිදී පොදු සමාජ භාවිතයකට ජනතාවට ආයාචනා කරයි. අනාගත සමාජයේ උත්තුංග ලක්ෂණයන් තමන් තුළම කලල ස්වරූපයන් ගොඩනගා ගනිමින් ඒ පිළිබඳව ජනතාව තුළ පුළුල් ප්‍රචාරයක් ගෙනයයි.

මාක්ස් ට්‍රිර් විදුහලෙහි අවසාන විභාගයේදී ලියූ වෘත්තියන් තෝරාගැනීමේදී තරුණයකුගේ සංකල්පනා නමැති රචනයේදී මෙසේ ලියා තිබුණි.

**" මිනිස් සංහතියට සේවය කිරීම පිණිස උපරිමය වශයෙන් අපට සේවය කළ හැකි ක්ෂේත්‍රයක අපි වෘත්තියක් සොයාගනිමු නම් එහි බර විසින් අපි වෙහෙසට පත් නොවීමු. මක්නිසාද යත් එය සියලු දෙනා සඳහාම කරන සේවයක් බැවිනි. එවිට අප විඳින ප්‍රීතිය සංවේග දායී සීමා සහිත ආත්මාර්ථකාමී එකක් නොවනු ඇත. අපේ ප්‍රීතිය කොටි සංඛ්‍යාත පොදු ජනතාවට අයත් වනු ඇත."**

සමස්ත මානව වර්ගයාම ඉලක්ක කරගත් සමාජ ව්‍යාපාරයකදී පුද්ගලයා මෙහෙයවන බලය වන්නේ හුදු දේපළ සඳහා වන ආශාව හෝ පටු පෞද්ගලික අභිමාර්ථයන් නොවේ. පරමොදර්ශී අරමුණු, සත්‍යය සහ සාධාරණත්වය පිළිබඳ උදයෝගයයි.



ඇත්තේ එක් සැබෑ සුබෝපභෝගීත්වයක් පමණි. එය නම් මානව සබඳතා නමැති සුබෝපභෝගිත්වයයි.

**ඇන්ටොයින්ද සෙන්ට් එක්ස්යුපෙරි**



# කලාවේ යථාර්ථවාදය බිහිවෙයි!

කලාවේ රොමැන්ටික්වාදී ප්‍රවණතාවයට වෙනස්ව හා ඊට අභියෝගයක් ලෙස බිහි වූ ප්‍රවණතාවය වූයේ යථාර්ථවාදයයි. ධනවාදය සමාජ ක්‍රමයක් ලෙස නිෂ්පාදනයේ වේගවත් සංවර්ධනයක් හා පෙරළියක් ඇති කළේය. ඊට සමගාමීව හා ඒ සඳහා නිෂ්පාදන උපකරණවලද ඒ වෙනුවෙන් විද්‍යාවේද තාක්ෂණයේද දැනුමේද පෙරළියක් කළේය. ඒ නිසාම තර්කාණුකූලව සිතීමට මිනිසා පොළඹවාලීය. අනෙක් අතට ධනවාදයේ අර්බුදයද මේ සමගම වර්ධනය විය. ඇති නැති පරතරය වැඩි වීම, සූරාකෑම, පීඩනය ජනතාවට දැනෙන්නට විය. සමාජය තුළ තමන් මූණපා ඇති ඛේදවාචකය දෙස ගූඪවාදී ලෙස නොව යථාර්ථවාදී ලෙස බැලීමට මිනිසාට බල කළේය. කලාව හා සාහිත්‍ය තුළ යථාර්ථවාදය (Realism) මතවාදයක් ලෙසත් ඒ සමගම විවේචනාත්මක යථාර්ථවාදී රීතිය නමින් කලාවේ විචාර රීතියකුත් බිහිවූයේ මෙවැනි තත්වයක් තුළය.

**යථාර්ථවාදය කුමක්ද?**

ඒ වන විට කලාව තුළ පැවති 'කලාව කලාව සඳහාය' යන අදහසත් රොමැන්ටික්වාදයේ තිබූ හේතුඵල සම්බන්ධයක් නැති යථාර්ථවාදී නොවන ස්වරූපයත් ගූඪවාදයත් යථාර්ථවාදය මගින් බැහැර කරන ලදී. අභව්‍ය සිදුවීම්වලින් පිරුණු මනඃකල්පිත කථාවක් වෙනුවට පවතින සමාජ යථාර්ථයන් හා එහි හරයන් සෞන්දර්යාත්මකව ඉදිරිපත් කිරීම යථාර්ථවාදී සම්ප්‍රදායේ අරමුණ විය. යථාර්ථවාදී සම්ප්‍රදාය ගරු කළ ආරම්භක සාහිත්‍යකරුවකු වූ ලියෝ තෝල්ස්තෝයි සාහිත්‍ය කෘතියක් තුළ අඩංගු කර ගතයුතු මූලික කරුණු තුනක් අවධාරණය කළේය. ඒ තුළ යථාර්ථවාදී සම්ප්‍රදායේ ලක්ෂණ ප්‍රකට වේ. ඒවා නම් 1. නවතාවය - එනම් මිනිස් වර්ගයාට ප්‍රයෝජනවත් වන චින්තාවලියක් කෘතියෙහි අඩංගුව හා බැඳී තිබීම. 2. පැහැදිලි බව - එනම් කෘතියෙහි අන්තර්ගත කරුණු මිනිසුන්ට තේරුම් ගත හැකි, පැහැදිලි බවකින් යුක්ත වීම. 3. අවංක බව - එනම් නිර්මාණකරුවා සවකීය නිර්මාණය කිසිදු බාහිර බලපෑමකින් තොරව අභ්‍යන්තර අභිප්‍රේරණයක ප්‍රතිඵලයක් ලෙසින් ඉදිරිපත් කිරීමයි. යථාර්ථවාදී සම්ප්‍රදාය සාහිත්‍ය ක්ෂේත්‍රය තුළ මෙන්ම මේ යුගයේ චිත්‍ර මූර්ති, නාට්‍ය වැනි කලාවන් තුළද පැවතිණි.

**යථාර්ථවාදයේ පුරෝගාමීන්**

යථාර්ථවාදී කලා සම්ප්‍රදාය බිහි කළ අය අතර රුසියානු සාහිත්‍යකරුවන්ට විශේෂ තැනක් හිමිවේ. ලියෝ තෝල්ස්තෝයි (යුද්ධය හා සාමය, ඇනා කැරනිනා) ඇන්ටන් චෙකෝෆ් (බල්ලා කැටුව යන කාන්තාව, හයේ වාට්ටුව) නිකොලෝයි ගොගොල් (මළ මිනිස්සු, හිම කබාය) යන අය මෙහිදී කැපී පෙනේ. ලියෝ තෝල්ස්තෝයි සිය කෘති මගින් කලක් ගෞරවයට පාත්‍රව තිබූ රදල ප්‍රභූ සමාජය ධනවාදය හමුවේ කඩා වැටෙන ආකාරයත් එකී ප්‍රභූ සමාජයේ අභ්‍යන්තරයේ වන කුහකකම් ඇතුළු මිනිස් ස්වභාවයනුත් නිරූපනය කළේය. ගොගොල් සිය 'මළ මිනිස්සු' නම් නවකථාව මගින් රුසියාවේදී මිනිසුන් මුදල් ඉපැයීමට අනුගමනය කළ මානවවිරෝධී ක්‍රියාමාර්ගත් පැරණි සමාජය හා නව සමාජය අතර ගැටුමත් නිරූපණය කළේය. ගොගොල්ගේ කෘතියේ සඳහන් මියගිය වහලුන්ගේ නම් විකුණා මුදල් සෙවීම වර්තමානයේ 'බල්ලො මරා හෝ සල්ලි සෙවීම' හා ඉතාම ගැලපී තිබේ.

එසේම ප්‍රංශයේ බල්සාක්, ගීද මෝපසාං (ඉටි බෝලය, පරොං මහතා) හා ස්ටැන්දුල් ද එක්සත් ජනපදයේ මාක් ට්වේන් විලියම් සීන් හොවෙල්ස්, හෙන්රි ජේම්ස් හා එංගලන්තයේ ජෝර්ජ් එලියට්, චාල්ස් ඩිකන්ස් (ඩේවිඩ් කොෆර්පීල්ඩ්, ඔලිවර් ට්විස්ට්, දෙනුවර අන්දරය) විලියම් කැනරේ ආදීහු යථාර්ථවාදී සම්ප්‍රදායේ ආරම්භක ප්‍රබලයෝ වූහ. මේ පිළිබඳ විවිධ විවාද ඇතත් ලංකාවේදී මාර්ටින් වික්‍රමසිංහ (ගම්පෙරළිය, කලියුගය, යුගාන්තය,) වැන්නනෝද මෙම යථාර්ථවාදී සම්ප්‍රදාය අනුගමනය කළ අය වූහ. පොදුවේ යථාර්ථවාදී සම්ප්‍රදාය තුළ සමාජීය සිදුවීම් හුදු අහම්භයක් ලෙස, පුද්ගල ස්වභාවයක් ලෙස විස්තර කරනවා වෙනුවට ඒවා පැවති සමාජ ආර්ථික යථාර්ථයන් සමග හා සමාජ පරිණාමය තුළ වන වෙනස්කම් ලෙස ඉදිරිපත් කල අතර ඒවා තර්කානුකුල හා යථාර්ථවාදී විය.

**යථාර්ථවාදී විචාර කලාවක්**

කලාවේ යථාර්ථවාදී සම්ප්‍රදායට සමගාමීව කලා විචාරයක්ද බිහි විය. එය හැඳින්වූයේ විවේචනාත්මක යථාර්ථවාදී රීතිය නමිනි. රුසියාවේ ප්‍රගතිශීලී චින්තකයින් වන බෙලින්ස්කි(1811-1847), චර්නිෂෙව්ස්කි, දොබ්රල් යුබොව් මෙහි පුරෝගාමීහු වූහ. මෙය යථාර්ථවාදී කලා සම්ප්‍රදාය විචාර කලාවක් දක්වා දියුණු කිරීමක් විය. මෙම විචාර කලාව රුසියාවේ සාහිත්‍ය කලාවට මෙන්ම ලොව බොහෝ රටවල සාහිත්‍ය කලාවට විශාල බලපෑමක් කළේය. හංගේරියානු ජාතික මාක්ස්වාදී විචාරකයකු වූ ජෝර්ජ් ලූකාෂ් විසින් බෙලින්ස්කි, චර්නිෂෙව්ස්කි, දොබ්රල් යුබොව් ගැන කරනු ලැබ ඇති පහත සඳහන් ප්‍රකාශයෙන් එය පැහැදිලි වේ. "**දැනුවත්ව හෝ නොදැනුවත්ව 'කලාව කලාව සඳහාය' යන සංකල්පය අගේ කොට සැලකුවාවූ සමකාලීන සෞන්දර්යවාදී විචාරකයින් සමග බෙලින්ස්කි, චර්නිෂෙව්ස්කි, දොබ්රල් යුබොව් යන තිදෙනා දැඩි සටනක නියැලුනෝය. එකී සෞන්දර්වාදීහු කලාත්මක පරිසමාප්තිය පිළිබඳ චින්තනය සමාජ තත්වයේ යථාර්ථ නිරූපනයෙන් වෙන් කොට සැලකීමටත් සාහිත්‍ය කලා සමාජ අරගලයෙන් පරිබාහිර, එයින් නොකෙළසුව මනා වස්තූන් ලෙස සැලකීමටත් යත්න දැරූහ. මේ මතවලට පටහැණිව යමින් මොවුන් තිදෙනා සාහිත්‍යයත් සමාජයත් අතර පවත්නා සම්බන්ධය කෙරෙහි විශේෂ අවධානය යොමු කළෝය. කලාත්මක සුන්දරත්වයේ නිර්ණායක ජීවිතය මිස අනෙකක් නොවන බව මොවුහු සැලකූහ. මොවුන් සිතුවේ කලාව ජීවතය පදනම්කරගෙන ජීවිතයම නිර්මාණාත්මක ලෙස ප්‍රතිනිර්මාණය කිරීමෙන් පහළ වන්නක් බවය. කලාත්මක පරිසමාප්තියේ නියම මාපකය වනාහී මෙම ප්‍රතිනිර්මාණය අතින් පෙනෙන ගැඹුර සහ සත්‍යතාව බව මොවුන්ගේ මතය විය.**"



මෙලෙස රොමැන්ටික්වාදී අද්භූත සංකල්ප වෙනුවට ජීවිතයේ යථාර්ථය සෞන්දර්යයට නැගීම කලාවේ කාර්‍යය බව යථාර්ථවාදී රීතිය අනුගමනය කළ අය විශ්වාසකරමින් ඒ වෙනුවෙන් කටයුතු කරද්දී 1848 කොමියුනිස්ට් ප්‍රකාශනය එළිදකිමින් ඒ මගින් ධනේශ්වර ක්‍රමය පිළිබඳව කළ ඉතාම නිරවුල්, ඉතාම නිවැරදි හා සාරාංශගත විග්‍රහයද කලාව තුළට මතවාදී බලපෑම් කළේය.

**ජීවිතයෙන් පලායෑම**

ධනවාදය අර්බුදයෙන් අර්බුදයට යමින් මිනිස් ජීවිතවල සියලු වටිනාකම් විනාශකර දමද්දී ඒතුළ මිනිසා අත්විඳින දුක්ඛිත තත්වය විසින්ම මිනිසා විවිධ ප්‍රවණතාවන්ට පොළඹවනු ලැබූහ. සමහරු ජීවිතයෙන් පලා-ගොස් හුදකලා වීමටත් තවත් අය පරාජය වින්දනයක් බවට පත්කොට ඒතුළ ජීවත්වීමටත් තවත් අය ජීවිතයේ නොලැබෙනදේ සිහින ලෝක තුළ ලබා ගැනීමටත් ජීවිතයේ ප්‍රතිවිරෝධය ෆ්‍රොයිඩ්ගේ මනෝවිද්‍යාව හරහා තේරුම් ගැනීමත් ආදී විවිධ ප්‍රවණතාවන්ට ගොදුරුවූහ. එම සමාජය තුළ ඇතිවූ එම විවිධ ප්‍රවණතාවන් කලාව තුළද විටින් විට මතුවිය. සමාජයෙන් හුදකලාවූ පුද්ගලයින් ලෙස ජීවත්වීමේ, සමාජ සම්ප්‍රදායන් නොසලකා ජීවත්වීමේ 'සංදෘෂ්ටිකවාදය' නමින් ප්‍රචලිතවූ මෙම ප්‍රවණතාවය කිසියම් වූ ප්‍රමාණයකින් පවතිනා ඇල්බෙයා කැමුගේ 'පිටස්තරයා' මේ පිළිබඳව උදාහරණයක් ලෙස සලකනු ලබයි. දෙවන ලෝක යුද්ධයේ පරාජයෙන් පසු ජපානය තුළද මේ ප්‍රවණතාව පැවතිණ.

එසේම පරාජිතවාදය හෙවත් පරාජිතයා උත්කර්ෂයට නැංවීමද පරාජය විඳිමේ ප්‍රවණතාවක්ද ඉහත සංදෘෂ්ටිකවාදය සමග අතිනත ගෙනම පවතින්නට විය. මාර්ටින් වික්‍රමසිංහගේ 'විරාගය' එවැනි කෘතියක් ලෙස සැලකූ අතර එහි ප්‍රධාන චරිතය වූ අරවින්ද පරාජිත තරුණයාගේ සංකේතය විය. ලංකාවේ ගීත සාහිත්‍යය තුළද මෙම පරාජිතවාදය පැවැතිණි. මෙයට අමතරව ජපානයේ කාම ප්‍රබන්ධ සාහිත්‍යයත් බිහිවිය. මෙය එක්සත් ජනපදය තුළද පැවතිණ. ජපාන කාම කථා සාහිත්‍යයේ බලපෑම ලංකාවටද තිබුණ අතර සිරි ගුණසිංහගේ 'සෙවනැල්ල ', ගුණදාස අමරසේකරගේ 'යළි උපන්නෙමි'ද ඊට උදාහරණ ලෙස සලකන ලදී. පසුකලෙක පශ්චාත් නූතනවාදී සාහිත්‍ය විචාරයන්ද ඉන්ද්‍රජාලික යථාර්ථවාදය නම් ප්‍රවණතාවක්ද කලාව තුළ විශේෂයෙන් සාහිත්‍ය තුළ ඇතිවිය.

මෙලෙස විවිධ ප්‍රවණතා මධ්‍යයේ ධනවාදය තුළ කලාව වර්ධනය වෙද්දී එහි තිබූ ප්‍රධාන කරුණ වූයේ ධනවාදය කලාව තුළ ප්‍රාග්ධන වුවමනාව සඳහා, තම පංති වුවමනාව සඳහා දැනුවත්ව යොදා ගැනීමය. සියල්ල වෙළඳපොළ භාණ්ඩ බවට පත්කළ ධනවාදය තුළ කලාවද භාණ්ඩ බවට පත්කරන ලදී. එයට සැබෑ අභියෝග එල්ලවූයේ මාක්ස්වාදයේ දාර්ශනික මගපෙන්වීම සහිතව නිර්ධන පංති කලාවක් සඳහාවූ මතවාදය විසිනි. එහෙත් ධනවාදය තුළ කලාව තම ග්‍රහණයටත් ආධිපත්‍යයටත් නතුකරගත් ධනපති පංතිය එය ධනවාදයට ගැලපෙන මිනිසෙක් නිර්මාණය කිරීම සඳහා යොදාගනු ලැබුවේ කලාකරුවා මුදලට ගනිමිනි.

ධනවාදය තුළ කලාවට අත්වූ ඛේදජනක තත්වය පිළිබඳවත් ඊට එරෙහිව සමාජවාදී කලාවක් සඳහා ඇතිවූ අරගලය පිළිබඳවත් මීළඟට කථා කරමු.

ඔව් ඇත්තමයි
ජේක්ෂක සංගම් බිහිවෙයි
විප්ලවයට පවා
අපි ටිකක් දැඩිව හිතමු
මා ගයන්නේ මොන කවියද?
ඇස දකින මල ගැනද?
පය රිදවන කටු ගැනද?
සාහිත්‍ය රසවතුන් හට නම්
අප ළඟ කිසිත් නැත

පළමුව
තුවාල කරමු කවිය!
එහි ගලන්නේ
රුධිරයද ඕජස්ද කිවමැන
රහස දැනගත හැකිය

වුමනාවක් වේනම්
ගවයෙක් වුවද කවියක් වේ
වචන ඇති විට පමණකුදු නොව
ජීවිතය සොලවන විට
එල දරයි අලුත් කවි

ඇතමෙකුට නම් ,
සමාජවාදය අගනේය
පක්ෂය අගයක් නැත
මී වදය වටනේය
බිගුන්ගේ අගයක් නැත

හරි බරි ගැසී
කවදාද විප්ලවය ?
වැසි වැටෙන්නේ කවදාද ?
විමසමින් ඈනුම් යවති

අහස පමණක් මදවේ
වැසි වැටෙන්නට නම්
පොළොව මත කියාවලියක් ඇත!
ජීවිතය නටඹුන් නොකර
වෙහෙස වීමෙන් තොරව
ඒ දින එලඹෙනු නැත

**(ඉන්දියානු ජාතික විප්ලවවාදී කවියෙක් වූ දුරෙයි ෂන්මුගම්)**

# බැංකු දුර්වලයි, S&P ය කියයි

# මහ බැංකුව බොරු කියයි!



ජාත්‍යන්තරව ආර්ථිකයන්ගේ තත්වය තක්සේරු කරන ආයතනයක් වන ස්ටැන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් (S&P) ආයතනය පසුගිය ජූනි 19 දා නිකුත් කළ ඔවුන්ගේ නවතම වාර්තාවට අනුව ලංකාව සඳහන් කර ඇත්තේ දැඩි අවදානම් සහගත (High risk) ආර්ථිකයක් ලෙසටය. මෙම ආයතනයේ වාර්ගීකරණය අනුව 1 සිට 10 දක්වා ලකුණු ලබාදෙන අතර 1 සිට 4 දක්වා අවදානම අඩු යහපත් ආර්ථිකයන් වේ. ලංකාවට ලබාදී ඇත්තේ ඉතා දැඩි අවදානම සහිත රටක් ලෙස සලකන ලකුණු 8 කි. බැංකු කර්මාන්තයද අවදානම් අධියකට පත්ව ඇතයි එම වාර්තාව සඳහන් අතර බැංකු අවදානම සලකුණු කර ඇත්තේ ලකුණු 7ක් ලෙසය. මෙම ආර්ථික අවදානම හා මූල්‍ය කර්මාන්ත අවදානමට ලංකාව හා සමාන මට්ටමින් මුහුණ දෙන අනිකුත් රටවල් ලෙස බොලිවියාව, කසකස්තානය හා නයිජීරියාව නම් කර ඇත. මෙම නවතම වර්ගීකරණය නිසා කලබලයට පත් ශ්‍රී ලංකා මහ බැංකුව 2012 ජූනි 21 වැනිදා දීර්ඝ පැහැදිලි කිරීමක් සහිත නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශයට පත් කළේ ස්ටැන්ඩඩ් ඇන්ඩ් පුවර්ස් (S&P) වාර්තාව සාවද්‍ය කරුණු සහිත අතාර්කික හා පරස්පර විරෝධී ප්‍රකාශ ඇති වාර්තාවක් බවය.

මහ බැංකුව නිකුත් කළ නිවේදනය අනුව ලංකාවේ බැංකු පද්ධතිය ශක්තිමත්ය. රටේ මූල්‍ය පද්ධතියේ වත්කම්වලින් 55%කට දායක වන්නේ මහ බැංකුවය. ණය අයකර ගැනීම සාර්ථකය. ඒනිසා ණය ගෙවීම මට්ටම දුර්වල නැත. බැංකුවේ ද්‍රවශීල වත්කම 20%ක මට්ටවක තිබීම ඉතාම ඉහළය. තැන්පත්කරුවන්ගේ ගැටලුවක් ඇතිවී නොමැත. එනිසා කාර්යක්ෂමතාවය පිළිබඳව ගැටලුවක් ලංකාවේ බැංකුවලට ඇත්තේ නැත. ඒ මහා බැංකුවේ මෙම වාර්ගීකරණයට අදාල පැහැදිලි කිරීමයි.

එසේම බැංකුවල බැංකුව ලෙස බැංකු නියාමනය පිළිබඳ මහ බැංකුවට ගැටලුවක් නැති බව මහ බැංකුවේ පහැදිලි කිරීමය. ශ්‍රී ලංකාවේ බැංකු සම්බන්ධ රෙගුලාසි පැනවීම ජාත්‍යන්තර ප්‍රමිතින්ට වඩා දුර්වල යැයි S&P වාර්තාවේ පෙන්වා දී ඇති කරුණු මහ බැංකුව පදනම් විරහිත නිරීක්ෂණයක් සේ සලකා බැහැර කර ඇත. බැංකු නියාමනය අධීක්ෂණය දුර්වල යැයි එම වාර්තාවේ කර ඇති චෝදනා මහ බැංකුව එකහෙළාම ප්‍රතික්ෂේප කර ඇත්තේ එම චෝදනා සාධාරණ නොවන බවට ප්‍රති චෝදනාවක්ද නගමිනි.

අවදානමේ යථාර්ථය ජාත්‍යන්තර අවදානම දැනවීමේ ආයතනයක් ලෙස S&P ආයතනය ආර්ථිකයේ අවදානම පිළිබඳව ලිඛිතව ඔවුන්ගේ වාර්තාවන්ට ඇතුළත් නොකළත් ලංකාවේ ජීවත්වන ජනතාව ලෙස මේ රටේ අති බහුතරයක් දෙනා මේ වනවිට අදාල දැඩි අවදානම භුක්ති විඳිමින් සිටිති. 2009න් පසු ඉතිරිව තිබූ සුනාමි ආධාර මුදල් හා යුද්ධය නිමාවත් සමග ලද සහනයේ ප්‍රතිඵල ආණ්ඩුව හා ආණ්ඩුවේ නාස්තිකාර ගෝලබාල නඩය භුක්ති විඳීමේ ප්‍රතිඵල අද රටේ ජීවන බරින් මිරිකී සිටින ජනතාව භුක්ති විඳී. අද ලංකාව රුපියල් කෝටි ලක්ෂයක් වාර්ෂිකව ණය වෙන රටක්ය. මේ වනවිට ලංකාව ගෙවිය යුතු ණය බර රුපියල් කෝටි 553,000 ක් වන අතර එය පසුගිය මාස 5 ක කාලය තුළ 56%කින් ණය වැඩි වීමේ ප්‍රතිඵලයකි.

ආර්ථිකයේ කළමණාකරන හා අවදානම් තත්වය කෙසේද යත් පසුගිය 2011 වසරේදී මුළු අපනයන ආදායම මෙන් දෙගුණයක් ආනයන වියදම වැඩිවීම නිසා වෙළඳ ශේෂය පරතරය 100%කින් එනම් දෙගුණයකින් වැඩිවිය. එම තත්වය එසේ තිබියදී 2012 වසරේ මුළු කාර්තුවේ පමණක් ආණ්ඩුවේ වාර්තාගත වියදම 24.2%කින් (රු.බිලියන 334.8) වැඩිවී ඇති අතර ආදායම වැඩිවී ඇත්තේ 10.3%කින් පමණි. (රු. බිලියන 203) ආණ්ඩුවේ සැලසුම අනුව අයවැය තුළ වාර්ෂිකව වැඩිවිය යුත්තේ 14.4%කින් වුවත් මේ ආකාරයට දිගටම පවතින්නේ තම ආණ්ඩුවේ ආදායම වැඩිවනු ඇත්තේ 5% ක් 6% ක් පමණි. පසුගිය වසරේද ආණ්ඩුවේ ආදායම 19% කින් වැඩිකර ගැනීමට ඉලක්ක තැබුවද වැඩිකර ගත හැකිවුයේ 12.2% කින් පමණි.

ආණ්ඩුව වෙනුවෙන් මහ බැංකුව අදාල වාර්තාව නිකුත්කල ජාත්‍යන්තර S&P ආයතනයට යුද්ධ ප්‍රකාශකිරීමෙන් එලක් නොවන්නේ කොළවලින් හා අකුරු ඉලක්කම්වලින් කුමක් සාධාරණීකරණය කර ජාත්‍යන්තරයට පෙන්වීමට උත්සාහ කළද යථාර්ථයේදී ඇත්ත මූල්‍ය ආර්ථික අර්බුදයකට ලංකාව පත්ව ඇති බව පිළිගැනීමට සිදුවේ.

ගෝලීය අර්බුදය ලංකාවටත් ජාත්‍යන්තර වශයෙන් ධනවාදී යැයි නම් කළ ඇමරිකාව හා යුරෝපයේ බොහෝ රටවල්ද අද දැවැන්ත ලෙස අර්බුදයකට මුහුණ දී සිටී. ග්‍රීසිය, ඉතාලිය, ජපානය, ප්‍රංශය, බ්‍රිතාන්‍ය හා ඇමරිකාවද යුරෝපයේ තවත් මෙම ප්‍රබල රටවල් හා යැපෙන රටවල්ද මෙම අර්බුදයේ ගිලී මරණය වෙත එම රටවල ජනතාවගේ ජීවිත ඇදගෙන යමින් තිබේ. එම රටවලද මුලින්ම අර්බුදයට පත් වූයේ අධික ලෙස පරිභෝජනයට හා දේපළ මිලදී ගැනීමට ණය දුන් බැංකු පද්ධතීන්ය. බැංකුවල තරඟකාරී ණය දීමේ ප්‍රතිඵල ලෙස මුල්‍ය හිඟයටත්, ඒ නිසා නැවත ණය දීමේ නොහැකියාවටත් බැංකු පත්වේ. නැවත එක්කෝ ණය ගැනුම්කරුවන්ගේ යළි ගෙවීම්වලින් හෝ වෙනත් තැන්පතු කරුවන්ගෙන් ලැබීම්වලින් බැංකුවල තත්වය යහපත් විය යුතුය. නමුත් උග්‍ර ජීවන වියදම් අර්බුදය හමුවේ ලෝකය පුරාම සිදුවී ඇත්තේ, ධනවාදය යළි යථා තත්වයට පත්වෙනවා වෙනුවට තිබුණු තත්වයට වඩා උග්‍ර අයහපත් තත්වයට ඒ රටවල්වල ආර්ථිකයන් කඩා වැටීමයි. ආර්ථිකයන් රෝගීවන විට යළි යළිත් අර්බුදයට පත් වන්නේ බැංකු ඇතුළු මුල්‍ය ආර්ථිකයයි. රාජ්‍ය භාණ්ඩාගාර සහනයක් නොලැබෙන්නේ නම් තත්වය තවත් අයහපත් වනු ඇත. වත්මන් ධනවාදී අර්බුදයේ සෑම රටකම ප්‍රකාශනයන් ඒ ආකාරයය.

ලංකාවේදීද අපට මෙම බැංකු ක්ෂේත්‍රය කඩා වැටීමේ තත්වය හොඳින්ම දැකිය හැකිය. යම් තරමකට හෝ යථා තත්වයට පත් වීමට ඉඩක් පැවති යුද්ධය නිමා වූ විගස ආණ්ඩුව සිදුකළේ බැංකු පොලී අනුපාත සීඝ්‍ර ලෙස අඩුකරමින් තම ගජමිතුරන්ට බැංකුවලින් ණය ගැනීමට සැලැස්වීමයි. මේ සඳහා හොඳම උදාහරණය ලංකා පුත්‍ර බැංකුවෙන් සිදුකරන ලද ණය දීමයි. අද වනවිට ලංකා පුත්‍ර බැංකුවේ අයකරගත නොහැකි ණය සීමාව මුළු බැංකු වත්කම්වලින් 58% ක් වේ. ඒ එක් උදාහරණයක් පමණි. 2011 වසරේදී ලංකාවේ රාජ්‍ය බැංකුවලින් නිකුත් මුළු ණයවලින් 28.2%ක් හෙවත් රුපියල් කෝටි 34,440 ක් උකස් ණය වන අතර 18.5%ක් (රුපියල් කෝටි 22,680) නිවාස ණය වේ. එම ණයවලින් 13.3% ක් හෙවත් රුපියල් කෝටි 16,260 ක් පාරිභෝජනයන්ට යෙදවූ ණය ලබා දීමය. මේ අනුව මුළු ණය දීම්වලින් 41%ක්ම පරිභෝජනයෙන් කෙළවර කරන ණය වේ. ඒ, යම් නිෂ්පාදන ක්‍රියාවලියට දායක නොවන ණය ලබා දීම්ය. ජාත්‍යන්තර මෙන්ම ලංකාවේද අද බැංකු පද්ධතිය අසාර්ථක හා අකාර්යක්ෂම අධියකට පත් වී ඇති බවට තවත් විවාද අවශ්‍ය නැත. ස්ටැන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් ආයතනය ලංකාව හා බැංකු පද්ධතිය අවදානම් සහගත ලෙස ලකුණු කිරීමේදී සලකා බලන ලද කරුණු අතර මහ බැංකුවේ ක්‍රියාකාරිත්වය නිසා ඇතිවන මතභේදයන්ද සලකා ඇත. ඒ, මහ බැංකු පාලනයේම ඇති අර්ථසාධක අරමුදල මහා බැංකුව විසින්ම නියාමනය කරන කරන බැංකුවල කොටස් මිළදී ගැනීමට යෙදවීම පිළිබඳවයි. මහ බැංකුව රාජ්‍ය හා පෞද්ගලික බැංකු පිළිබඳව කටයුතු සොයා බලන බැංකුවල බැංකුවයි. එවිට අනෙකුත් බැංකුවල මූල්‍ය වාර්තාවන් මගින් එම බැංකුවල තත්වය පිළිබඳව රහස්‍ය තොරතුරු දැනගැනීමේ හැකියාව මහ බැංකුවට ලැබේ. ඒ තොරතුරු මත පදනම්ව අර්ථසාධක අරමුදලේ මුදල් මහ බැංකුව විසින් වෙනත් බැංකුවල කොටස් මිලදී ගැනීමට යෙදවීම නියාමනය පිළිබඳව ගැටුමක් ලෙස අදාළ වාර්තාවේ දක්වා තිබේ. නමුත් මහබැංකුව එයට දී ඇත්තේ දේශපාලකයින් ඡන්දදායකයින් රවටන ආකාරයේ සරල පිළිතුරක් පමණි.

මහ බැංකුව ජාත්‍යන්තර වර්ගීකරණයද බොරු යයි පවසමින් ආර්ථිකයත් මහා බැංකුවත් ඉතාමත් ශක්තිමත් තැනක ඉන්නේ යයි කියන අතරේම රාජපක්ෂ දුබල ආණ්ඩුව ලොව වටා යන්නේ ණය සොයමින්ය. මේ වන විට ආණ්ඩුව මූල්‍ය අරමුදලේ ණය වාරිකවලට අමතරව තවත් ඩොලර් කෝටි 100 ක් ණයට ගැනීමට උත්සාහ දරමින් සිටී. එම කෝටි 100ක ණය මුදල ලබා ගත් විගස ඉන් ඩොලර් කෝටි 50ක් ලබන ඔක්තෝබර් 22 වන විට මීට කලින් ලබාගත් ණය ගෙවා පියවීමට යෙදවිය යුතු වනු ඇත. ඊට අමතරව ඛනිජ තෙල්වලින් පසුගිය මැයි 31 වන විට ආණ්ඩුව ලබා ඇති පාඩුව රුපියල් කෝටි 6,500 කි. එම පාඩුව තිබියදීම තවත් තෙල් මිලදී ගැනීමට ඉහළ පොලී අනුපාත යටතේ ආසියානු සංවර්ධන බැංකුවෙන් තවත් රුපියල් කෝටි 1843 ක ණයක් ආණ්ඩුව අයැදුම් කර ඇත. ආණ්ඩුව තම ඉහළ ව්‍යුහයන්ගේ අර්බුදය පාලනය කර ගැනීමට ණය ඉල්ලුම් කරන විට බැංකුවලට තම පැවැත්ම රැකගැනීමට සිදුවී ඇත්තේ ජනතාවගේ අවශ්‍යතා සඳහා ණය දීම සීමා කිරීමෙන්ය. මේ වන විට රාජ්‍ය බැංකු බොහොමයක සාමාන්‍ය තැන්පත්කරුවන් සඳහා ණය දීම නතරකිරීමට සෘජුවම බැංකු කළමනාකරුවන්ට නියෝග ලබා දී ඇත්තේ ඒ නිසාය.

ජාත්‍යන්තර වර්ගීකරණය තුළ අති අවදානම් ආර්ථිකයක් හා මූල්‍ය පද්ධතියක් ලෙස නම් කරන විට එය වසා ගැනීමට මහ බැංකුව අසත්‍ය ප්‍රචාර පළ කළද යථාර්ථයේ ඇත්තේ, දිනපතා අර්බුදයෙන් අර්බුදයට යන ධනවාදී පැවැත්ම තමන් විසින් අහෝසි කරගන්නා තරමේ මූල්‍ය ආර්ථික කඩා වැටීමක්ය. එයින් පීඩාවට පත්වන්නේ දූෂිත පාලකයින් නොව ශ්‍රමය තම එකම හැකියාව කරගත් වැඩ කරන ජනතාව ප්‍රධාන සාමාන්‍ය ජනතාවය. මේ දුබල ධනපති පාලකයන් සමගින්ම තම පැවැත්ම තරකර ගන්නා බැංකු ප්‍රධානීන් ඇතුළු නිලධාරීවාදයත් පරාජය කළ හැක්කේ ධෛර්ය සම්පන්නව මේ අර්බුදය තේරුම් කරගන්නා ජනතාවටම පමණි.



''මධ්‍යම පන්තියේ පහළ තට්ටු වන කුඩා කර්මාන්ත හිමියෝ ද, සුළු වෙළෙන්දෝ ද, සුළු පොලීකරුවෝද, හස්ත කර්මාන්තකරුවෝ සහ ගොවියෝද යන මේ කොටස් නිර්ධන පන්තිය දක්වා පහත වැටෙති. අඩ වශයෙන් මෙසේ වීමට එක් හේතුවක් නම්, විශාල කම්හලක් පටන්ගැනීමට තරම් ඔවුන්ගේ කුඩා ප්‍රාග්ධනය ප්‍රමාණවත් නොවීමය. එමෙන්ම ඔවුන් විශාල ධනපතීන් සමඟ කරන තරඟයේ දී පරාජයට පත්වීමය. අනෙක් හේතුව නම්, නවීනතම නිෂ්පාදන ක්‍රම විධි ඔවුන්ගේ ශිල්පමය දක්ෂතාවය නොවටනා දෙයක් බවට පත්කරනු ලැබීමය. මේ ලෙස ජනගහනයේ සියලු පන්තීන්ගෙන් නිර්ධන පන්තියට පුද්ගලයන් බඳවාගනු ලැබේ.

**කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය**
**42/43 වැනි පිටුව**



# මොකක්ද මේ DEMO - CRACY

ප්‍රජාතන්ත්‍රවාදය යන්න අද දවසේ නිතර ඇසෙන වදනක් බවට පත්ව තිබේ. විවිධ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් මෙය සම්බන්ධව නොයෙකුත් ප්‍රවෘත්ති ජාතිකවත් ජාත්‍යන්තරවත් අපට අසන්නට දකින්නට ලැබේ. තවද මේ සමග මූලික මිනිස් අයිතිවාසිකම්, මානව හිමිකම්, නිදහස යන්නද නිතර භාවිත වේ. මාධ්‍යවේදීන් පැහැර ගැනීම හා ඝාතනය කිරීම, ආයතන විනාශ කිරීම මාධ්‍ය නිදහස උල්ලංඝනය කිරීමක් වන අතර එය ජනතාවගේ තොරතුරු දැන ගැනීමේ අයිතියට ඇති බාධාවක් බවත් එය ප්‍රජාතන්ත්‍රවාදී රටකට කිසිසේත්ම නොගැලපෙන්නක් බවත් ඇතැම්හු පවසති. ගොවීන්, කම්කරුවන්, ධීවරයන් හා ශිෂ්‍යයන්ගේ සාධාරණ අරගල මර්දනය කිරීම ප්‍රජාතන්ත්‍රවාදයට පටහැණි බවත් තවකෙක් පවසති. මැතිවරණවලදී සිදුවන ඡන්ද දූෂණ විරුද්ධ පාක්ෂිකයන්ට සිදුකරන පහරදීම් ඝාතනය කිරීම් ප්‍රජාතන්ත්‍රවිරෝධී බවද තවත් අදහසකි.
මෙරට තුළ පමණක් නොව ඇමරිකාව, එංගලන්තය, ජර්මනිය සහ ප්‍රංශය වැනි දියුණු ධනපති රටවලද ප්‍රජාතන්ත්‍රවාදය කඩවීම් පිළිබදව නොයෙක් විට අපට අසන්නට දකින්නට ලැබේ.

එහෙත් අප රටේ ජනයා බඩු මිල, අපරාධ, මිනීමැරීම්, සොරකම් ආදිය කතාබහට ලක් කළත් ප්‍රජාතන්ත්‍රවාදය වැනි සංකල්පයක් සම්බන්ධයෙන් කතාබහක් ඇති නොවන තරම්ය. එය එතරම්ම සාමාන්‍ය ජනයාගෙන් ඈත් වූ සංකල්පයක්ව පවතී. අප පසුගිය කලාපය තුළින් රජය හා ආණ්ඩුව අතර වෙනසද නොයෙක් සංකල්ප මගින් රාජ්‍යයේ සූරාකෑම වසන් කර ඇති ආකාරයද සාකච්ඡාවට බඳුන් කළෙමු. මෙවර කලාපය තුළින්ද එවැනිම සංකල්පයක් වූ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ කියවීමකට අපි යොමු වෙමු. 'ප්‍රජාතන්ත්‍රවාදය' යන සංකල්පය තරම් දේශපාලන විද්‍යාවේ කථිකාවකට ලක්වූ සංකල්පයක් නැති තරම්ය. ධනේශ්වර රාජ්‍යයේ ආණ්ඩු ක්‍රම ආකෘතියක් ලෙස හැදින්වෙන මෙය සඳහා විවිධ විචාරකයන්, ලේඛකයින්, චින්තකයින් දී ඇති අර්ථකතන ප්‍රමාණයද විශාලය. ඉතා සරලව සැලකුවහොත් DEMOCRACY යන වචනයෙන් හඳුන්වන මෙම සංකල්පය DEMOS යන ග්‍රීක අක්ෂරයෙන් හින්න වූවක් බව සැලකේ. ග්‍රීක භාෂාවේ එම වචනය හඳුන්වාදී ඇත්තේ, පැරණි ග්‍රීසියේ ක්‍රි.පූ. 05වන සියවසේ ඇතැන්ස් නුවර පුරවැසි සභාවට රැස්වීමට අවසර තිබූ ඇතැන්ස් පුරවැසියන්ය. නමුත් එයින් නූතන මහජනතාව යන්න අර්ථ නොනැගේ. ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධව ධනේශ්වර විචාරකයන් අතර ජනප්‍රිය අර්ථකතනය වී ඇත්තේ, ඇමරිකානු ජනාධිපතිවරයෙකු වූ එබ්‍රහම් ලින්කන් විසින් 1863 දී ගෙටිස්බර්ග් නුවරදී ප්‍රජාතන්ත්‍රවාදය යනු "මහජනතාව විසින් මහජනතාව උදෙසාම ගෙන යන මහජන පාලන තන්ත්‍රයක්"යනුවෙන් කළ හැඳින්වීමයි. සරලව ගතහොත් මෙය බහුතරයේ කැමැත්ත ලෙසද හඳුන්වනු ලබයි.

**'ප්‍රජාතන්ත්‍රවාදය' එළිදකී**

ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයන්හි මූලයන් සොයා ගිය බොහෝ ලේඛකයන්ගේ, චින්තකයින්ගේ අවධානය යොමු වූයේ ක්‍රි.පූ. 05වන 04වන සියවස් තුළ ග්‍රීසියේ පෞර(Pollis) රාජ්‍යයවල ආණ්ඩු ක්‍රම පිළිබදවය. එයිනුත් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම සංවිධානයක් පැවති පෞර රාජ්‍යයක් ලෙස ඇතැන්ස් හැඳින්වේ. එහි විද්‍යාමාන වූ ආයතන තුනක් පිළිබඳව සදහන් වේ. එනම් පුරවැසි සභාව, විධායක සභාව සහ අධිකරණ සභාව යන්නයි. ශ්‍රීමත් අර්නස්ට් බාකර්ගේ තක්සේරුව අනුව මෙහි පුරවැසි සභාවට අයිතිවාසිකම් ලැබුවේ ජනගහනයෙන් 45,000ක් පමණ වේ. ඒ මොහොතවන විට එහි සිටි වහළුන්ගේ සංඛ්‍යාව 80,000ක් පමණ වූ අතර කාන්තාවන්ගේ හා කුඩා දරුවන්ගේ සංඛ්‍යාව 90,000ක් පමණ විය. නමුත් අප අමතක නොකළ යුතු කරුණය වන්නේ මෙකල වහළුන් මිනිසුන් සේ නොසැලකුණු අතර ජීවයක් ඇති යන්ත්‍ර සේ ඔවුන් සැලකනු ලැබූ බවයි. එසේම කාන්තාවන්ද පුරවැසියන් ලෙස නොසලකන ලද තත්වයක් යටතේ මෙය ප්‍රජාතන්ත්‍රවාදය ලෙස අර්ථ දක්වා තිබේ. සාමාන්‍යයෙන් ප්‍රජාතන්ත්‍රවාදය නැමැති සංකල්පයේ මූලික ලක්ෂණයක් වන බහුතර කැමැත්තද එහි සමස්ත ජනගහනය හා සලකන විට නොසලකා ඇති බව පෙනී යයි. තවද මෙහි පුරවැසියන් ලෙස හැඳින්වූ සියලු දෙනා රාජ්‍යය පාලනයට හවුල් වන බැවින් මෙය ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ලෙස හැඳින්වේ. පැරණි ඉන්දියාවේද ග්‍රීක පෞර රාජ්‍යය ක්‍රමයට බෙහෙවින් සමාන වූ සමූහ ආණ්ඩු පාලනයක් බුද්ධ කාලයේදී පැවති බව මේ පිළිබදව පරීක්ෂණයන් පැවැත් වූ ඉන්දියානු ඉතිහාසඥයෙකු වූ අලිටේනර් Aletenar පවසා තිබේ. වර්තමානයේ රාජ්‍යයේ විශාලත්වය, ජනගහනයෙහි වර්ධනය නිසා මෙම ඍජු ප්‍රජාතන්ත්‍රවාදය දකින්නට නොලැබේ. එනිසා වත්මනේ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නංවන මාධ්‍යය වන්නේ, වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදයි. මෙය නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ලෙසද හැඳින්වේ. කාලයෙන් කාලයට පවත්නා මැතිවරණ හා මහජනයා සතු ඡන්ද බලය මෙහි ප්‍රධාන මූල ධර්ම ද්විත්වය වේ.

**නූතන ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදය**

වර්තමානයේ අප හදුන්වන ප්‍රජාතන්ත්‍රවාදය එදා ග්‍රීසියේ හෝ පැරණි ඉන්දියාවේ තිබූ ප්‍රජාතන්ත්‍රවාදය නොවේ. එය නූතන ප්‍රජාතන්ත්‍රවාදය ලෙස හැඳින්වෙන අතර එය 16-17 වැනි ශත වර්ෂවලදී යුරෝපයේ සිදුවූ ආර්ථික හා දේශපාලන විපර්යාස හා බැඳී පවතී. එම ශතවර්ෂවල යුරෝපයේ සිදුවූ ආර්ථික විපර්යාසය හේතුවෙන් එතෙක් පැවති වැඩවසම් ක්‍රමයත් ඒ මත ගොඩනැගුණු දේශපාලන රටාවත් සීඝ්‍රයෙන් බිඳ වැටෙන්නට විය. එතුවක් කාලයක් කෘෂිකර්මාන්තය මත පදනම් වූ ආර්ථික ක්‍රියාවලිය වෙනුවට වෙළඳාම සහ කාර්මීකරණය මත වූ ආර්ථික ක්‍රියාවලියක් බිහිවිය. නමුත් මෙසේ බිහිවූ නව ආර්ථිකයේ සංවර්ධනයට වැඩවසම් දේශපාලන රටාව ඉමහත් බාධාවක් විය. විශේෂයෙන්ම රෝම පල්ලිය සහ ශුද්ධ රෝම අධිරාජ්‍යයාගේ ආධිපත්‍යයද එවැනිම බාධාවක් ගෙන එන ලදී.
මෙම සියලු බාධාවලින් මිදීම සඳහා නැගීගෙන එන ධනපති පංතිය ඒ ප්‍රදේශවල ශක්තිමත් කුමාරවරු මෙන්ම රජවරුද සම්බන්ධකර ගනිමින් එම විදෙස් ආක්‍රමණවලට එරෙහිව රාජාණ්ඩුව ශක්තිමත් කළ අතර ඒ සඳහා මතවාදී දායකත්වය ධනේශ්වර දේශපාලන චින්තකයන් වූ මැකියාවේලි, හොබ්ස් සහ බොඩැන් වැන්නවුන්ගෙන් ලැබුණි. තවද රෝම පල්ලියේ ආධිපත්‍යයට එරෙහිව ප්‍රොතෙස්තන්ත්‍ර ව්‍යාපාරය මගින් ගෙන ගිය ක්‍රියා මාර්ග හේතුවෙන් ධනපති පංතියට අවශ්‍ය ආකාරයට ආගමික ප්‍රතිසංස්කරණ සිදුවිය. අවසානයේ ධනපති පංතියේ වුවමනාව සාක්ෂාත් වූ අතර ඔවුන් බලාපොරොත්තු වූ ආකාරයට විදේශ ආධිපත්‍යයන්ගෙන් මිදුණු ස්වාධීන 'ජාතික රාජ්‍යයන්' ගොඩනගා ගැනීමට රාජාණ්ඩු පාලන ක්‍රම යටතේ හැකියාව ලැබුණි.
එහෙත් 18,19 ශත වර්ෂ වන විට ධනපති ව්‍යාපාරිකයන්ගේ ආර්ථික වුවමනා එපාකම් සමග රජවරුන්ගේ අඥාදායක බලතල ගැටෙන්නට විය. විශේෂයෙන්ම මේ තත්වය එංගලන්තය තුළ දකින්නට ලැබුණි. නැගී එන ධනපති පංතිය සමග එක්ව කටයුතු කිරීම නිසා තවදුරටත් ශක්තිමත් බවට පත් රජවරු පසුව තම අධිරාජ්‍යය ගොඩනැගීමේ දෙසට තල්ලුවූ අතර ඒ සදහා අවශ්‍යය මුදල් ධනපති ව්‍යවසායකයන් මත වැඩි බදු බරක් පටවමින් ලබා ගැනීමට කටයුතු කරන ලදී. රජවරුන්ගේ මෙම ක්‍රියාවලට එරෙහිව ධනපති ව්‍යවසායකයන් වෙතින් ප්‍රබල විරෝධතාවයක් එල්ලවුණි. එසේම සිතුමතේ පුද්ගලයින් බන්ධනාගාර ගත කිරීම, ඔවුන්ගේ දේපොළ රාජසන්තක කිරීම රජුට ඇති අඥාදායක බලය ධනපති පංතියේ ආර්ථික මෙන්ම සිවිල් නිදහසටද තර්ජනයක් විය. එබැවින් ධනපති පංතිය තම ආර්ථික සහ සිවිල් නිදහස ඉලක්ක කර ගනිමින් රාජාණ්ඩුවේ ආඥාදායකත්වයට එරෙහිව නැගී සිටින ලදී.
මෙකල ධනපති පංතියේ මෙම වුවමනාවන් නිසා බිහිවූ දේශපාලන අදහස් මාලාවක් ලෙස ලිබරල්වාදය ලෙසද එම අදහස් දැරුවන් ලිබරල්වාදීන් ලෙසද හැඳින්විණි.
මෙම ලිබරල්වාදී අදහස් පදනම් කරගනිමින් 1688 දී එංගලන්ත ධනපති පංතිය රාජාණ්ඩුව පෙරළා නොදමා රජු සමග එකගතාවයෙන් ධනපති පංතියේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් තහවුරු කරන රාජාණ්ඩුවක් ඇති කරගන්නා ලදී. වර්ෂ ගණනාවක් විදේශීය රාජාණ්ඩුවකට යටත්ව සිටි ඇමරිකානු ජනතාවගේ පීඩනයද තම වුවමනාවන් සඳහා යොදා ගත් ධනපති පංතිය 1777 දී රාජාණ්ඩුව පලවා හැරීමට කටයුතු කළ අතර 1787 දී සමූහාණ්ඩුවක් ගොඩනගා ගත්හ. 1789 දී නැගී සිටි ප්‍රංශ ධනපති පංතිය, ප්‍රංශ රාජ පරම්පරාව සමූල ඝාතනය කර අනතුරුව සමූහාණ්ඩු ක්‍රමයක් පිහිටුවා ගන්නා ලදී. 17,18 වන ශත වර්ෂවල ඇති වූ මෙම විපර්යාසයන් ධනේශ්වර විප්ලව ලෙස හඳුන් වන අතර ඉන් බිහිවූ සමූහාණ්ඩුද ධනපති පංතියේ බලය තහවුරු කළ ඒවා විය.
මෙම විප්ලව සඳහා මතවාදී දායකත්වය ලොක් (Locke), ජෙපර්සන් (Jefferson) ,ඩී ටොක්වෙල්ලි (De Toqvelli) සහ පේන් (Paine) වැනි ලිබරල් චින්තකයින් අතින් සිදුවිය. එම18,19 වැනි ශත වර්ෂවල රාජාණ්ඩුවාදයට එරෙහිව සමූහාණ්ඩු ගොඩනැගීම සදහා ධනපති පංතිය ගෙන ගිය සටන් සහ උද්ඝෝෂණ තුළින් නූතන ප්‍රජාතන්ත්‍රවාදය නැමැති සංකල්පය ඉස්මතු වූ බව පැවසේ. තවද එහි ආරම්භය ධනේශ්වර පංතියේ දේශපාලන දර්ශනය වූ ලිබරල්වාදයත් සමග උත්පත්තිය ලැබූ බවද ඇතැම් දේශපාලන විචාරකයින් පෙන්වා දී තිබේ. එම නිසා මෙම නූතන ප්‍රජාතන්ත්‍රවාදය යන සංකල්පය ධනේශ්වර සංකල්පයකි.
ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක ලක්ෂණ පිළිබදව නූතන විචාරකයන් අතර විවිධ මතිමතාන්තර ඇත. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබදව ග්‍රන්ථයක් ලියූ පිකල්ස් (Pickles) අවම වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක අඩංගු විය යුතු කාරණා කිහිපයක් පිළිබදව අවධාරණය කරණ ලදී. ඒවා නම්

1.ජනතාවට තමන්ට කැමති ආණ්ඩුවක් තෝරාපත්කර ගැනීමට හැකියාවක් තිබීම.
2. ඒ සඳහා ඡන්ද බලය සහ දේශපාලන පක්ෂ බිහිකර ගැනීමේ අයිතියත්, ආණ්ඩුව විවේචනය අයිතියත් ජනතාවට තිබීම.
3. පාලකයින් ජනතාවට වගකියන්නා වූ පිරිසක් විය යුතු අතර ඔවුන් සාමකාමීව බලයෙන් පහ කිරීමේ අයිතියද ජනතාවට තිබීම.
4. මහජනතාවට තම අදහස් ප්‍රකාශ කිරීමට නිදහස් ජනසන්නිවේදන මාධ්‍ය ක්‍රමයක් තිබිය යුතුවීම.
5. ඒ තුළින් ආණ්ඩුව සහ ජනතාව අතර දේශපාලන සංවාදයක් පවත්වා ගැනීමට හැකියාවක් තිබීම.
6. නීතිය පසඳලීම සහ ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණය සර්ව සාධාරණ විය යුතුය යන්නයි.

කෙසේ නමුත් මේවා ප්‍රායෝගිකව භාවිතයට නගද්දී අර්බුදයනුත් මේ සම්බන්ධව ඇති මාක්ස් ලෙනින්වාදී අදහස් පිළිබදවත් ලබන කලාපයෙන් විමසා බලමු.

# නිෂ්පාදනය විනාශ කරන චින්තන ආර්ථිකය

රටක ආර්ථික සංවර්ධනය ගණනය කිරීමේදී එම රට ආර්ථිකමය වශයෙන් කොතරම් ප්‍රමාණයක් නිෂ්පාදන ක්‍රියාවලිය තුළ අත්පත් කරගෙන තිබෙනවාද යන්න තීරණාත්මක සාධකයකි. එම නිසාම නිෂ්පාදනය ඕනෑම රටක ප්‍රධාන ආර්ථික සාධකයක් ලෙස සලකණු ලබයි. ඒ අනුව නූතන ලෝකය තුළ කම්කරුවාද නිෂ්පාදන කම්කරුවා ලෙස යම් වර්ගීකරණයකටද ලක් වී තිබේ. ඕනෑම රටක ආර්ථික සැලසුම් සකස් කිරීමේදී එහි ගෙවීම් අනුපාත සකස් කරනු ලබන්නේ එම රට සිදුකරනු ලබන සමස්ත නිෂ්පාදන ප්‍රමාණය සැලකිල්ලට ලක් කරමිනි. එසේ කරනු ලබන්නේ නිෂ්පාදනය රටේ සමස්ත ක්‍රියාවලියටම ප්‍රධාන ලෙසම දායකත්වය සපයන බැවිනි.

අප රට තවමත් සංවර්ධිත රටක් නොවන බව කවුරුත් දනිති. නූතන ආරථික විද්‍යා විශ්ලේෂකයන්ට අනුව රටවල් ප්‍රධාන වර්ගීකරණයන් 3 කට අයත් වේ. එනම් ඉහළ ආදායම් ලබන රටවල් - Super Economic Country - SEC මධ්‍ය පරිමාණ ආදායම් ලබන රටවල් - Middle Economic Country - MEC පහළ ආදායම් ලබන රටවල් - Loss Economic Country - LEC . මෙම පදනම සකස් කිරීම සඳහා එකී විශ්ලේෂකයන් උපයෝගී කොටගෙන ඇත්තේ අදාල රටවල්වල ඒක පුද්ගල ආදායමයි. ඒ අනුව යම් රටක ඒක පුද්ගල ආදායම වාර්ෂිකව ඩොලර් 100 ට අඩුනම් එම රටවල් LEC රටවල් ලෙසද ඒක පුද්ගල ආදායම ඩොලර් 1000 ට වැඩිනම් එම රටවල් MEC රටවල් ලෙසද ඩොලර් 10000 ට වැඩි ඒක පුද්ගල ආදායමක් සහිත රටවල් SEC රටවල් ලෙසද හඳුන්වනු ලබයි.

අපේ රටේ ඒක පුද්ගල ආදායම ඩොලර් 2000 ක් බව මහ බැංකුවේ වාර්තා සඳහන් කරන අතර ඒ අනුව නූතන ආර්ථික විශ්ලේෂකයන්ට අනුව ශ්‍රී ලංකාව අයත් වන්නේ MEC රටවල් ගණයටය. එනම් ආසන්න වශයෙන් අපේ රටේ සෑම ආදායම් ලැබිය යුතු වයසේ පුරවැසියන්ම (වයස 18 ට වැඩි) මාසිකව රු. 21,666.00 කට ආසන්න මුදලක් ලැබිය යුතුය. නමුත් සැබෑව නම් එය එසේ නොවන බව සංඛ්‍යා ලේඛනවලින් නොව සැබෑ ජීවිතවලින් අපේ රටේ ජනයාට වටහා ගත හැකිය. ආණ්ඩුව මෙකී ගණනය කිරීම් සිදු කරනු ලබන්නේ සාමාන්‍යකරණයට ලක් කරන ලද ගණිත සූත්‍ර මගිනි. එනම් ආදායම රුපියල් 100,000 ක් ලෙස බෙදිය යුතු ජන සංඛ්‍යාව 10ක් ලෙසත් ගෙන එක් පුද්ගලයකුට රු. 10,000 ක් හිමිවනු ඇත යන්නයි. එහෙත් වර්තමාන ධනේෂ්වර ආර්ථික රටාව තුළ එවැනි සමානුපාතික සමාන්‍යකරණ බෙදීමක් සිදු නොවන අතර එය විෂමතාවයන්ගෙන් ගහණ බෙදීමක් බව ඉතා පැහැදිලිය. එකී විෂමතාවයට යටත්ව බෙදී යාම සූත්‍ර ගත කළහොත් රුපියල් 100,000 ක් එක් කෙනෙකුට රු. 50,000 ක මුදලක්ද තවත් 4 දෙනෙකුට රු. 10,000 බැගින්ද තවත් 2 දෙනෙකුට රු. 4,000 බැගින්ද 2 දෙනෙකුට රු. 1,000 බැගින්ද බෙදා 10 දෙනෙක් අතර රුපියල් 100,000 බෙදීමේ සංඛ්‍යා අගයන් වසන්කොට ඉහත සමානුපාතික සූත්‍රගත පැහැදිලි කිරීම කළ හැකිය. එවිට කෙනෙකුට අවශ්‍ය නම් එකී පැහැදිලි කිරීම පිළිග ැනීමටද ඉඩක් තිබේ. ඒ අනුව පැහැදිලි වන්නේ මොවුන්ගේ සංඛ්‍යා දත්තවලට අදාල සූත්‍රගත පැහැදිලි කිරීම් කිසි විටෙකත් එහි සැබෑව හෙළි නොකරන බවයි.

කරුණු මෙසේ වුවද අපේ රටේ නිෂ්පාදකයන් රාශියක් සිටින බවද පිළිගත යුතු සත්‍යයකි. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සැලකුවහොත් ප්‍රධාන නිෂ්පාදනය ලෙස සැලකිය යුතු දායකත්වයක් රටේ ආර්ථිකයට සිදු කළ හැකිව තිබේ. නමුත් සිදුවන්නේ කුමක්ද? අපේ රටේ වී ගොවියෝ නිෂ්පාදනය කරන වී පාරට ගෙනවිත් ගිනි තබති. එළවළු නිෂ්පාදනය කරන එළවළු ගොවියෝ ඒවා මහ පාරේ දමා පාගති. පළතුරු නිෂ්පාදනය කරන පළතුරු ගොවියෝ පළතුරු විසිකරති. කිරි නිෂ්පාදනය කරන කිරි ගොවියෝ කිරි පාරේ හළති. බිත්තර නිෂ්පාදනය කරන බිත්තර ගොවියෝ ඒවා කුඩු කරති. මෙසේ කරනු ලබන්නේ ඔවුන්ගේ නිෂ්පාදනයන් නිසි මිලකට අලෙවි කර ගැනීමට නොහැකිවීම නිසාය. මෙකී නිෂ්පාදන ක්ෂේත්‍රයන් ගත් විට ඒවා අපේ රටේ ආර්ථිකයේ ප්‍රධානතම මෙහෙයුම් යාන්ත්‍රණ බව ඉතා පැහැදිලිය. රටේ වී පරිභෝජනය ඉක්මවා යන මට්ටමේ වී නිෂ්පාදනයක් සිදු වන්නේ ද නැත. එසේම පරිභෝජනය ඉක්මවා යන කින් ඉහළ ගොස් තිබේ. එනම් 1948 සිට සුද්දා කළු සුද්දන්ට රට භාර දුන් දවසේ සිට 2005 රාජපක්‍ෂ පාලනය දක්වා වසර 57 ක් තුළ අපේ රටේ රාජ්‍ය පාලකයන් 9 දෙනෙකු විසින් ලබා ගත් මුළු ණය ප්‍රමාණයටත් වඩා තවත් රුපියල් මිලියන 854311 ක ප්‍රමාණයක් රාජපක්‍ෂ ආණ්ඩුව ලබා ගෙන තිබේ. එහි ප්‍රතිශතාත්මක අගය ගතහොත් 139% කි. මෙලෙස අති දැවැන්ත ණය කන්දරාවක අප රට ගිල්වා තබන්නට වත්මන් පාලකයන්ට සිදුව ඇත්තේ ඔවුන්ට නිසි ආර්ථික සැලැස්මක් නොමැතිකම නිසාය යන්න ඉතා පැහැදිලිය.

මේ ආකාරයට තවදුරටත් රට ගමන් කළහොත් සිදුවන්නේ අති විශාල විනාශයකි. ලෝකය පුරාමත් බොහොමයක් රටවල් මෙවැනිම අර්බුදයන්ට මුහුණ දෙමින් තිබේ. ඉතියෝපියාව, ක්ෂේත්‍රය පිළිබඳව කිසිදු දැක්මක් හෝ වැඩපිළිවෙළක් නොමැත. ඔවුන් ඒ නිසාම සේවා ආර්ථිකය කෙරෙහි වැඩි ප්‍රතිශතයකින් විශ්වාසය තබා ඇත. ඒ වෙනුවෙන් සංචාරක ව්‍යාපාරය ආර්ථිකයේ ප්‍රධානම ඉපයීම් ලෙස යොදා ගනිමින් තිබේ. ක්‍ෂණික විචල්‍යයන්ට භාජනය වන සංචාරක ව්‍යාපාරය රටක ප්‍රධාන ආර්ථික ඉපැයීම් ලෙස යොදා ගැනීම මුග්ධකමක් හැර අන් යමක් නොවේ. එසේ වන්නේ ඔවුන්ට මෙකී ආර්ථිකය පිළිබඳව දැක්මක් නොමැතිකම නිසාය යන්න එයින් වඩාත් තහවුරු වේ. රටක යටිතල පහසුකම් සංවර්ධනය වැදගත් වන්නේ එම රට තුළ විශාල වශයෙන් නිෂ්පාදන ක්‍රියාවලියක් පණ ගැන්වෙන්නේනම් පමණි. නමුත් තිබෙන නිෂ්පාදනයන් නිෂ්පාදකයන් විසින්ම විනාශ දැමිය නොහැක්කේ කෘෂිකාර්මික නිෂ්පාදනය කෙරෙහි අපේ රටේ අතීත පාලකයන් සුවිශේෂී මැදිහත්වීමක් කර ඇති නිසාය. එය තහවුරුවන්නේ රට පුරා කුඩා සහ මධ්‍ය පරිමාණ මෙන්ම මහා පරිමාණ වාරි කර්මාන්ත 30,000 කට අධික ප්‍රමාණයක් සාක්ෂි සහිතව පවතින බවට ඔප්පු වී ඇති නිසාය. එහෙත් ඒ කිසිවකගෙන් නිසි ප්‍රයෝජනයක් ගෙන රට ඉදිරියට ගෙන යාම සඳහා වූ පැහැදිලි දැක්මක් වත්මන් පාලකයින්ට නොමැති බවනම් ඉතා පැහැදිලිය.

අප රට තුළ ඕනෑම නිෂ්පාදනයක් සඳහා අවශ්‍ය කරන භෞතික සම්පත් මෙන්ම මානව සම්පත්ද ඉතා බහුලව තිබේ. අවශ්‍ය වන්නේ එම සම්පත් නිසි කළමණාකරණයක් සහිතව ඵලදායී ක්‍රියාවලියකට යොදවා ගැනීමයි. ඒ වෙනුවෙන් ආකාරයේ එළවළු නිෂ්පාදනයක් හෝ පළතුරු නිෂ්පාදනයක් හෝ කිරි නිෂ්පාදනයක් හෝ බිත්තර නිෂ්පාදනයක් හෝ සිදුවන්නේද නැත. තවමත් අපේ රටේ දරුවන්ගෙන් 15% ක් පමණ මන්ද පෝෂණයෙන් පෙළේ. 18% ක් පමණ ගැබිණි මාතාවන් රක්ත හීනතාවයෙන් පෙළේ. 13% ක් පමණ වන වැඩිහිටියන් යකඩ ඌණතාවයෙන් පෙළේ. මේ ආකාරයට අත්‍යවශ්‍ය පෝෂණ පදාර්ථයන් නොමැතිකම නිසාවෙන් රටේ ජනගහනයෙන් සැලකිය යුතු පංගුවක් පීඩා විඳිද්දී එකී පෝෂණ පදාර්ථයන් ලබා ගත හැකි නිෂ්පාදනයන් මහ පාරේ විනාශ කර දැමීමට නිෂ්පාදකයන් යොමුවීම බේදවාචකයක් ලෙස ගත යුතු නැත. මක් නිසාද යත් එය පැහැදිලිවම අපේ රටේ දුබල ආර්ථික ක්‍රියාවලියේ වැරැද්ද නිසා සිදුවන ක්‍රියාවක් වන බැවිනි. ආර්ථිකය තව දුරටත් ඉදිරියට ගෙන යා නොහැකි තරමටම එය දුබල වී තිබේ. ඒ වෙනුවෙන් වූ නිවැරදි සැලැස්මක් වත්මන් රාජපක්‍ෂ ආණ්ඩුවට නොමැති බවද ඉතා පැහැදිලිය. ඔවුන්ට ඇති එකම සැලැස්ම වන්නේ ණය ගැනීම, තවත් ණය ගැනීම හා තව තවත් ණය ගැනීමයි. 2005 රාජපක්‍ෂ පාලනය ආරම්භ කරන විට අප රට තුළ මුළු ණය ප්‍රමාණය වූයේ රුපියල් මිලියන 2,139,527 කි. එය වසර 5 ක් ඉක්ම යන විට රුපියල් මිලියන 5,133,365 ක් දක්වා රුපියල් මිලියන 2,993,838

> අපේ රටේ වී ගොවියෝ නිෂ්පාදනය කරන වී පාරට ගෙනවිත් ගිනි තබති. එළවළු නිෂ්පාදනය කරන එළවළු ගොවියෝ ඒවා මහ පාරේ දමා පාගති. පළතුරු නිෂ්පාදනය කරන පළතුරු ගොවියෝ පළතුරු විසිකරති. කිරි නිෂ්පාදනය කරන කිරි ගොවියෝ කිරි පාරේ හලති. බිත්තර නිෂ්පාදනය කරන බිත්තර ගොවියෝ ඒවා කුඩු කරති. මෙසේ කරනු ලබන්නේ ඔවුන්ගේ නිෂ්පාදනයන් නිසි මිලකට අලෙවි කර ගැනීමට නොහැකිවීම නිසාය.

සෝමාලියාව, උගන්ඩාව, අයිස්ලන්තය, හයිටිය, සිම්බාබ්වේ ආදී එවැනි රටවල් කිහිපයකි. මෙකී රටවල්වල ආර්ථිකයේ බිඳවැටීම් කොපමණද කිවහොත් ඔවුන්ගේ මුළු වත්කම් ප්‍රමාණයට වඩා අති විශාල ප්‍රමාණයක මූල්‍ය සංසරණයක් රට තුළ සිදුවෙමින් තිබේ. එයින් කියවෙන්නේ යළි ගොඩ ආ නොහැකි තරමේ දැවැන්ත මූල්‍ය උද්ධමනයකට එකී රටවල් පත් වෙමින් තිබෙන බවය. වර්තමාන රාජපක්‍ෂ පාලනය අප රටද ක්‍රමානුකූලව රැගෙන යමින් තිබෙන්නේ එවැනි ආගාධයකට බව ඉතා පැහැදිලිය. ඔවුන්ට නිෂ්පාදන කරන යථාර්ථයක් තුළ අධිවේගී මාර්ග හෝ කාපට් පාරවල් හෝ ගුවන් තොටුපොළවල් හෝ වරායවල් හෝ සංවර්ධනය සඳහා දායක කර ගත හැකි සාධක නොවන බව ආර්ථික විද්‍යාව පිළිබඳ 0 හෝ 1 වත් නොදන්නා ඕනෑම කෙනෙකුට වටහා ගත හැකිය. නිෂ්පාදනය වෙනුවෙන් කිසිදු දිරිගැන්වීමක් හෝ මැදිහත්වීමක් හෝ නොකරන ආණ්ඩුව එහි ඇති දුෂ්කරතාවයන් සහ ඒවායේ කාර්යක්‍ෂම නොවන බව තහවුරු කිරීම සඳහා මේ වන විට දැවැන්ත ප්‍රචාරණ යාන්ත්‍රණයක්ද දියත් කරමින් තිබේ. ඒ අනුව අපේ රටේ ප්‍රධානතම නිෂ්පාදනය වන කෘෂි කර්මාන්තය සඳහා උපයෝගී කර ගත යුතුව තිබෙන වාරි පද්ධතිය, සංචාරක ව්‍යාපාරය සඳහා යොදා ගැනීම කෙරෙහි සැලසුම් සකස් කිරීම ජනතාව තුළ යුක්ති සහගත කිරීම වෙනුවෙන් වූ ක්‍රියාවලිය හඳුනාගත හැකිය. එසේම රට පුරා විසිරී පවතින මහා වාරි කර්මාන්ත අසල සංචාරක හෝටල් ඉදිකිරීම සඳහා ආණ්ඩුවේ බලධාරීන්ට බලපත්‍ර ලබා දීම මගින්ද තහවුරු වන්නේ ඔවුන් රටේ ප්‍රධානතම නිෂ්පාදනය වෙනුවෙන් තබා තිබෙන බර තැබීමේ ප්‍රමාණයයි. අතිශයෝක්තියක් ලෙස නමුත් අපේ රටේ ඉතිහාසය කියවන විට රට සහලින් ස්වයංපෝෂිත වූ බවත් ධාන්‍ය භාණ්ඩාගාරයත් ආසියාවටම සරිලන ආකාරයට අපේ රට තුළ ස්ථාපිත කර තිබූ බවටත් ඇති සටහන ඉවත ආර්ථිකය ණය ආර්ථිකයක සිට නැතහොත් යැපුම් ආර්ථිකයක සිට නිෂ්පාදන ආර්ථිකයක් දක්වා මාරු කළ යුතුව ඇත. එසේම එකී නිෂ්පාදන කාර්යය සඳහා ජනතාව සම්බන්ධ කරගත යුතුය. සම්බන්ධ වන ජනතාව වෙනුවෙන් එහි ප්‍රතිලාභයන් අදාල පාර්ශවයන්ට සාධාරණ ලෙස බෙදී යා යුතුය. එවැනි ක්‍රමයක් සහිත රටක සංවර්ධනය නතර කිරීමට කිසිවෙකුටත් නොහැකි වනු ඇත. චීනය, වියට්නාමය, උතුරු කොරියාව, එකී නිෂ්පාදන ආර්ථික ක්‍රමයන් අනුගමනය කරන රටවල් කිහිපයකි. එම රටවල්වල ආර්ථික වර්ධනයේ සැබෑ රහස වන්නේද එයයි. එවැනි ක්‍රමයක් අනුගමනය කිරීම සඳහා අපේ රටේ පාලන තන්ත්‍රය සකස් කරගනු ලබන තාක්කල් අපේ රටේ ජනයා මෙකී පීඩාවට ගොදුරුවීමද වළක්වාලිය නොහැකිය. එබැවින් රටේ නිෂ්පාදන ආර්ථික ක්‍රියාවලියක් වෙනුවෙන් ගැලපෙන පාලන තන්ත්‍රයක් සකස් කරගැනීමේ වගකීමෙන් ජනතාවට මගහැර යා නොහැකිය. එම පුරවැසි වගකීම ඉටු කිරීමට අපේ රටේ ජනයා කඩිනම් වන ප්‍රමාණයට සාපේක්ෂව ඔවුන් අත් විඳින ආර්ථික පීඩනයෙන්ද නිදහස්වනු ඇත. එසේම එම පුරවැසි වගකීම ඉටු කිරීමට ප්‍රමාද වන තරමට අපේ රටේ ජනයා මෙකී ආර්ථික පීඩනයේ ගොදුරු බවට පත්වීමද වළක්වා ලිය නොහැකිය.





"ධනේශ්වර පාලකයින් කිසි විටෙකත් පීඩිත ජනතාව කෙරෙහි කම්පාසහගත සිතින් නොසිතන නමුත් එකී ජනතාව ඔවුන් ගැන කම්පා වෙති; සතුටු වෙති. එම කම්පාව සහ සතුට තම පැවැත්මේ උන්නතිය වෙනුවෙන් යොදා ගන්නා පාලකයෝ පෙරළා ජනතාවට දුක හා පීඩනය පමණක් ලබාදෙති".

**එංගලන්ත ජාතික**
**ජෝර්ජ් ඕවල්**



# ගිලී නැසෙමුද එක්ව නැගෙමුද ?

මවක සිය දරුවන් තිදෙනා සමග මාතරින් නිල්වලා ගඟට පැනීමට උත්සාහ කළ පුවතක් පසුගිය කාලයේදී අසන්නට ලැබුණා. එම මව ඉතාමත් කටුක පීඩිත ජීවිතයක් ගත කරන බවත් ඇයට ඇගේ දරුවන් සමග ජීවත් වීමට තරම් ආර්ථික හැකියාවක් නොමැති බවත් ඇයගේ වේදනාභරිත කතාව තුළින් මතු කර තිබුණා. තමාට ගත හැකි එකම විසඳුම අකමැත්තෙන් හෝ දරුවන් සමග ගඟට පැන සිය දිවි නසාගැනීම පමණක් බවත් ඇය පවසා තිබුණා. අද වන විට දහසක් බලාපොරොත්තු සමගින් අලුත් ජීවිතයක් ගත කිරීමට පෙරුම් පුරන තරුණ තරුණියන්ගේද වැඩිවෙන ජීවන වියදම හමුවේ පවුලේ ප්‍රශ්නවලට මුහුණ දෙන කාන්තාවන්ගේද අද දවසේ ඉරණම වී ඇත්තේ දරා ගත නොහැකි සමාජ ආර්ථික ගැටලු නිසා ඉච්ඡාභංගත්වයට පත් වීමත් පමණක් බව වාර්තා වන සිද්ධීන්වලින් ගම්‍ය වේ.

මෙම ගැටලු හමුවේ සිය දිවි නසාගන්නා ප්‍රමාණය හා සියදිවි නසාගැනීමට තැත් කරන වාර ගණන වැඩිවී ඇති බව වාර්තාවලින් ඔප්පු කර පෙන්වයි. නිවස තුළ ඇති සාමයේ දෙව් දුව වෙනුවට නිවස පිරී ඉතිරී ඇත්තේ ආර්ථික අර්බුද හා සදාචාර ප්‍රශ්නවලිනි. සියල්ලටම මිලක් නියමවූ විවෘත ආර්ථික ක්‍රමය නැමති පිළිකාව කාන්තාවත් නිවසත් මුළු සමාජ දේහය තුළටත් මුල් දුවමින් මහා ව්‍යසනයකට පත් කර හමාරය. නිල්වලා ගඟට පැන සියදිවි නසාගැනීමට තැත් කළ මව වැරදිකරුවකු බවට රටේ නීතියෙන් ඔප්පු කිරීමට හැකි වුවත් දරුවන් සමග සතුටින් තවදුරටත් ජීවත් වීමට හැකි නම් ඇය මියයාමට හෝ නීතිය ඉදිරියේ වැරදිකාරිනියක් නොවීමට හැකිව තිබුණා. මෙවන් සිද්ධීන් දිගින් දිගටම සිදුවන වටපිටාවක් තුළ ඔවුන්ගේ ජීවිත අයිතිය උදුරා ගනු ලැබුවේ කවුරුන්ද යැයි සමාජය ප්‍රශ්න කරන බවක් නම් නොහැඟේ. පුද්ගලයින් තම වගකීම්වලින් මිදී තවත් එක් ශෝචනීය කතාවක් ලෙස විග්‍රහ කරමින් සාමාන්‍යකරණයට ලක් කරමින් සිටීම අද විවෘත ආර්ථිකය තුළ ගොඩනැගෙන මිනිසාගේ මිනිස්කම් පවා නිර්වින්දනයට පත්කිරීමට ධනේශ්වර ක්‍රමයට හැකිවී තිබේ. නමුත් ධනේශ්වර ක්‍රමයේ සමස්ත අර්බුදය තුළ මුල් සමාජයත් ඇයත් පත් වී ඇති අර්බුදය නිවැරදිව විග්‍රහ කරමින් ඇයටත් දරුවන්ටත් ජීවත් විය හැකි පරිසරයක් ගොඩනැ-ගීමට වහ වහා සුදානම් විය යුතු බව මෙම සිදධින්වලින් ප්‍රකාශ කරයි.

වර්තමානයේ මෙවැනි සිද්ධීන් සඳහා ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 299 වැනි වගන්තිය යටතේ යම් තැනැත්තෙකු සිය පණ හානි කර ගනු ලැබුවහොත් එසේත් නැති නම් එම ක්‍රියාවට අනුබල දෙන තැනැත්තෙකුට මරණ දඬුවමින් දඬුවම් කළ හැකිය. එසේම ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 203 වගන්තිය යටතේ යම් පුද්ගලයෙක් සිය පණට හානි කර ගැනීමට තැත් කළ හොත් බන්ධනාගාර ගත කිරීම හෝ දඩයක් නියම කිරීමද කළ හැකිය. ආයතනික නීති හා සමාජය විසින්ද සිය පණ නැති කර ගැනීමට තැත් කරන ඇයට ලබා දෙන දඬුවම්වලින් නම් අඩුවක් නොමැත. නීතිය අනුව ඇයටත් ඇගේ දරුවන්ටත් ජීවිතය නැති කර ගැනීමට අයිතියක් නැත. දරුවන්ගේ ජීවිතවල අයිතිය ඇත්තේ සමාජයටය. එබැවින් දරුවන් නිල්වලා ගඟට දැමීමට මවට අයිතියක් නැත.

ඇය සමාජයෙන් හා පාලකයන්ගෙන් අසන පැනය නම් දරුවන් සමග සතුටින් ජීවත්වීම තම එකම කැමැත්ත වුවත් බඩගින්නේ හඬන දරුවන්ට ආහාර ලබා දීමටත් විළිවසා ගැනීමට ඇඳුම් ලබා දීමටත් නොහැකිව ණය වී, අසරණ වී ඇති තමන් හට පිහිට වන්නේ කවුරුන්ද කියාය. "ණය ගත්තා. ජීවත් වීමට විවිධ රැකියා කළා. නමුත් වියදම දරාගන්න බැහැ. ණය ගෙවාගන්න බැහැ. ඉන්න තැනත් සින්න වෙන්නයි යන්නේ. මට වෙන උත්තරයක් නැහැ. මෙම ගැටලු කිසිවක් නොතේරෙන දරුවන්ට රෑ හීනෙන් සුරංගනාවියන් ඇවිත් කිරිත් රසකැවිලිත් ගෙනත් දේවි." යැයි ඇයට දින කීයක් දරුවන් රැවටිය හැකි වේද? ඇගේ කතාව තවත් මව්වරුන්ගේ කතාවක් බව මොනිකා රුවන් පතිරණ කිවිඳියගේ 'ඔබ යෙහෙළිය ඇය ගැහැණිය' යන කවි පොත සනාථ කර සිටියි.

**දරාගත නොහැකි සේ නැගෙන**
**කුසගිනි කඳින්**
**හමන කල ඇගේ දෙතොල**
**සනහමින් ඇල් දියෙන්**
**කිරි අහර රසකැවිලි රැගත්**
**දෙව් සුරඟනන්**
**නිදි පැදුර වෙත එතැයි සිඟිති**
**ඇය නොරවටන්...**

ලංකාවේ ජනගහනයෙන් 3/4 උපයන්නේ ඉතාමත් අඩු ආදායමකි. එම ආදායම දරුවන් තිදෙනෙකුට නොව තනි පුද්ගලයෙකුට ජීවත් වීමට නොහැකි තරමය. ඒ නිසාම කුසගින්නේ මිය යන දරුවන් නිරක්තියෙන් පෙළෙන මවුවරුන් ශරීරයට අවශ්‍ය පෝෂ්‍යදායී ආහාර නොලැබෙන නිසා රෝගාතුර වී ඇති පුද්ගලයන්ගේ ප්‍රමාණයත් දිනෙන් දිනම වර්ධනය වී පවතී. ධනපති ක්‍රමයේ අර්බුදයේ සිරකරුවන්, සිරකාරියන් වී ඇති ඔවුන්ට උරුම කර දී ඇත්තේ,



ගඟට පැන සියදිවි නසා ගනිමින් ගැටලුවට පිළිතුරු සෙවීම වුවත් එවැනි උගුලකට හසුවීමටත් එවැනි තීරණ ගැනීමට ඇයටත් සමාජයටත් අයිතියක් නැත. ඇයට එම ගරා වැටෙන සමාජය තුළ රැකවරණයක් නොමැත.

මෙම ක්‍රමය තුළ රැකවරණය ලැබෙන්නේ පාලක පන්තියේ ආර්යාවරුන්ට පමණි. මහ පොළව සමග පොර බදින දවස පුරා වෙහෙස වන පොදු සමාජය තුළ සිටින ඇයටනම් රැකවරණයක් නොමැති බව, කාන්තා අපරාධ හා වැඩිවන හිංසනයන්වලින්ද තහවුරු වේ.

මොනිකා රුවන් පතිරණ කිවිඳිය තම කවි පොතෙන් උදාහරණ සපයයි.

**මහ පොළව සරු කරන**
**රන් කාසි මිල මවන**
**ලෝකයට මෙහෙකරන**
**නැත ඇයට රැකවරණ...............**

ඇගේ ශ්‍රමයට නිසි මිලක් ධනපති ක්‍රමය තුළ නොලැබෙයි. සමස්ත ජනතාවටම අයිති රටේ පොදු දේපළ පවුල් පාලනයට නතු කර ගනිමින් බුක්ති විඳින පාලකයින් හට ඇගේ නිවැරදි බව නොපෙනේ. ඇගේ ශ්‍රමයේ අයිතිය නොදෙයි. ඇගේ රැකවරණය නොලැබේ. ඒ වෙනුවට පාලකයින්ට ලබා දිය හැකි වී ඇත්තේ, සිය දිවි නසා ගන්නා මව්වරුන්, ළමා ගණිකාවන් සපිරි රටක් යන ආශ්චර්යන්ය. සමස්ත ජනතාවටත් එහි නියෝජනය වන කාන්තාවන්ටත් තම අයිතිය හා රැකවරණය ලැබෙන්නේ, සාධාරණ සමාජයක් තුළ බව ලෙනින් සහෝදරයා විටින් විට තහවුරු කර ඇත. පවත්නා නීති සංග්‍රහයට අනුව ඇය වැරදි කාරියක් කර ඇතත් සැබෑ වැරදිකරුවන් හා ඔබේ අයිතිය අහිමි කළ වැරදිකරුවන් ධනපති පාලකයින්ම නොවන්නේද? එබැවින් නීති අණ පනත්වලින් නියෝජනය කරන ධනපති ක්‍රමයේ උගුලේ වැටී මියදෙනවා වෙනුවට සැබෑ වැරදිකරුවන් නිවැරදිව වටහාගෙන ඔවුන්ට එරෙහිව සංවිධානය වීමත් නැගී සිටීමත් රටේ සමස්ත කාන්තා පරපුරේම යුතුකම හා වගකීම වෙයි. එබැවින් විවිධ ලෙස පීඩාවට පත් වන කාන්තාවන්ටත් වැඩකරන කාන්තාවන්ටත් සමාජවාදී කාන්තා සංගමයේ ආරාධනය වනුයේ සාධාරණ සමාජයක් ගොඩනගා ගැනීමට සමස්ත ජනතාව සමග එකතු වන ලෙසටය.



# ඔබ ගිය මග

නිමක් නැති ජීවන අරගලයෙන් හෙම්බත්ව සිටින බහුතරයක් පීඩිත ජනතාව තමන්ව පෙලන ධනපති ක්‍රමයෙන්ම තමන්ගේ ජීවිතය යදිමින් සිටී. එසේ වන්නේ ඔවුන්ගේ දැක්මල අවබෝධය ධනපති පංතිය විසින් හිතාමතාම අඳුරු අහුමුලු වෙත් ගාල් කරන බැවිනි.
අඳුර පළවා හැරිය යුතුය. අහුමුලු කඩා බිඳ දැමිය යුතුව ඇත. පීඩිත ජනයාට ආලෝකයත්ල තමන්ගේ ජීවිත අත්පත් කරගැනීමට මාර්ගයත් විවරකර දිය යුතුය. එය ලොව ඇති අති සියුම් නිර්මාණශීලීම කාර්ය භාරය වන්නේය.
එය කළ හැක්කේ තමන්ගේ අති උතුම්ම වස්තුව වන ජීවිතය දෙවැනි කොට සළකමින් ජනතාවට ප්‍රේම කරන සැබෑ මින්සුන් ට පමණි. එවන් මිනිසුන්ගෙන් සුසැදි සමාජ ව්‍යාපාරයකට පමණි.
"මිනිසාගේ අති උතුම් වස්තුව ජීවිතයයි. එය ඔහුට ලැබෙන්නේ එක් වරක් පමණි......"
නිකොලායි ඔස්ත්‍රොවොස්කි

**ඔබ මියගොස් නැත**
**ඔබ මිය ගොස් නැත**
**ඔබ මියගොස් නැත**
**වීරුපුත් රුවනේ....**
**නිදහස අගයන සෑම හදක් තුළ**
**ඔබ දිවි ගෙවනා අයුරු පෙනේ.**
**සටන් බිමේ ඔබ විරුවෙකු විය පුත**
**කිසිවිට නොසැලුනු**
**කිසිවිට නොනැමුනු**
**ජනතාවගේ නිදහස උදෙසා**
**ඔබගේ වටිනා ජීවිත කාලය**
**පොදුජන සටනට පුදකෙරුවා....**
**දනින් වැටී ජීවත්වනු වෙනුවට**
**දෙපයින් සිට මිය යාම උතුම් බව**
**මරණය අබියස හඬ නැගුවා.**
**ඒ හඬ පිළිරැව් දී ලොව දස අත**
**නිර්ධන හදවත් පුබුදු වුනා.**
**ඔබගෙන් ගිලිහෙන යුතුකම් රැකුමට**
**දැතින් ගිලිහුන රතු කොඩි ගැනුමට**
**දස දහසින් ජනයා එනවා....**
**ඒ සහයෝගය මැද දිරිමත්වි**
**ඔබ පැතු ලෝකෙට අපි යනවා**
**ඔබ ගිය මග නොසැළී යනවා....!**

# අවි වෙළඳපොළ වෙනුවෙන් අරාබිකරය NATO ග්‍රහණයට

පසුගිය ජුනි 18වැනිදා නේටෝ මහ ලේකම් ඇන්ඩර්ස් රස්මුසේන්, බෙල්ජියමේ බ්‍රසල්ස් අගනුවර උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානයේ (NATO) මූලස්ථානයේදී සෞදි අරාබියේ නියෝජ්‍ය විදේශ අමාත්‍ය නිසාර් මෙඩනි හමුවුණා. මේ ප්‍රවෘත්තිය ජාත්‍යන්තර ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ කැපී පෙනෙන පුවතක් නොවූවා පමණක් නොව වැඩි ගැඹුරක් සොයා යාමට කිසිවෙකු උත්සාහ කළේද නැහැ. එහෙත් එම සිදුවීමට තවත් එක් රාජ්‍යතාන්ත්‍රික හමුවීමකට වඩා වැඩි අර්ථකථනයක් හිමියි. සැබැවින්ම එම හමුව ඇමරිකානු අධිරාජ්‍යවාදය පර්සියානු ගල්ෆ් කලාපය අරභයා තෝරා ඇති නව වැඩපිළිවෙළෙහි තවත් දිගුවක් සටහන් කළා. දෙවන ලෝක යුද්ධයෙන් පසු තෙල් සම්පතින් පොහොසත් මැද පෙරදිග කලාපයේ ආධිපත්‍යය දිනා ගැනීම ඇමරිකානු අවශ්‍යතාවය වූ බව පැහැදිලියි. කුමන්ත්‍රණ, ගිවිසුම් මගින් එය සැලකිය යුතු තරමින් සාර්ථක කරගන්නටද ඔවුන් සමත් වූ නමුත් තමන්ට මුළුමනින් කීකරු මැද පෙරදිග කලාපයක් නිර්මාණය කරගැනීමට හැකි වූයේ නැහැ. අනෙක් අතට ඉරානය වැනි තැනකදී උපක්‍රමය වැරදී වැරදී ගොස් ඇමරිකානුවිරෝධී පාලනයන්ද ස්ථාපිත වුණා. අඩසියවසකට වැඩි කාලයක් ගතවී පැවතියද බලශක්ති මූලාශ්‍රයක් ලෙස මැද පෙරදිග කලාපයේ වැදගත්කම අඩුවී නොමැති වී නොමැතිවා පමණක් නොව එහි භූ දේශපාලනික වැදගත්කම ඉහළ යවා තිබෙනවා. චීනය වැනි රටක් නව ලෝක බලවතෙකු ලෙස මතුවෙමින් තිබියෙදී ඇමරිකා එක්සත් ජනපදය වැනි අධිරාජ්‍යවාදියකුට සමස්ත තෙල් සම්පත තමන්ගේ පාලනයේ ඇති බවට සහතික කරගැනීමට ඇතිවන වුවමනාව තේරුම් ගත හැකියි.

**සෞදියට පාවාඩ**

යුධමය ලෙස මැද පෙරදිග කලාපය තමන්ගේ ග්‍රහණයේ තබා ගැනීමට අමතර වශයෙන් එක්සත් ජනපදය තමන්ගේ ආර්ථික අර්බුදයට විසඳුම් සෙවීම සඳහාද මැද පෙරදිග පාවිච්චි කර ගත් ඉතිහාසයක් තිබෙනවා. ඉරාක ආක්‍රමණය හා ඉරාකය නැවත ගොඩනැගීම යන ක්‍රියාවලි ද්විත්වයම එබඳු ආර්ථික මෙහෙයුම් ලෙසද ගිණිය හැකියි. එහෙත් අපේක්ෂා කළ අයුරින් ලාභදායී ගනුදෙනුවක් කර ගැනීමට අසමත් වූ ඇමරිකා එක්සත් ජනපදය මෙවර ගල්ෆ් කලාපය තමන්ගේ ලාභ උපරිම කරගන්නා අවි වෙළඳාමේ තෝතැන්නක් කර ගැනීමට උත්සාහ කර ගනිමින් සිටිනවා. නේටෝ මහ ලේකම්වරයාගේ සෞදි නියෝජ්‍ය විදේශ අමාත්‍ය හමුව සලකා බැලිය යුත්තේ මෙබඳු පසුබිමකයි. මෙම හමුවේදී නේටෝ මහ ලේකම්වරයා කලාපයේ නේටෝ සහයෝගීතා වැඩසටහනට




එක්වන ලෙසට සෞදි පාලනයට ඇරයුම් කළා. සැබැවින්ම ලොව විශාලතම ඛනිජ තෙල් නිෂ්පාදකයා වන සෞදි අරාබිය 70 දශකයේ සිටම ඇමරිකාවේ හිතවතෙකු වෙනවා. එහෙත් මහ ලේකම්වරයා මේ ඉල්ලා සිටින්නේ, ඉස්තාන්බුල් සහයෝගීතා සංවිධානයේ කොටස්කරුවෙකු වන ලෙසයි; එනම් නේටෝවේ නෛතික කොටස්කරුවෙකු වන ලෙසයි. 2004දී අරඹන ලද මෙම සංවිධානයට පර්සියානු ගල්ෆ් කලාපයේ රටවල් 06න් 04ක් ඇතුළත්. බහරේන්, කුවේට්, කටාර් හා එක්සත් අරාබි එමීර් රාජ්‍යය ඊට අයත් වන අතර තවමත් ඇතුළත් නොවන්නේ ඕමානය හා සෞදි අරාබියයි. පසුගිය සය වසරක කාලය තුළ නේටෝ නාවික සේනාංක සංවිධානයට ඇතුළත් රටවල සංචාරය කර ඇති අතර එම රටවල් කලාපයේ එක්සත් ජනපද යුධ මෙහෙයුම් සඳහා සහය ලබා දෙමින් සිටිනවා. බහරේනය හා අරාබි එමීර් රාජ්‍යය ඇෆ්ගනිස්ථානයේ යුධ මෙහෙයුම් සඳහා එක්වී ඇති අතර කටාරය හා අරාබි එමීර් රාජ්‍යය ලිබියාවේ ගුවන් මෙහෙයුම් සඳහා සය මසක කාලයක් යුධ ගුවන්යානා සැපයුවා. අනෙක් අතට නේටෝ ප්‍රධානීන් එම රටවල ආරක්ෂක කටයුතු 'අධීක්ෂණය' කරමින්ද සිටිනවා. සැබැවින්ම එම අධීක්ෂණය යනු අදාල රට ඇමරිකාවෙන් මිලදී ගත යුත්තේ කුමන අවි ආයුධද යන්න රටේ ආරක්ෂක ප්‍රධානීන්ට යෝජනා කිරීමයි. සෞදිය වැනි මුදල් යහමින් ගැවසෙන තැනක් තවමත් නැටෝවෙන් ගිලිහී තිබීම දැනටමත් ප්‍රමාද වැඩි යැයි ඔවුනට හැඟී ගොස් ඇති. අභිනවයෙන් 'අත්පත් කරගත්' ලිබියාව ඉස්තාන්බුල් සංවිධානයේ මීළඟ සාමාජිකයා වීමේ වැඩි ඉඩකඩක් ඇති අතර සිරියාවේ අසාද් පාලනය පෙරළා ගතහොත් එයද ලෙබනනය හා යේමනයද සාමාජිකයින් විය හැකි රටවල් අතරට ඇතුළත් වෙනවා.

**කපටි ආරක්ෂකයා**

නේටෝව තම අරමුණ ලෙස හුවා දක්වන්නේ, තම සාමාජික රටවල ආරක්ෂාව සැලසීමට ප්‍රමුඛත්වය දැක්වීමයි. නමුත් ගල්ෆ් කලාපයට අදාලව සැලකීමේදී නැටෝව සෑම විටම අනුගමනය කරන්නේ, ආරක්ෂාව පිළිබඳව භීතියක් ඉස්මතු කරමින් බොඩිගාඩ් ස්වරූපයෙන් සල්ලිකාරයින්ගේ සාක්කුවට බැසීමේ 'පික්පොකට් න්‍යායයි'. මෙය මැද පෙරදිගදී සාර්ථක ප්‍රතිඵල ලබා දී තිබෙනවා. ඉරාන තර්ජනය පෙන්වමින් සදාම් හුසේන්ට අවි විකිණූ ඇමරිකාව හුසේන්ගේ අවිවලින් ආරක්ෂාවීමට කුවේටයට, සෞදියට අවි අලෙවි කළා. මේ වන විට එක්සත් ජනපදය 'අලෙවි' කරමින් සිටින්නේ, ඉරානයේ න්‍යෂ්ටික අවි භීතියයි. බටහිර ජනමාධ්‍යවල සහයෝගය ඇතිව ක්‍රියාත්මක එය සාර්ථක අලෙවි උත්තේජකයක් සපයා තිබෙනවා. එක්සත් ජනපද 2012 මුදල් වර්ෂයේ මේ වන විටම ඩොලර් බිලියන 50කට වැඩි වාර්තාගත අවි වෙළඳාමක් කිරීමට ඔවුන් සමත්වී තිබෙනවා. එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ

15වැනි පිටුවට



''විප්ලවය එය විසින්ම ආරක්‍ෂා විය යුතුයි. එය ආරක්‍ෂා වන්නේ එලෙසයි. අපට න්‍යෂ්ටික අවි තිබීම නිසා හෝ අප පොහොසත් නිසා එය ආරක්‍ෂා වන්නේ නැහැ. අප වසර 46ක සම්බාධකවලට මුහුණ දුන්නා. විවිධ බාධක හා හිරිහැර! අපි විශේෂ දුෂ්කර කාලයක් පසුකළා. කිසිම රටක් ජනතාවගේ දේශපාලන කැමැත්ත නැතිව එසේ වන්නේ නැහැ.

**ෆිදෙල් කස්ත්‍රෝ**
**මගේ ජීවිතය**

# වෙනිසියුලානු මැතිවරණ සටන ඇරඹෙයි

වෙනිසියුලානු ජනාධිපතිවරණය මේ වසරේ ඔක්තෝබර් 07වැනි දිනට යෙදී තිබෙනවා. එමගින් 2013 වර්ෂයේ සිට 2019 දක්වා කාලය වෙනිසියුලාව පාලනය කළ යුත්තේ කවුදැයි තෝරා ගැණෙනු ඇති. ඒ තරම් කල් තිබියෙදීත් වෙනිසියුලානු ජනධිපතිවරණය පිළිබඳව උනන්දුවක් ඇතිවීමට හේතු කිහිපයක් බලපෑවා. පළමුවැන්න මෙවර ජනාධිපතිවරණයේදී චාවේස් සමග තරග කරන විපක්ෂ අපේක්ෂකයා තෝරාගැනීම සඳහා පළමුවරට නිලවරණයක් පැවැත්වීමයි. පසුගිය පෙබරවාරි 12වැනි දින පැවති විවෘත නිලවරණයේදී හෙන්රික් කැප්‍රිල්ස් රඩොන්ස්කි ඒ සඳහා තෝරා ගැනුණා. මෙම කතාබහ නැවත අලුත් වූයේ මැතිවරණ කවුන්සලයේ නිල වශයෙන් ලියාපදිංචි වීම් මේ වන විට සිදුවීම නිසායි. ඒ අනුව පසුගිය ජුනි 11වැනිදා ජනාධිපති හියුගෝ චවේස් තම අපේක්ෂකත්වය ලියාපදිංචි කළා. ඒ කොමියුනිස්ට් පක්ෂයද ඇතුළත් වෙනිසියුලානු එක්සත් සමාජවාදී පක්ෂය පෙරටුකොට ගත් මහා දේශප්‍රේමී කඳවුර නියෝජනය කරමිනුයි. මෙයට දේශපාලන පක්ෂ, බහුජන සංවිධාන හා සමාජ ව්‍යාපාර 34,000ක් ඇතුළත් බව සඳහන්. ප්‍රජාතාන්ත්‍රික එකමුතුව නමින් ඒක රාශිවී සිටින වෙනිසියුලානු දක්ෂිණාංශය දේශපාලන පක්ෂ හා සංවිධාන 30ක එකතුවක්.

**දකුණ සැඟවීමට පතෝල මූණක්**

ලියාපදිංචිය සිදු කළ දින චාවේස් විශේෂ ප්‍රකාශයක් කළා. ඒ, නව 'කරාබූබෝ සටනක්' එදින ඇරඹුණු බවයි. 1821 වර්ෂයේ ජුනි 24වැනි දින බොලිවේරියානු නිදහස් සටනේ නායක සිමොන් බොලිවර්ගේ විමුක්ති හමුදා ස්පාඥ්ඥ යටත්විජිතවාදීන්ට එරෙහිව කරාබූබෝහිදී තීරණාත්මක ජයක් ලැබීය. චාවේස් කියා සිටියේ නව සටන, තම නියෝජිතයා ලෙස හෙන්රික් කැප්‍රිලේස් ලියාපදිංචි කර ඇති යැංකිවාදී පැලැන්තියට එරෙහි වූවක් බවයි. මිරන්ඩා ප්‍රාන්තයේ ආණ්ඩුකාරයා ලෙස කටයුතු කරන කැප්‍රිලේස්, චාවේස්ගේ මැතිවරණ ව්‍යාපාරය තුළ ජනප්‍රිය ලෙස නාමකරණය වී ඇත්තේ, 'මාජුන්චේ' ලෙසයි. සැබැවින්ම එහි වෙනිසියුලානු තේරුම වන්නේ 'බාල බඩු', 'සිල්ලර' හා 'පතෝල වැනි'අදහසක්. මේ දක්වා පැවති සියලු ජනමත විමසීමකින්ම පාහේ තහවුරු කර ඇති පරිදි චාවේස් පැහැදිලි වාසිදායක තත්වයක සිටින්නේ ඔහු බලයට ඔසවා තබන ලද ජනතා බලවේග එක ලෙසම තවමත් ඔහුව වැළඳගෙන ඇති නිසාවෙන්. පළමුවැන්න 1999 පළමුවරට බලයට පැමිණි



අවස්ථාවේ සිට වසර 13ක නායකත්ව භූමිකාව තුළ චාවේස් තමන්ගේ ඉහළ ජනප්‍රියත්වය රඳවා ගෙන සිටීමයි. දෙවැන්න රටේ ආර්ථිකයේ හා දේශපාලනයේ සිදුකෙරුණු අධිරාජ්‍යවාදී මැදිහත්වීම් නවතා දමා සිමොන් බොලිවර්ගේ අවසන් නොවූ සිහිනයන් සැබෑ කරගැනීම පිළිබඳ අධිෂ්ඨානයක් ජනතාව තුළ දල්වාලීමට සමත්වී තිබීමයි. මෙම වාසිදායක තත්වයන් පැවතියද මැතිවරණ සටන ලෙහෙසි හා පහසු එකක් වනු ඇතැයි ඉන් අදහස් වන්නේ නැහැ. කැප්‍රිල්ස් ර. ඩොන්ස්කි සතුව මැතිවරණ ව්‍යාපාරය වෙනුවෙන් ඩොලර් බිලියන එකක මුදලක් ඇති බව සඳහන්. එම අරමුදල්වල ප්‍රභවය වෙනිසියුලාවේ තෙල් සම්පත කෙරෙහි ඇස ගසාගෙන සිටින්නවුන් බවද පැවසෙනවා. ඒ අනුව ඔහුගේ ගමන සමාජවාදය හා ධනවාදය අතරින් වැටුණු තෙවැනි මාවතක් ලෙසට අර්ථ ගැන්වීමටත් සුළු ධනේශ්වර ප්‍රතිසංස්කරණවාදී ගමනක් ඔස්සේ ආර්ථිකය ඉදිරියට ගෙන යා හැකි බවට මතයක් තහවුරු කිරීමටත් මැතිවරණ ප්‍රචාරක කටයුතු සිදුවනු ඇති. එම වැඩපිළිවෙළ ටෝනි බ්ලෙයාර්ගේ, බිල් ක්ලින්ටන්ගේ මැතිවරණ ප්‍රචාරය හා සමාන වනු ඇති බව පැවසෙනවා. කෙසේ වුවද ඔහුගේ වැඩපිළිවෙළෙහි අවසානය වනු ඇත්තේ වෙනිසියුලාව පාරජාතික නවයටත්විජිතයක් කිරීම බවත් බොලිවේරියානු විප්ලවය වළ දැමීම බවත් ලතින් ඇමරිකාවේ ඒකාග්‍රතාව අවසන් කිරීම බවත් මහජන ධනය පෞද්ගලිකකරණය කිරීම බවත් සමාජ සේවාවන් කඩාකප්පල් කර දැමීම බවත් විප්ලවීය නායකයින්ට දඬුවම් පැමිණවීම බවත් ග්‍රැන්මා පුවත්පත පවසනවා.

**ඇස් ඇත්තෝ දකිත්වා!**

මේ අතර චාවේස්ගේ ජනාධිපතිවරණ සටන සුවිශේෂයි. එය ප්‍රථම වරට

15වැනි පිටුවට

කවුළුව හැරී තබමි

# නරියා සහ ව්‍යාජ දේශප්‍රේමියා...



දේශප්‍රේමියා යනු තම රටේ සමස්ත ජනතාවට, තමන් උපන් රටට ආදරය කරන සහ ඒ වෙනුවෙන් ප්‍රායෝගිකව මැදිහත්ව කටයුතු කරන මිනිසාය. සෑම කෙනෙකුටම සැබෑ දේශප්‍රේමියෙක් විය නොහැකිය. දේශප්‍රේමී නායකයෙක් වීම ඊටත් වඩා අමාරු කටයුත්තකි. ක්‍රියාවෙන් කෙසේ වුවත් වචනයෙන් දේශප්‍රේමී වූ නායකකාරකාදීහු ගණනාවක් අප රටේ සිටිති. ඔවුන් සියලුම දෙනා අහම්බෙන් සැබෑ දේශප්‍රේමීන්ගේ ගොඩට වැටී ඒ ආනුභාවයෙන් දේශප්‍රේමීන් ලෙසට නාමකරණය වූවන්ය. මේ පිළිබඳව අගනා කථාවක් පැරණි සාහිත්‍යයේ සඳහන්ව ඇත.

දිනක දඩයම් පිණිස ගම්මානයකට පැමිණෙන නරියෙකු ගමේ සිටින බල්ලන්ට හසුවී දිව යන අවස්ථාවේ සායම්කරුවෙකුගේ නිල් සායම් බාල්දියකට වැටේ. නිල් පාට වූ නරියා කැළයට ගිය පසු අමුතු සත්වයෙකු බවට රැවටුණු කැළේ සත්තු නිල්පාට නරියා කැලේ රජා බවට පත්කර ගනිති. පාට මාරු වූවාට මේ නරියෙක් බව දනුම් තේරුම් ඇති සතුන් ප්‍රකාශ කළද, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය අනුව රැවටුන සතුන්ගේ වැඩි කැමැත්තෙන් අමුතු සත්ත්වයා කැළේ රජා බවට පත්කර ගන්නා ලදී. ටික දිනක් යනවිට නරි කෑ ගසන ශබ්දයක් ඇසී තම පරණ පුරුද්ද අනුව නරියා හූ කියන්නට පටන් ගත්තෙන් පාට මාරු වුවාට තමන් රජා බවට පත් කරගත්තේ වැදගැම්මකට නැති නරියෙක් බව තේරුම් ගත් කැළේ සතුන් විසින් නරියා මරා දමන ලදී.

අපේ රටේ වත්මන් නායකත්වයද වැරදීමකින් දේශප්‍රේමී ගොඩට වැටී දේශප්‍රේමය ඇගේ තැවරාගත් නායකයෙකි. මේ නම් සැබෑ දේශප්‍රේමියෙක් යැයි සිතූ ජනතාව බොරු දේශප්‍රේමියා රජකමට පත්කරගන්නා ලදී. දැන් සිදුවෙමින් යන්නේ කුමක්ද? තම පංතියේ හඬ අනුව හඬ නඟන බොරු දේශප්‍රේමියා ජනතාව විසින් හඳුනා ගනිමින් සිටී. නරියාට වූ දේ බොරු දේශප්‍රේමීන්ට සිදුනොවේ යැයි කාට කිව හැකිද?

# එදා, අද සහ කටුවන ...

ජනප්‍රිය නළුවා සහ ප්‍රසිද්ධ නළුවා අතර වෙනසක් ඇත. එමෙන්ම ප්‍රසිද්ධ පුද්ගලයා සහ ජනප්‍රිය පුද්ගලයා අතරද වෙනසක් තිබේ. අප රටේ පමණක් නොව මුළු ලෝකයේම ප්‍රසිද්ධ සහ ජනප්‍රිය පුද්ගලයෝ සිටිති.



අපේ රටේ මෑතකදී ප්‍රසිද්ධියට පත් පුද්ගලයා වූයේ ජුලම්පිටියේ අමරේය. මැදමුලන තුළ ප්‍රසිද්ධියට පත්ව සිටි අමරේ මුළු රටේම ප්‍රසිද්ධියට පත් වූයේ කටුවන පැවැති ජනතා විමුක්ති පෙරමුණේ රැස්වීමකට වෙඩි තබා ජ.වි.පෙ සාමාජිකයින් දෙදෙනෙකු ඝාතනය කිරීමත් සමඟය. පවතින ක්‍රමයේ ආශිර්වාදය සහ රැකවරණය හමුවේ නමින් අමරේ නොවූවත් විවධ නම්වලින් යුත් ජනතාව භීතියට පත්කළ පුද්ගලයෝ සිටියහ. ජුලම්පිටිය අමරේ යනු මේ ලෝකෙට බිහිවෙන විටම පාතාලයේ කෙරුමෙක් වීමට ප්‍රාර්ථනා කරගෙන පැමිණි කෙනෙකු නොවේ. හොඳ මිනිහෙක් වීමට සිටි අමරසිරි, ජුලම්පිටිය අමරේ බවට පත් කළේ පවත්වා ගෙන යන ක්‍රමය විසිනි. ඔහුගේ දෙමව්පියන් අමරේ බිහිකරනු ලැබුවේ ධනපති නායකයින් වෙනුවෙන් කුලියට මිනීමරන මැරයකු කිරිමටද නොවේ. එහෙත් අවසානයේ ඔහුගේ දෙමව්පියන් සහ ඔහුදු සිහිනෙකින්වත් නොසිතූ දාමරිකයෙකු පවතින ක්‍රමය විසින් නිර්මාණය කරදී ඇත. අමරේගේ මැරකම් හමුවේ එක්සත් ජතික පක්ෂය දැඩි කම්පාවෙන් කථා කළද, ජේ.ආර්ගේ සමයේ ගෝනවල සුනිල්, ප්‍රේමදාසගේ කාලයේ සොත්ති උපාලි නිර්මාණය වූ බව අමතක වීමට කල් මදය. චන්ද්‍රිකා සමයේ කඩුවෙල වසන්ත, බැද්දගානේ සංජීව සහ මහින්ද රාජපක්ෂ යුගයේ පොඩි මල්ලී, වම්බොට්ටා සහ ජුලම්පිටියේ අමරේ නිර්මාණය වන්නේ ඒ අනුවය. මෙවැනි මැරවරයින් ඇතුළු රට බියවද්දන පාතාලයට අකමැති කවුරුන් හෝ වේ නම් ඔහු හෝ ඇය ප්‍රථමයෙන් කළ යුත්තේ හොඳ මිනිසුන් සමාජයම පිළිකුල් කරන මිනිසුන් බවට, මැරවරයින් බවට, මුළු සමාජයම බියවද්දන මිනිසුන් බවට පත් කරන සමාජ ක්‍රමය වෙනස් කිරීමට කටයුතු කිරිම නොවේද?

# කිරී අප්පට බල්ලෝ පැනපි...



ඉහළ දමන විට කිසිදු වර්ග කිරීමකින් තොරව කිරිපිටි මිල ඉහළ දැමූ දේශප්‍රේමී , ජනතා හිතවාදී මහින්ද රාජපක්ෂ ආණ්ඩුව කිරි පිටි වර්ග 19ක මිල පහත දැම්මේය.මෙම මිල පහත දැමීම සිදුකරනු ලැබුවේ අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව බව පාරිභෝගික ඇමති ජොන්ස්ටන් ඉතා ආඩම්බරයෙන් ප්‍රකාශ කරන ලදී. දේශප්‍රේමී රාජපක්ෂ විසින් මිල අඩු කරනු ලැබුවේ නෑන් 1, නෑන් 2, නෑන් 3, නෑන් හා 1, නෑන් හි 2, ප්‍රි නෑන්, එන්ෆා ප්‍රෝ ඒ ප්ලස්, ෆ්‍රිසෝ 1, ෆ්‍රිසෝ 2, ෆ්‍රිසෝ කම්ෆෝට්, සිලියා නියුට්‍රිසියන්, සිලියා ඩිවොලොප් 1, සිලියා ඩිවොලොප් 2, සහ ලැක්ටෝජන් සහ කව් ඇන්ඩ් ගේට් යන කිරිපිටි මිලය. කව් ඇන්ඩ් ගේට් අඩුකර ඇත්තේ රුපියල් දෙකකින්ය.

ඉහත කිරිපිටි වර්ග තම නිවෙස්වලට රැගෙන එන්නේද යන්න 88 දෙනෙක්ගෙන් විමසනු ලැබිණි. ලැක්ටෝජන් සහ කව් ඇන්ඩ් ගේට් ඉතා කලාතුරකින් මිලදී ගැනෙන බවත් අනෙකුත් කිරිපිටි වර්ග රැගෙන එනවා තියා දැකලවත් නැති බව ඔවුන් විසින් ප්‍රකාශ කරන ලදී. කඩවල් ගණනාවකින් ඉහත කිරිපිටි තිබේද යන්න විමසූ විට ඔවුන් ප්‍රකාශ කරනු ලැබුවේ විකිණෙන්නේ ඉතා කලාතුරකින් නිසා ලැක්ටෝජන් සහ කව් ඇන්ඩ් ගේට් නොගෙනෙන බවත් අනෙකුත් කිරිපිටි කවුරුත් ඉල්ලන්නේ නොමැති බවත්ය.

රාජපක්ෂ ආණ්ඩුව සිතා සිටින්නේ, මෙරට ජනතාව කැමති තැනකට දැක්කවිය හැකි අමුම අමු හරකුන් රංචුවක් ලෙසය.

# පොලිටිකල් පංතිය

පොලික්කා පංතියට ආවෙම මළ පැනපු මූණක් අරගෙන. කවුරුත් කතාවට ගියේ නැහැ. හම් මල්ල මේසෙ උඩ තියපු පොලිටික්කා හුණු කෑල්ල අතට ගත්ත. බෝඩ් එකේ උඩින් හොරකම කියල ලිව්ව. ඒක මැකුව. ආයිත් අපරාධ කියල ලිව්ව. ආයිත් මැකුවා. නීතිය කියල ලිව්වා. ඒකත් මැකුවා.

''මේ ළමයි දන්නවද මම අද කියන්න ආවෙ මොකක්ද කියලා?'' පංතියම මීක් නැති හින්ද පොලිටක්කම කතාව පටන් ගත්ත.

''හිතා ගන්න පුළුවන් සර්.'' චමියා හොඳ ළමයා වෙන්න බැලුවා. ''නිදන් හොරකන් ගැනනෙ''

''මිනීමැරුම් අපරාධ වෙන එක ගැන නේද සර්?'' අනුරුද්ධියත් අනුගත වෙන්න හැදුවා.

''මං හිතන්නෙ... නීතියේ බිඳ වැටීම ගැන'' මංජුව අමාරුවෙන් කනා බල්ලෙක් ගැහුවා.

''ඔය කෙහෙල්මල් ගැන නෙමෙයි ළමයිනේ. ඕයිට වඩා ලොකු ප්‍රශ්නයක්'' පොලිටික්කගෙ නෝමල් මූඩ් සෙට් වේගෙන යනව.

''එකත් එකටම සර්ට ගෙදර ප්‍රශ්නයක්'' සමන ඉලක්කෙ ගත්තෙ කෝණමානෙ ඇහැට තියල.

''බලන්නකො ළමයි, අපේ ගෙදෙට්ට හොරු පැනලනෙ''

''නෑ....හ්'' මුළු පංතියම එක යායට හීල්ලුව.

''බර ගාණක බඩු අරන්ද සර්?'' සිරිය ඇහුවෙ නැතිවුණ ඒවා අරන් දෙන්න වගේ.

''ඒවා කොහෙද මාත් එක්ක. දොරවල්වලට දාල තියෙන්නෙ ඉංග්ලිෂ් ලොක්'' පොලිටික්ක කොලර් එක අතගෑව.

''මොනවද සර් නැතිවෙලා තියෙන්නෙ?'' වසන්තිය ඇහුවෙ බොක්ක අතට අරගෙන.

''සර්ලගෙ ගෙදර කඩු තිබුණෙ නෑනෙ'' සචිය නොදන්න පණ්ඩිතකමක් ඇදබෑව.

''ලොකු දෙයක් නෙමෙයි. වැරැන්ඩා එකේ තිබුණු පොල් ගෙඩියක්'' පොලිටික්කගෙ උත්තරේට මුළු පංතියම බකස් ගෑව.

''ඇයි පොල් ගෙඩියක් නැති වෙන්න බැරිද?'' පොලිටික්ක සීරියස් ගත්තෙ මූණ රතුවෙයි කියල බයට. ''මට තරහ මුං අපෙනුත් හොරකං කරන්න එනවනෙ''

''අපි හිතුවෙ සර්, රත්තරන් වගේ ඒවා නැති වෙලා ඇති කියලා'' ළඟින්ම හිටපු චමියා ආරක්ෂක පියවරක් අනුගමනය කළා.

''දැන් රත්තරන් හොරකන් කරන්නෙ මොකටද? ගඟට බැස්සම දෝතට ගන්න පුළුවන්නෙ. මහින්ද මහත්තයගෙ පිං බලය තමයි'' පොලිටික්ක කැපුවෙ අධිවේගෙට.

''ඔව් සර්, පිනම තමා. ගඟට ආපු විදිහ ගැනත් මිනිස්සු එක එක කතා කියනව.'' සමන යෝකර් එකක් දැම්ම.

''කතන්දර නම් කියන්න කාට බැරිද?'' පොටික්කා පන්දුව නිදැල්ලේ යන්න ඇරිය. ''මං කියන්නෙ පොල් ගෙඩිය වුණත් හොරකම හොරකමමයි''

''ඒ වුණාට සර් ඕක කාටවත් කියන්න යන්න එපා'' සමන කිව්වෙ හිස්ටීරියාවට ඇහෙයි කියල වගේ වටපිට බලල.

''ඒ මොකද සමන්?'' පොටික්කටත් සීරියස්.

''නැහැ සර්. සර් මහින්ද මහත්තයට බොක්කෙන්නෙ ඉන්නෙ.''

''ඔව් සමන්, අපි හදාගත්ත ආණ්ඩුවනෙ. ඉතින් මොකක්ද කියන්නෙ'' පොටිලික්කට ඉහිලුම් නැහැ.

''ඒකනෙ සර්, ආණ්ඩුවට ලැජ්ජා කරන්න හොඳ නැහැ. දැන් ඒ වගේ තැනක හොරකමක් වෙලා නම් අඩුම ගානෙ ලක්ෂ අසූවෙන් එහා පැත්තෙ නැතිවෙලා තියෙන්න ඕනෙ. ලක්ෂ හතළිහක විතර අත් ඔරලෝසුවක්. ගෙදර එදිනෙදා වියදමට තියා ගත්තු ලක්ෂ තිහ හතළිහක්. බලන්නකො ශිරන්ති මැඩම්ගෙ අයියගෙ ගෙදර. අන්න හොරකන්.'' සමන තප්පරේට කිව්වෙ උසාවිය ගාවදි කැමරාවකට වගේ.

''ළමයි... පාඩමට පොත් ගන්නව'' පොලිටික්ක පොත පෙරළුවෙ මලෙන් බව හැමෝටම දැනුණ.

## 3 පිටුවෙන් මායාවක් හා වංචාවක් වූ...



නීතිය ක්‍රියාවට නැගීමට නොවේ.

පසුගිය කාලය පුරා ලංකාවේ මෙම නිල හා නිල නොවන මැර කල්ලි උපයෝගී කරගෙන ආණ්ඩුව සිදු කර ඇති ප්‍රජාතන්ත්‍රවාදයට අභියෝගයක් වූ ඝාතන, පැහැර ගැනීම්, පහර දීම් රැසක් තිබේ. මීට වසර කීපයකට පෙර මහ මගදී මරා දැමූ මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග මහතාත් අතුරුදහන් කරන ලද මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ මහතාත් ඒ සඳහා උදාහරණ පමණි. වර්තමාන ආණ්ඩුවේ පාලන සමයේදී 2009 වසරේදී ගම්පහදී ජ.වි.පෙ. ක්‍රියාකාරිකයකු වූ නන්දන බාලගේ සහෝදරයා වෙඩිතබා මරා දැමූ අතර ඒ සඳහා තවමත් නීතිය ක්‍රියාත්මක නොවීමත් 2010 වසරේදී අම්බලන්ගො ඩ ජ.වි.පෙ. නාගරික මන්ත්‍රී නයිදුවාවඩු සහෝදරයා පහරදී මරා දැමූ අතර ඒ සඳහාද තවම නීතිය ක්‍රියාත්මක නොවීමත් විසින් පැවසෙන්නේ එම ඝාතන පිටුපස පවතින ආණ්ඩුවේ සම්බන්දතාවයයි. දේශපාලන ක්‍රියාකාරීන්ට වෙඩි තබා හෝ පහර දී මරා දමා නීතිය ක්‍රියාත්මක නොකර සිටීමට හැකි තත්වයක් තුළ තවදුරටත් ප්‍රජාතන්ත්‍රවාදයක් ගැන කථා කිරීම හාස්‍යයක් මිස අන් යමක් නොවේ.

**මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදය**

ලංකාවේ මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදයද අමුතු එකකි. මැතිවරණ යනු ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ එක් ප්‍රබල අංගයකි. සාමාන්‍ය තත්වයන් තුළ පවා ධනේශවර මැතිවරණ සාධාරණ හෝ ප්‍රජාතන්ත්‍රවාදී වන්නේ නැත. බොරු පොරොන්දු දීම්, අල්ලස් දීම්, බිය වැද්දීම්, රාජ්‍ය බලය යොදා ගැනීම්, හොර ඡන්ද දැමීම්, ඡන්ද කොල්ලකෑම් ආදී විවිධ ක්‍රම මැතිවරණවලදී යොදා ගන්නා බැවින් සාමාන්‍ය තත්වයන් තුළ පවා ධනේශ්වර මැතිවරණ සාධාරණ හෝ ප්‍රජාතන්ත්‍රවාදී වන්නේ නැත. ඊටත් අමතරව වර්තමාන ආණ්ඩුව මැතිවරණ පැවැත්වීමේදී ඒවා නියමිත වෙලාවේ පවත්වනවා වෙනුවට තමන්ට වාසිදායක අවස්ථාවල මැතිවරණ පැවැත්වීම හා අවාසිදායක අවස්ථාවල මැතිවරණ නොපවත්වා සිටීමේ ක්‍රමයක්ද අනුගමනය කරයි. වර්තමාන ආණ්ඩුව 2010 දී ජනාධිපතිවරණය පැවැත්වූයේ, නියමිත කාලය තුළ නොව නියමිත කාලයට වසර දෙකකට පමණ පෙරය. පසුගිය පළාත් සභා මැතිවරණ පැවැත්වූයේද නියමිත කාලයට පෙර තමන්ට වාසිදායක වෙලාවක කොටස් වශයෙන් ඡන්ද තබමිනි. එම මැතිවරණවලදී රාජ්‍ය බලය යෙදවීමද උපරිම ලෙස කරන ලදී. ජනාධිපතිවරයා මැදිහත් වී ආහාරපානවලින් සංග්‍රහ කිරීම (දන්සැල් දීම) අල්ලස් ගණයට වැටෙන විවිධ භාණ්ඩ බෙදා දීම ආදිය සිදුකළ අතර පළාත් පාලන මැතිවරණවලදී ජනාධිපති බලය, පාර්ලිමේන්තු බලය හා පළාත් සභාවල බලය ඒ සඳහා යොදා ගන්නා ලදී. එසේම පළාත් සභා මැතිවරණයේදී ජනාධිපති බලය, පළාත් පාලන ආයතනවල බලය යොදා ගන්නා අතර ජනාධිවරණයේදී අනෙක් ආයතනවල බලය යොදා ගන්නා ලදී. ඒ අනුව පවත්වන එක් මැතිවරණයකදී ඒ මොහොතේ ක්‍රියාත්මකව පවතින ආණ්ඩුවේ බලය තිබෙන ආයතන සියල්ල ඒ සඳහා යෙදා ගැනීම සිදු කරයි. එලෙස පවත්වන මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදය ලෙස ලැජ්ජාවකින් තොරව නම් කෙරේ. මේ සියල්ල විසින් පෙන්වන්නේ, ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය මායාවක් හා වංචාවක් බව මිස අන් යමක් නොවේ.

**ධනවාදයේ අර්බුදය හා ප්‍රජාතන්ත්‍රවාදය**

සිදුවෙමින් පවතින සියල්ල විසින් පෙන්වා දෙන්නේ, ධනවාදයේ වත්මන් අර්බුදය විසින් සීමිත ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය පවා අහෝසි කරමින් තිබෙන බවය. වත්මන් අර්බුදය තුළ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය පවා ලබා දීමට ධනපති පංතියට හැකියාවක් නැති බවත් ඔවුන් එය දිනපතා අහෝසි කරමින් සිටින බවත් දැන් පැහැදලිය. දුප්පත්කම එළිපත්ත පැන ගෙට ඇතුල්වන විට ආදරය පැළදොරින් පලා යන්නේ යයි ජනසමාජයේ කියමනක් තිබේ. දැන් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයට සිදු වී තිබෙන්නේද එයමය. ධනපති ක්‍රමයේ අර්බුදය ආණ්ඩුවේ එළිපත්ත පැන ගෙට වන විට ප්‍රජාතන්ත්‍රවාදය පැළදොරින් පලා යමින් තිබේ. සැබෑලෙසම වටහා ගන්නේ නම් ධනවාදයේ අර්බුදය විසින් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ ගෙල සිරකර මරා රහසේම වළලා දැමීමට ධනපති පාලකයින්ට බලකර තිබේ. මේ අප ඉදිරියේ සිදුවෙමින් තිබෙන්නේ එයයි.

එබැවින් දැන් පාලක පංතියෙන් ප්‍රජාතන්ත්‍රවාදය දිනාගත හැකියයි මිත්‍යාවක අප සිටිය යුතු නැත. එහෙත් ධනවාදය පවතින තාක් ධනපති ක්‍රමය තුළ සීමිත ප්‍රජාතන්ත්‍රවාදය සඳහාද අප සටන් කළ යුතුය. අරගල කළ යුතුය. නමුත් එය ලබා දීමට ධනපති ක්‍රමය අසමත් නිසා ධනපති ප්‍රජාතන්ත්‍රවාදය වළදමමින් සිටින ධනපති ක්‍රමයද වළදමා සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය හෙවත් නිර්ධන පංති ප්‍රජාතන්ත්‍රවාදය දිනා ගැනීම සඳහා ධනවාදයට එරෙහිව ධනවාදය පැරදවීමේ සටනට සූදානම් විය යුතුය; බලවේග සූදානම් කළ යුතුය. ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන, එය අගයන බලවේගයන් හමුවේ ඇති මාවත එය පමණි. ඒ හැර වෙනත් විකල්පයක් නැත.

## 5 පිටුවෙන් අධ්‍යාපනය නිදහස්...



හැකියැයි අපට විශ්වාසයි.

***නියමුවා: විවෘත ආර්ථිකය තුළ ගොඩ නැගුණු වත්මන් ශිෂ්‍ය ප්‍රජාව දේශපාලන ක්‍රියාකාරිත්වයෙන් වියෝ වෙමින් යන බවට චෝදනා නැගෙනවා. මේ පිළිබඳව ඔබේ අත්දැකීම.***

***නලින්ද ජයතිස්ස සහෝදරයා:*** සමස්ත සමාජය තුළම යම් දේශපාලනික උදාසීනත්වයක් ඇති බව අපට පේනවා. ශිෂ්‍යයන් තුළත් එය යම් පමණකට පරාවර්තනය වෙනවා. නමුත් මේ කරුණට වඩා ප්‍රමුඛ වී ඇත්තේ, ශිෂ්‍යයන් සම්ප්‍රදායික දේශපාලන ක්‍රියාමාර්ගවලින් දුරස්වීමයි. නවීන තාක්ෂණය නිතර පරිහරණය කරන ඔවුන් තමන්ගේ මනෝභාවයන් ප්‍රකාශ කිරීමට වඩා නූතන ක්‍රමවේද යොදා ගන්නවා. අපගේ වගකීම ශිෂ්‍යයන්ට බැණවදිමින් ඔවුන් දේශපාලන ක්‍රියාකාරිත්වයට එනතුරු පසෙකටවී බලා සිටීම නොවේ. ශිෂ්‍යයාගේ මනෝභාවයන් තේරුම් ගනිමින් නව සටන් සම්ප්‍රදායන් ඔස්සේ ඔවුන් සංවිධානය කිරීම; විප්ලවය සඳහා සූදානම් කිරීම. අප්‍රතිහත ධෛර්යයෙන් ජයග්‍රහණය පිළිබඳ විශ්වාසයෙන් හා ඉවසීමෙන් බලවේග සංවිධානය කළොත් තත්වයන් පිම් පනිමින් වෙනස් වෙනවා. ලතින් ඇමරිකාවෙත් යුරෝපයේත් ශිෂ්‍ය අරගලවලදී අප ලබාගන්නා අත්දැකීම එයයි.

***නියමුවා: අභිනවයෙන් ගොඩ නැගුණු අධිරාජ්‍යවිරෝධී ජනතා ව්‍යාපාරය බලවේගවල එකතුවක්. ඒ තුළ ලාංකේය ශිෂ්‍ය ව්‍යාපාරයේ භූමිකාව කවරාකාරද?***

***නලින්ද ජයතිස්ස සහෝදරයා:*** පැවති එජාප ආණ්ඩු වගේම මහින්ද රාජපක්ෂ ආණ්ඩුවත් අපගේ මාතෘභූමිය අධිරාජ්‍යවාදයට යටත් කර තිබෙනවා. අධිරාජ්‍යවාදී කොන්දේසි අනුව අධ්‍යාපන ප්‍රතිපාදන කප්පාදුවට පෞද්ගලික විශ්වවිද්‍යාල පනත ගෙනඒමට ග්‍රාමීය පාසල් වසා දැමීමට පෞද්ගලික විශ්වවිද්‍යාල ඇරැඹීමට ආණ්ඩුව ක්‍රියාකරනවා. ඊට අමතරව මේ වනවිට විශ්වවිද්‍යාල පද්ධතිය සතු ඉඩම් බහුජාතික සමාග ම්වලට විකිණීම පටන් අරන්. රාජගිරිය දේශීය වෛද්‍ය විද්‍යාල භූමියේ කොටසක් ඉන්දියාවේ ඇට්ලන්ටිස් නම් සමාගමට ඇති සුඛෝපභෝගී මහල් නිවාස සංකීර්ණයක් සඳහා විකුණා තියෙනවා. කොළඹ සෞන්දර්ය විශ්වවිද්‍යාල භූමියේ කොටසක් හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ හන්තාන කොටසේ අක්කර ගණනාවක් පෞද්ගලික විශ්වවිද්‍යාල ගොඩනැගීම සඳහා විකිණීමට සූදානම්. කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාල භූමිය ගුවන් තොටුපළක් ඉදිකිරීමට පවරා ගැණෙනවා.

මේ මොහොතේ නිදහස් අධ්‍යාපන අයිතිය රැකගැනීමේ සටන යනු අධිරාජ්‍යවිරෝධී අරගලයේ අත්‍යාවශ්‍ය කොටසක්. ඒ අනුව 'නිදහස් අධ්‍යාපනය සුරැකීමේ ජාතික ව්‍යාපාරය' ලෙස අප අධිරාජ්‍යවිරෝධි ජනතා ව්‍යාපාරය නියෝජනය කරනවා. ඒ වෙනුවෙන් ලාංකේය ශිෂ්‍ය ව්‍යාපාරය පෙළ ගස්වනවා. අධිරාජ්‍යවිරෝධී අරගලය සමාජවාදී ශ්‍රී ලංකාවක් ගොඩනැගීමෙන් කෙළවර වන බවට අපට විශ්වාසයි.

## 4 පිටුවෙන් අන්තිම දුම්රිය වෙනුවට...



පොරොත්තුවක් උපනි. කෙසේ නමුත් එම සිහින් බලාපොරොත්තු උපන් ගෙයිම මියයෑමට දූන් දූන් පටන් ගෙන ඇත. උතුරේ ජාතිවාදී නායකයන්ගේත්, දකුණේ ජාතිවාදී නායකයන්ගේත්, අධිරාජ්‍යවාදීන්ගේ මැදිහත් වීම හා ප්‍රකාශ තුළින් කියාපාන්නේ එයයි.

ලංකාවට මෙන්ම, ලෝකයටද ආර්ථිකය ඉතා බරපතළ අර්බුදකාරී තත්වයකට පත්ව ඇති අතර එය මෙම ධනේශ්වර ක්‍රමය තුළද පැලැස්තර අලවනවා මිස විසඳුම් නැත. එයට ඇති එකම විසඳුම සමාජ පරිවර්තනයකි. එසේම අද ලංකාව තුළත් ලෝකය තුළත් ඇති තිබෙන ජාතිවාදි හා බෙදුම්වාදි අර්බුදයද ධනේශ්වර සමාජ ක්‍රමයේ ප්‍රකාශයකි. ඒ සඳහා හොඳම උදාහරණය ලංකාව බව පසුගිය අවුරුදු තුන තුළ ඔප්පු වී හමාරය. එබැවින් ලාංකීය ජාතික සමගිය ද ගොඩනැගිය හැක්කේ මෙම ක්‍රමය වෙනස් කර සමාජවාදී සමාජ ක්‍රමයකට පමණි.

ජාතිවාදය, බෙදුම්වාදය පරාජය කොට ජාතික සමගිය ගොඩනැගිමෙහිලා විශාල කාර්ය භාරයක් ලාංකීය තාරුණ්‍යය සතුය. තාරුණ්‍යය නැවුම්ය, තාරුණ්‍යය වෙනස්ය, තාරුණ්‍යය ජවසම්පන්ය. ඉදින් මේ නැවුම් තාරුණ්‍ය වෙනස් තාරුණ්‍ය ජවසම්පන්න තාරුණ්‍ය ජාතිවාදී විය හැකිද? නැත. එම නිසා ලාංකීය ජාතික සමගිය ගොඩ නැගීම අලුත් සමාජයක් ගොඩනැගීමේ කාර්යය බාරය අප තරුණයා සතුය. ඒ සඳහා චේ ගුවේරා සහෝදරයාගෙන් උගෙනගත හැක. ආජන්ටිනාවේ ඉපදී, කියුබාවේ විප්ලවයේ අතිවිශාල කාර්ය භාරයක් සිදු කොට බොලිවියානු ජනතාවගේ විමුක්තිය සොයා ගිය චේ බොලියාවේදී මිය ගියේය. ඒ ඔහුට ජාතිවාදී, ජාතිකවාදී හැඟීමක් ඔහු සතු නොවුණු නිසාය. ඔහු මුළු ලෝකයටම ආදරේ කළ නිසාය. ඔහු ජාත්‍යන්තරවාදී වූ නිසාය. ඒ නිසා සමාජවාදී තරුණ සංගමයේ අපි ලාංකීය ජාතික සමගිය ගොඩනැගීමෙහිලා කැපවන්නෙමු. ඒ සඳහා නායකත්වය දීමටත් පෙරමුණ ගැනීමටත් සූදානම්ය. ආදරණීය සොයුර සොයුරිය ඔබගේ ජාතිවාදී, ආගම්වාදී පසුගාමී බැම්වලින් මිදෙන්න. ඒ බැම් කඩා බිද දමන්න. ජූලි 23 දා සහෝදරත්වයේ දුම්රියට එක්වන්න ලාංකීය ජාතික සමගිය නැමති ශක්තිමත් පවුර ගොඩ නැගීමට ඔබේත් අපේත් දෑත් එක් කරමු. එය අපිට පැවරී ඇති කාර්යභාරයයි.

## 13 පිටුවෙන් අවි වෙළඳපොල...




දේශපාලන-හමුදා කටයුතු පිළිබඳ සහකාර ලේකම් ඇන්ඩෘ ශපිරෝ කියා සිටින්නේ, තම මිතුරු රටවල ආරක්ෂක සහයෝගීතාවයේ ඉලක්කය ඇමරිකාවේ ජාතික ආරක්ෂාව හා ආර්ථික සමෘද්ධිය විය යුතු බවයි. එක්සත් ජනපද විදෙස් පිළිවෙතට අනුකූල ලෙස සියලු අවි ගනුදෙනු සිදු කිරීමේ හා අධීක්ෂණය කිරීමේ බලාධිකාරය රාජ්‍ය ලේකම්වරියට පවරා තිබීම රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ආර්ථික ප්‍රයත්නයේ වැදගත් පියවරක් බව ඔහු කියනවා. මෙහි සරලම අර්ථය ඇමරිකාව යුධ අවි විකුණාගැනීම සඳහා නේටෝ සාමාජික රටවල් 'කඩේ යවමින්' සිටින බව මිස වෙනකක් නෙමෙයි.

තුර්කිය ඇතුළු මැද පෙරදිග නේටෝ සාමාජික රටවල් සහභාගි කරගනිමින් පවත්වන යුධ අභ්‍යාසයන් අවි වෙන්දේසියකට වෙනස් වන්නේ නැහැ. මේවායේදී බොරු සතුරන්ට එරෙහිව 'සාර්ථකව' ක්‍රියාත්මක වන ඇමරිකානු ගුවන්යානා, හෙලිකොප්ටර්, නෞකා, බෝම්බ, මිසයිල වැනි අවිවල 'විශිෂ්ටත්වය' විදහා පානු ලබනවා. ඒ එමගින් එම අවි මිලට ගැනීම සඳහාත් එවැනි ශක්තිමත් 'පියාපත් සෙවණකට' යාම සඳහාත් ආරාධිත රටවලට දැඩි පෙළඹවීමක් ඇති කිරීම සඳහායි. 2010දී සෞදි අරාබිය සමග ලොව විශාලතම ද්වීපාර්ශවීය අවි ගනුදෙනුව (ඩොලර් බිලියන 67) සිදුකරගැනීමට එක්සත් ජනපදය සමත් වූයේ මෙබඳු ඇස්බැන්දුම් මගිනුයි. පසුගිය දෙසැම්බරයේදී එක්සත් අරාබි එමීර් රාජ්‍යය ඔෘ මිසයිල 96ක් එක්සත් ජනපදයෙන් මිලදී ගත්තා. ප්‍රචාරණ කටයුත්ත කෙතරම් හොඳින් සිදුකෙරුණේද යත් අරාබි එමීර් රාජ්‍යය නේටෝ මූලස්ථානයේ තානාපති කාර්යාලයක් විවෘත කළ පළමු අරාබි රට බවට පත්වුණා.

**කිඹුල් කඳුළු**

දැන් එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට අවශ්‍ය වනුයේ, බොරු සතුරන් මවා ගෙන කරනු ලබන යුද්ධයක් නොව සැබෑ සතුරෙකුට පහර දෙනු පෙන්වා මැද පෙරදිගින් නේටෝවට සාමාජිකයින් එකතු කර ගැනීමයි. ඒ මගින් එක්සත් ජනපද බංකොලොත්භාවය කල් දමා ගැනීම සඳහා මුදල් ගැවසෙන නව පාරිභෝගිකයින් පිරිසක් දිනාග ැනීමට ඔවුන් අපේක්ෂා කරනවා විය හැකියි. අලුත බිහිවූ පැරණි සෝවියට් රටවල් නේටෝවට බඳවා ගැනීම සඳහා යුගොස්ලාවියාවට පහර දෙනු පෙන්වූවා සේ සිරියාව හෝ ඉරානය ඉලක්ක ලෙස භාවිත කළ හැකි දිනයක් එන තෙක් ඔවුන් ගණන් බලමින් සිටිනවා. සිරියාවට පහර දීම සඳහා එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයට ගෙන එන ලද යෝජනා රුසියාවේ හා චීනයේ විරෝධය මැද අකුළා ගැනීමට සිදුවීම පිළිබඳව රාජ්‍ය ලේකම්වරියගේ නොඉවසිල්ල මෙම වචනවලින් ප්‍රකාශ වූවා. "ඔවුන් එරෙහි වන්නේ හුදු සිරියානු ජනතාවගේ අපේක්ෂාවනට පමණක් නොව සමස්ත අරාබි වසන්තයටමය; අරාබි නැගිටීමටමය." තමන්ගේ පාලනයට යටත් නැගිටීම් මගින් අත්ලාන්තික් සාගරයේ සිට පර්සියානු ගල්ෆ් කලාපය දක්වා යුධවාදී, රාජාණ්ඩුවාදී හා ආගම්වාදී පාලනයන් බිහි කිරීමට ඇමරිකානු අධිරාජ්‍යවාදයේ හා එහි සහායක රටවල්වල ඇති වුවමනාව මෙම ප්‍රකාශය මගින් කදිමට නිරූපනය කෙරෙනවා.

## 13 පිටුවෙන් වෙනිසියුලානු...



අපේක්ෂකයෙකුගේ පොරොන්දු රහිත මැතිවරණ ව්‍යාපාරයක්. ඔහු විපක්ෂයේ මාධ්‍ය ප්‍රහාරයන්ට සුපුරුදු එක් වාක්‍ය ඛණ්ඩයකින් පිළිතුරු දෙනවා. එහි සිංහල භාෂා අර්ථය නම්, 'ඇස් ඇත්තෝ දකිත්වා!' (Let those who have eyes, see!) යන්නයි. ජනතාව එය ඒත්තු ගෙන ඇති බව කෙනෙකුට තේරුම් යාම සඳහා ඔවුන් විසින් බිත්තිවල ලියනු ලැබ ඇති 'ආපසු යාමක් නැහැ' වැනි තේරුම ඇති ප්‍රකාශ ප්‍රමාණවත්. සැබැවින්ම වසර 13ක කාලය තුළ බොලිවේරියානු විප්ලවය විසින් වෙනිසියුලාවට දිනා දී ඇති දේ, දෑසින් දැක තේරුම් ගැනීමටත් වඩා පුළුල් වපසරියකින් යුක්තයි. වෙනිසියුලාව මුළුමනින්ම සාක්ෂරතාවයෙන් යුත් රටක් ලෙස යුනෙස්කෝව ප්‍රකාශයට පත්කළේ, 2005 වර්ෂයේදීයි. මේ වන විට ලතින් ඇමරිකාවේ දෙවැනියට මෙන්ම ලෝකයේ පස්වෙනියට විශාලතම විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන ජනගහනය සිටින්නේ එහියි. විවිධ මට්ටම්වල අධ්‍යාපන කටයුතු සඳහා කෝටියකට (මිලියන 10) වැඩි වෙනිසියුලානුවන් සංඛ්‍යාවක් දිනපතා පංතිවලට සහභාගි වෙනවා. වසර 10ක කාලයක් තුළ නව පාසල් 4500ක් සහ උසස් අධ්‍යාපන ආයතන 15ක් ඉදිකරනු ලැබ තිබෙනවා.

සමාජීය ආයෝජනයන්හි ප්‍රතිඵල දිරිගන්වන සුළුයි. අන්ත දරිද්‍රතාවය සියයට 22.2 සිට 10.7 දක්වා පහත වැටී තිබෙනවා. බීමට සුදුසු ජලය සඳහා ප්‍රවේශය ඇති ප්‍රතිශතය 96ක්. ලක්ෂ 13කට වැඩි විශ්‍රාමිකයනට විශ්‍රාම ආරක්ෂණ දීමනා හිමියි. 1999දී 14.6ක් වූ විරැකියා ප්‍රතිශතය 7.4 දක්වා පහත වැටී තිබෙනවා. කලින් සමාජයෙන් පිටමන් කළවුන්ද ඇතුළත් සියලු දෙනාට ඔවුන්ගේ ගරුත්වය රැකෙන පරිදි ඉහළ සමාජ සුභසාධනයක් ක්‍රියාත්මකයි. ඇස් ඇතිවුන් ලෙස මේ සියලු දේ දකින වෙනිසියුලානු ජනතාවට වෙනත් තෝරාගත හැකි විකල්පයක් නොමැති බව පැහැදිලියි.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com


## ජූලම්පිටියේ අමරෙලා හදන දේශපාලන ක්‍රමය පරාජයට පත්කළ යුතුයි

**ජනතා විමුක්ති පෙරමුණ**





ඝාතන සංස්කෘතිය නැවැත්විය යුතුව ඇති බවත් ජූලම්පිටියේ අමරේ වැනි තනි තනි පුද්ගලයන් පැරදවීමෙන් එය සිදු කළ නොහැකි බවත් පැවසූ ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා ඒ සඳහා ජූලම්පිටියේ අමරෙලා හදන ඔවුන් රකින දේශපාලන ක්‍රමය පරාජයට පත්කළ යුතු බව අවධාරණය කළේය.

ඔහු මේ බව කියා සිටියේ පසුගිය 20වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය සාකච්ඡාවකදීය.

මෙම සාකච්ඡාව සඳහා දේශපාලන මණ්ඩල සභික අනුර දිසානායක සහෝදරයාද එක්වී සිටි අතර ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා වැඩිදුරටත් මෙසේ අදහස් දැක්වීය.

"පසුගිදා කටුවනදී සිදුවූ ද්විත්ව ඝාතනය සම්බන්ධයෙන් ආණ්ඩුව කටයුතු කරමින් ඉන්නේ පැටලිලි සහගත ආකාරයකටයි. 15 දින ජනතා විමුක්ති පෙරමුණේ ජනහමුවට මැරකල්ලියක් විසින් වෙඩි තබලා දෙදෙනෙක් ඝාතනය වුණා. ඒ සමගම සමාජයේ විශාල ආන්දෝලනයක් මතුවුණා. ඒත් සමගම ආණ්ඩුවට මෙම සිද්ධියෙන් මගහැර යෑමට නොහැකි තත්වයක් උදා වුණා. ඒ අතර ඊයේ අපට වාර්තා වුණා, මේ සිද්ධියේ ප්‍රධාන සැකකාරයා වන ජූලම්පිටියේ අමරේ අධිකරණයට බාරවුණා කියලා. මෙයින් ආණ්ඩුව උත්සාහ දැරුවේ මෙම ඝාතනයට සම්බන්ධ පුද්ගලයා බාරවුණා කියලා කීමටයි. එක් පැත්තකින් ආණ්ඩුවට එරෙහිව එල්ලවන විරෝධය මගහරවා ගැනීමටත් එම ඝාතනයට සම්බන්ධ පුද්ගලයාට එල්ලවන ජනතා විරෝධයෙන් ඔහුව බේරාගැනීමටත් ආණ්ඩුව මෙමගින් උත්සාහ කරනවා. ඒ නිසා මේ බාරවීම, ආණ්ඩුවත් ආරක්ෂා වෙලා අමරේත් ආරක්ෂා කරන්න කරපු දෙයක් විදියටයි අපි දකින්නේ. මෙම ඝාතනයට පිටුපස ආණ්ඩුව ඉන්නවා. ඒක අපි තහවුරු කරලා කියනවා. විශේෂයෙන් හම්බන්තොට ආණ්ඩුවේ බලධාරීන් මේ පිටුපස ඉන්නවා. මේ සිද්ධිය සිදුවූ දින සිට පුදුම හිතෙන විදියේ නාට්‍යාකාරයක් තියෙනවා. ඒ නිසා එයින් පැහැදිලි වෙනවා ආණ්ඩුවත්, ආණ්ඩුවේ බලධාරීනුත්, ඔවුන්ගේ උපදෙස් පරිදි පොලීසියත් ක්‍රියාකර තිබෙන්නේ ඝාතනයට සම්බන්ධ පුද්ගලයන් පිළිබඳ පරීක්ෂණ පවත්වනවා වෙනුවට අපරාධකරුවා බේරාගනිමින් මේ වගකීම වෙනත් අය වෙත පැටවීමේ ආකාරයකටයි.

එකක් තමයි මේ සිද්ධිය 15 වෙනිදා 7 පමණ වෙනකොට සිදුවුණා. සාක්ෂි දීපු අය කියන විදියට ඉතාම දැඩි ආරක්ෂාවක් තියෙන මේ ප්‍රදේශයේ බයික් 04කින් 08 දෙනෙක් පමණ ඇවිත් වෙඩි තියලා තියෙනවා. දෙනෙක් මියගියාට පස්සෙත් ගේ ඇතුළට පැනලා ගෙදර අය සොයමින් ඒ අවට නවතා තිබූ යතුරුපැදි, ත්‍රීවිල්වලට අලාභහානි කරමින් විනාඩි 20-30ක් විශාල විනාශයක් කරලා තියෙනවා. නමුත් පොලීසියෙන් මැදිහත් වෙන්නේ නැහැ. ජනහමුවත් තියෙන බව පොලීසිය දැනගෙන ඉඳලා තියෙනවා. සිද්ධිය වුණාට පසුව එතැන සිටි අය පොලීසියට හදිසි ඒකකයට දැනුම් දෙන්න උත්සාහ කරද්දිත් ඒ නිලධාරීන් සම්බන්ධ කර ගන්න බැරි තත්වයක් උදා වෙලා තියෙනවා. මැරයින්ට පුළුවන් වුණා කිසියම් කාලයක් එතැන ඉඳගෙන අපරාධය සිදුකරලා පලා යන්න. ඉන් අනතුරුව ඝාතනයට ලක්වූවන් සහ තුවාලකරුවන් රෝහලට ගෙනගොස් අනතුරුව රාත්‍රී නවයට පමණ පැමිණිලි කිරීමට පොලිසියට යනවිට, ඇත්තටම පැමිණිල්ල කරලත් නැති අවස්ථාවක ආණ්ඩුවේ ජාතික ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය මධ්‍යස්ථානය ලවා පවසනවා, මේ සිද්ධිය ජවිපෙ දෙපිරිසක් අතර ඇතිවූ දෙයක් කියලා. ගැටලුව තියෙන්නේ කිසිදු පරීක්ෂණයක් ආරම්භ කොට නැති, කට උත්තරයක්වත් දී නැති අවස්ථාවක ආණ්ඩුව කියන්නේ කොහොමද මේක ජවිපෙ දෙපිරිසක් අතර ඇතිවූවක් කියලා. එකෙන් පැහැදිලි වුණා පළමුව කලබල වුණේ ආණ්ඩුව. කවුරුත් කියන්න කලින් ආණ්ඩුව උත්සාහ දැරුවා මේක වෙන කෙනෙක්ගෙ පිටින් යවන්න. ආණ්ඩුව එල්ල වෙන චෝදනාවෙන් ගැලවෙන්න ආණ්ඩුව උත්සාහ දැරුවා කියලා ඉතාම පැහැදිලියි.

ඒනිසා ආණ්ඩුවේ මේ ලැජ්ජා නැති ක්‍රියාදාමය හෙළා දකිනවා. ප්‍රජාතන්ත්‍රවිරෝධී ක්‍රියාදාමය හෙළා දකිනවා. අපි බලකරනවා ආණ්ඩුව මේ ප්‍රශ්නය යටගහන්න දෙන්න එපා කියලා. අපි යටගහන්න දෙන්නෙත් නැහැ. දැන් බාරවුණා කියලා මේ සිද්ධිය යටගහන්න පුළුවන්න පුළුවන්කමක් නැහැ. මේ සිද්ධියට සම්බන්ධ සියලු දෙනා අත්අඩංගුවට ගන්න ඕනෑ. ගිනි අවි අත්අඩංගුවට ගන්න ඕනෑ. ආණ්ඩුව වගකීම බාරගත යුතුව තියෙනවා. ජනතා විමුක්ති පෙරමුණ මැදිහත් වූ නිසා තමයි අඩුගානේ ජූලම්පිටියේ අමරේ උසාවියට බාරවුණේ. සාමාන්‍ය පුද්ගලයෙකුට මෙය සිද්ධ වුණා නම් පැමිණිල්ල දාපු කෙනත් මැරිලා. ජ.වි.පෙ. මැදිහත් වුණ නිසා ආණ්ඩුවට මැදිහත් වෙන්න සිද්ධ වුණා. අපි මේ ප්‍රශ්නය සුළුකොට තකන්නේ නැහැ. මේ ඝාතන සංස්කෘතිය නවත්වන්න ඕනෑ. එය නවත්වන්න ජූලම්පිටියේ අමරේ වගේ තනි තනි පුද්ගලයන් පරද්දලා නෙවෙයි එය කරන්න පුළුවන් වන්නේ. ඔවුන් හදන රකින, ආරක්ෂා කරන දේශපාලන ක්‍රමය පරාජයට පත්කරන්න ඕනෑ. ඒ වෙනුවෙන් සියලු බලවේග සටන් කරන්න ඕනෑ.

## අර්බුදය, අරාජිකත්වය හා ඉන් පසු....?

ලංකාවේ ධනපති ක්‍රමය එහි ඉතිහාසයේ විශාලතම අර්බුදයට මුහුණදී සිටී. රටේ සියලු ජන කොටස් පීඩාවට පත්කරන දැවැන්ත මූල්‍ය හා ආර්ථික අර්බුදයක්ද ඒ හා බැඳුණු සමාජ අර්බුදයක්ද ඉන් උපදින දේශපාලන අර්බුදයන් රැසක්ද වර්ධනය වෙමින් පවතී. මේ සියල්ලේ තර්කානුකූල ප්‍රතිඵලය ලෙස රට තුළ පාලනයේ අරාජිකත්වයක්ද මතුව තිබේ. රට තුළ ආණ්ඩුවක් තිබේ. එහෙත් පාලනයක් නොපවතී. රටේ ජන ජීවිතය හා බැඳුණු බොහෝ දේ පුරුද්දේ බලයට අනුව සිදුවෙනවා මිස ජන ජීවිතයේ ගැටලු විසඳීමට හා රට පාලනය කිරීමට අදාල ආයතන කටයුතු කරන බවක් පෙනෙන්නේ නැත. ආණ්ඩුවේ සියලු දෙනා කරන්නේ රට 'පාලනය කිරීම' නොව මහජන මුදල් නාස්තිකිරීම, ගසාකෑම, හොරකම් කිරීම හා රට අවුල් කිරීමය. ඒ ලංකාවේ ධනවාදය පත්වී ඇති තත්වයයි.

ලංකාවේ ජනාධිපතිවරයාගේ වත්මන් කාර්යය වී ඇත්තේ, නැවත නැවතත් බලය තහවුරු කරගැනීමට කටයුතු කිරීමත් එම බලය තම පෞද්ගලික සුඛ විහරණය සඳහා යොදාගනිමින් මහජන මුදල් නාස්තිකරමින් සිහසුනේ වැජඹීමත්ය. රට තුළ ජනතාවගේ ප්‍රශ්න ඔහුට අදාල නැත. 2011 වසරේදී ශ්‍රී ලන්කන් එයාර් සමාගම රු. කෝටි 1900ක් පාඩු ලබා තිබියදීත් පසුගියදා කියුබාවේ හා බ්‍රසීලයේ සංචාරයකට ජනාධිපතිවරයා තම හිතවතුන් සමඟ ගියේ වැඩිම ආසන සහිත ශ්‍රී ලන්කන් එයාර් ගුවන් යානයක් තමන්ටම දින කිහිපයකට වෙන් කරගනිමිනි.

මේ වන විට උතුරු මැද හා ඒ ආශ්‍රිත ප්‍රදේශවල ගොවි ජනයා විශාල ජල හිඟයකට මුහුණපා තම වගාව විනාශවනු දැක දැක සුසුම් ලමින් සිටී. මෙම ජල හිඟය නියඟය නිසා ඇතිවූවක් නොවේ. පසුගිය අප්‍රේල්වල මහවැලි ජලාශය වාන් දමා දොරටු විවෘත කිරීමටද සිදුවිය. දැන් ජලය නැත. ඒ ආණ්ඩුව සංචාරක ව්‍යාපාරයේ මුවාවෙන් වැව් පිටිවල හෝටල් හැදීම, විවිධ ඉදිකිරීම්, වැව් පිළිසකර නොකිරීම නිසා වාරි පද්ධතිය විනාශ කිරීමත් වෙනත් කටයුතු සඳහා ජලය නාස්තිකිරීමත් නිසාය. එහෙත් අවසානයේ වාරිමාර්ග ඇමති අර්බුදයේ වගකීම ''කියනදේ අහන් නැතිව 100%ක් කුඹුරු වගා කළ ගොවියන්'' මත පටවා ඇඟ බේරාගනී. කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ දැන් ආණ්ඩුවේ පාලනයක් නැත. ලංකාවේ කෘෂිකර්මාන්තය පාලනය වන්නේ බහුජාතික සමාගම් කිහිපයක වුවමනාව මතය.

අධ්‍යාපනය මෙම අරාජිකකත්වයේ හොඳම නිදසුනය. විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පත්‍ර වැරද්දීමේ සිට දැන් Z සූත්‍රය වැරදි ලෙස ගණනය කොට සිසුන් දුෂ්කරතාවයට පත්කිරීම දක්වාම එය අරාජික වී තිබේ. අධ්‍යාපනය භාර ඇමති දෙබෑයෝ නිදහස් අධ්‍යාපනය අනුභව කරමින් සිටිති. "දෙවියන් පය නොගසන තැන මෝඩයෝ පිනුම් ගසති"යන කියමන සනාථ කරමින් එස්.බී. හා බන්ධුල ඇමති ජෝඩුව දරුවන්ගේ අධ්‍යාපනය සමඟ ක්‍රීඩා කරමින් සිටී.

රටේ නීතිය හා ප්‍රජාතන්ත්‍රවාදය වල්වැදී තිබේ. නීතිය රකින ආයතන අපරාධකරුවන් රැකීමටත් ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කිරීමටත් යොදවමින් තිබේ. කටුවන ඝාතනය එක් උදාහරණයක් පමණි. රටේ සෞඛ්‍ය සේවාව, ගමනාගමනය, පරිපාලනය ආදී සෑම ක්ෂේත්‍රයකම අරාජිකත්වය වර්ධනය වෙමින් තිබේ. රථවාහන අනතුරුවලින් සිදුවන මරණ ඉහළ යාම, අපරාධ, ඝාතන, හොරකම් ඉහළ යාම දිනපතා සිදුවේ. ඒවා වැළැක්වීමට ගන්නා පියවරක් නැත. වගකීමට, වගවීමට කිසිවකු නැත. රට අයාලේ ගමන්කරමින් තිබේ.

එක් එක් ආයතනවලට, අමාත්‍යංශවලට පැලැස්තර දැමීමෙන් විසඳිය නොහැකි මට්ටමට දැන් මෙම අර්බුදයට උග්‍රවී තිබේ. මේ ප්‍රකාශයට පත්වන්නේ ඇමතිවරුන්ගේ හා නිලධාරීන්ගේ පෞද්ගලික අසමත්කමේ ප්‍රකාශනයක් පමණක් නොව සමස්ත ක්‍රමයක් ලෙස ධනවාදය පත්ව තිබෙන තත්වයයි. මෙම තත්වයට ධනවාදය තුළ විසඳුම් නැත. සමස්ත ධනපති දේහයම කුණුවී තිබෙන විට එක් එක් තුවාලවලට බෙහෙත් පැලැස්තර දැමීමට සිතන්නේ නම් එය මායාවක් වනු ඇත.

මෙම තත්වය ඉදිරියේදී වර්ධනය වනු ඇත්තේ කුමන දිශාවටද? ධනවාදයේ අර්බුදය, අරාජිකත්වයකට මග කපා ඇති අතර මෙම අරාජිකත්වය මග කපනු ඇත්තේ ඒකාධිපතිත්වයකටය, ප්‍රජාතන්ත්‍රවාදය මරා දැමූ ධනපති අත්තනෝමතික පාලනයකටය. දැනටමත් එම තත්වය මතුව තිබෙන අතර එය සම්පූර්ණ ඒකාධිපතිත්වයක් අත්තනෝමතිකත්වයක් හරහා අර්ධ ෆැසිස්ට් පන්නයේ පාලනයක් දක්වා වුව වර්ධනය විය හැක. ඒ ධනවාදය පවත්වාගෙන යාමේ පැත්තෙනි.

එසේම මෙම අර්බුදය හා අරාජිකත්වය ධනවාදය පැරදවීම සඳහා අවශ්‍ය විෂය මූලික තත්වයද නිර්මාණය කරමින් තිබේ. ඒ අනුව මෙම අරාජිකත්වය ධනවාදය පරදා ගොඩ නඟන නව සමාජයක් සඳහා, සමාජ පරිවර්තනයක් සඳහාද මග විවර කරනු ඇත. එබැවින් ලංකාවේ සියලු ප්‍රගතිශීලී, දේශප්‍රේමී, ප්‍රජාතන්ත්‍රවාදී හා වමේ බලවේගයන්ගේ වගකීම වන්නේ වත්මන් අර්බුදය ධනේශ්වර අත්තනෝමතික පාලනයකින් කෙළවරවීමට යාමට ඉඩ නොදී එය සමාජ පරිවර්තනයක් සඳහා අවස්ථාව බවට පත්කර ගැනීමය. ධනවාදයේ අර්බුදය ඉතාම බරපතළ වූ විට සමාජයක් තුළ නිර්මාණය විය හැක්කේ එක්කෝ ධනපති පංතියේ ආඥාදායකත්වය බවත් නැත්නම් නිර්ධන පංතියේ විප්ලවකාරී පාලනයක් බවත් වරක් ලෙනින් සඳහන්කර තිබුණි.

එම සත්‍යයට අනුව අප අදිටන් කරගත යුත්තේත් අපි ක්‍රියාත්මක විය යුත්තේත් වත්මන් අර්බුදය ධනපති ආඥාදායකත්වයක් දක්වා වර්ධනය වීමට ඉඩ නොතබා එය සමාජවාදී සමාජ පරිවර්තනයක් දිශාවට යොදාගැනීම සඳහාය. ඒ හැර අන් මඟක් ජනතාව ඉදිරියේ නැත.

## කටුවන ඝාතනයට එරෙහි ජාත්‍යන්තර උද්ඝෝෂණ










## කාන්තා හා ළමා අපරාධ වැඩිවෙන්නේ දේශපාලන මැදිහත්වීම් නිසයි

**සමාජවාදී කාන්තා සංගමය**




දේශපාලන මැදිහත්වීම් සහ පොලීසිය නිසි පරිදි නීතිය ක්‍රියාත්මක නොකිරීම නිසා කාන්තාවන් සහ ළමුන් බරපතළ අපරාධවලට ගොදුරු වීම ඉහළ ගොස් ඇති බව සමාජවාදී කාන්තා සංගමය පෙන්වා දෙයි. එම සංගමය වැඩිදුරටත් සඳහන් කරන්නේ සෑම විනාඩි 90කට වරක්ම රටේ කොතැනක හෝ ස්ත්‍රී දූෂණයක් සිදුකෙරෙන බවය. විවෘත ආර්ථිකය හඳුන්වා දීමත් සමඟ මානව සබඳතා බිඳ දමා මුදල් මත සියල්ල තීරණය කරන සමාජයක් නිර්මාණය වීම නිසා මෙම තත්වය උද්ගත වී ඇති බවද එම සංගමය පෙන්වා දෙයි.

මෙම අදහස් ප්‍රකාශ වූයේ, පසුගිය 05වැනි දින සමාජවාදී කාන්තා සංගමයේ ජාතික සංවිධායිකා සමන්මලී ගුණසිංහ සහෝදරිය විසින් ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද විශේෂ මාධ්‍ය හමුවකදීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇය ළමුන් හා කාන්තාවන් පොදුවේ මුහුණ දී සිටින බරපතළ බේදවාචකය පිළිබඳව සමාජයේ අවධානය යොමු කිරීමට සමාජවාදී කාන්තා සංගමය අපේක්ෂා කරන බව පැවසුවාය.

## සමාජවාදී ශිෂ්‍ය සංගමයේ 4වැනි මහ සමුළුව ඉහළින්




සමාජවාදී ශිෂ්‍ය සංගමයේ 4වැනි ජාතික මහ සමුළුව 2012 ජූනි 11 වන දින සවස 3.00ට කොළඹ නව නගර ශාලාවේදී පැවැත්විණි.





කොළඹ 10, පංචිකාවත්ත පාරේ අංක 198/19 හි පදිංචි එම්. ටිල්වින් සිල්වා වන මා විසින් අංක 70 මිෂන් පාර, පිටකෝට්ටේ පිහිටි ආර්. සී. ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්හි මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.